එමගින් එය ඉක්මණින් විසඳාගෙන එන විට නීති ප්‍රශ්නයක් මතු වුණා. එම කාර්‍යය කරන්ට කම්කරු ආරාවුල් විසඳීමෙ මණ්ඩලවලට ඇත්ත වශයෙන්ම නීත්‍යනුකූල බලතල තිබෙනවද කියන කාරණය කම්කරු උසාවියෙදි තර්ක කර කම්කරු උසාවියෙ තීරණයට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියට අභියාචනයක් අරගෙන, එතැනිනුත් සෑහීමට පත් නොවී අපට එංගලන්තයෙ රාජාධිකරණයට යන්ටත් සිදු වුණා. භාග්‍යයකට හෝ වේවා අභාග්‍යයකට හෝ වේවා, රාජාධිකරණය මගින් දෙන ලද තීන්දුව මේ කම්කරුවන්ගේ නොවිසඳී ඇති නඩුවලට හොඳක්ද නරකක්ද යන්න තවම අපට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කියන්ට බැරි තත්ත්වයක් උදා වී තිබෙනව. ඒ ගැන මේ දක්වා රජයෙන් ප්‍රකාශයක් කර නැහැ. මේ අර්බුදය අවසානයේදී තීරණයක් කරන්ට සිදු වුණේ රාජාධිකරණයටයි. දැනට සති කීපයකට පමණ කලින් රාජාධිකරණය මඟින් තීන්දුවක් දුන්න, කම්කරු ආරාවුල් විසඳීමේ අධිකරණ මණ්ඩලවලට නිත්‍යානුකූල බලතල තිබෙන බවට.

සමහර විට මේ පනත් කෙටුම්පතින් යෝජනා කර ඇති, සමාගම් විසුරුවා හැරීමේ මණ්ඩල පිළිබඳවත් ඔය විධියෙ ප්‍රශ්නයක් මතු වන්ට පුළුවන්. එම නිසා දිස්ත්‍රික් උසාවියට ගිහින් ඉන් පසුව ශ්‍රෙෂ්ඨාධිකරණයටත් ගිහින් ඊටත් පසුව රාජාධිකරණයට ගිහින් ප්‍රශ්නය විසඳන තෙක් අමාරුවේ වැටුණ මිනිසුන්ට උඩ බිම බල බලා ඉන්ට ඉඩ නොදී, යටත් පිරිසෙයින් මේ පනත් කෙටුම්පතේ "පිහිටුවන්ට යන සමාගම් විසුරුවා හැරීමේ මණ්ඩලවලට නියම නිත්‍යානුකූල බලය තිබෙන බවත්, ඊට විරුද්ධව අභියාචනා ගැනීමට බැරි බවත්" සඳහන් කරනවා නම් හොඳයි. ඒ ආකාරයට මේ මණ්ඩලවල තීරණ ස්ථිර වශයෙන්ම අවසාන තීරණ බව හඟවන කිසියම් නීති මාලාවක් පන වනවා නම් හොඳයි. එහෙම නැත්නම් දවසකට රුපියලක් දෙකක් නැත්නම් මාසයකට රුපියල් 125 ක් හම්බ කරන කම්කරුවකුට රක්ෂාව අහිමි වී, කම්කරු අධිකරණයේ සිට රාජාධිකරණය දක්වා නඩු අසා අවුරුදු ගණනාවක් බලා ඉන්ට සිදු වුණා වාගේ, තමන්ගෙ සල්ලි නැති වී ඉන්ෂුවරන්ස් කොම්පැණිය විසුරුවා හැර ඒ පිළිබඳව විසඳීමක් එන තුරු බලා සිටින්නට සිදු වුණොත් අර අමාරුවේ වැටුණ මිනිහට සහනයක් ලැබෙන්නෙ නැහැ. ඒ නිසා නීති සංශෝධනය කරන මේ වෙලාවෙ අර මණ්ඩලවල තීරණවලට විරුද්ධව අභියාචනා ගැනීමට ඉන්ෂුවරන්ස් කොම්පැණිවලට බැරිය එහෙම නැත්නම් සීමා කරනවාය කියා විශේෂ නීතියක් ඇතුළත් කරනවා නම්, දැනට අමාරුවේ වැටී සිටින මිනිසුන්ට එක්තරා යහපතක් සැලසෙනව.

තවත් කරුණක් සඳහන් කරන්ට තිබෙනව. සංශෝධන පනත් කෙටුම්පතේ 7 වන ඡේදයෙන් කියා තිබෙනව, සමාගම්වල සිදු වෙනවාය කියන දූෂණ ක්‍රියාවන් ගැන දැනගන්ට ලැබුණාම ඒවාට විරුද්ධව ක්‍රියා කළ යුත්තෙ කවුද කියන ප්‍රශ්නය ගැන. එහි පුද්ගලයන් වර්ග කීපයක් සඳහන් වෙනව.—Administrator appointed under Section 53 of the Principal Act.—මුල් පනතේ 53 වන ඡේදය යටතේ පත් කරනු ලැබූ අද්මිනිස්ත්‍රාත්—Liquidator—සමාගම විසුරුවා හරින්ට පත් කරන පුද්ගලයා. ඒත් නැත්නම් සමාගමෙන් රක්‍ෂණ සහතිකයක් ලබා ගත් පුද්ගලයා. මම මගේ කථාව මුලදී සඳහන් කළා, පෞද්ගලික ජීවිත රක්‍ෂණ සමාගමකට මුදල් බැඳ රක්‍ෂණ සහතිකයක් ලබා ගන්ට ගිහින් අමාරුවේ වැටී සිටින මිනිසුන් ගැන. එහෙම අමාරුවේ වැටී සිටින පුද්ගලයන්ට, රට සූරා ගෙන කෑ පෞද්ගලික සමාගම් සමග නඩු කියන්ට බලය දීම වැදගැම්මකට නැති දෙයක්. බොහොම අමාරුවෙන් මාසයකට රුපියල් 6.50 ක් හෝ 8 ක් හෝ බැගින්, අවුරුද්දකට රුපියල් 75 ක් සියයක් පමණ ගෙවා අවුරුදු 20 කින් රුපියල් දෙතුන් දහසක් ලබාගන්න බලාපොරොත්තුව සිටින අහිංසක දුප්පත් මනුෂ්‍යයකුට පහසුවෙන් නීති උපදෙස් ලබාගැනීමට පුළුවන් පෞද්ගලික රක්‍ෂණ සමාගමක් සමග දිස්ත්‍රික් උසාවියෙ නඩු කියා ගැනීමට පුළුවන්කමක් නැහැ. ඒක හරියට නැගිටින්නවත් බැරි මනුෂ්‍යයකුට පැදගෙන යන්න බයිසිකලයක් දුන්න වාගෙයි. නැගිටින්නවත් බැරි, අතපය කොර වෙච්ච මනුෂ්‍යයට බයිසිකලයක් දුන්නාම පැදගෙන යන්නෙ කොහොමද, එයින් ප්‍රයෝජනයක් ගන්නෙ කොහොමද? ඒ වාගේ මෙවැනි බලතල දීමෙන් ප්‍රයෝජනයක් වෙන්නෙ නැහැ. බොහොම අමාරුවෙන් නැගී සිටින ඒ මනුෂ්‍යයට හැරම්ටියක් දීමයි රජයෙන් කළ යුතුව තිබෙන්නෙ. පෞද්ගලික සමාගම්වල ඇති දූෂණ නිසා අමාරුවෙ වැටුණු මනුෂ්‍යයාට සිදුවුණු අලාභය නැති වුණු දේපල ලබා ගන්න නඩු කියන්න බලය දෙනව. සාමාන්‍ය දුප්පත් මනුෂ්‍යයෙක් කොහොමද බලසම්පන්න ප්‍රෝඩාකාර සමාගමක් සමග නඩු කියා දිනන්නෙ? එය කවදාවත් කරන්න බැරි දෙයක්. එම නිසා පෞද්ගලික සමාගම්වල ක්‍රියා කලාපය නිසා අමාරුවේ වැටී සිටින අහිංසක මිනිසුන්ට ප්‍රයෝජනවත් වන අන්දමට මෙම ඡේදයෙහි යම්කිසි සංශෝධනයක් කරනවා නම් වඩා හොඳ බවයි මම සිතන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 2.44

**එම්. සිවසිතම්පරම් මයා. (උඩුප්පිඩ්ඩි)**
*(திரு. எம். சிவசிதம்பரம்—உடுப்பிட்டி)*
(Mr. M. Sivasithamparam—Uduppiddi)

Mr. Speaker, it is in the interests of both sides of the House that we should have fairly comprehensive legislation to safeguard the interests of policy holders in insurance companies which are no longer functioning.

I think the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) told us yesterday of a number of insurance companies, both Ceylonese and Indian, which have not been keeping to the promises they made when they were operating as insurance companies.

I know of an instance where even a reputed insurance company like the Ceylon Insurance Company did not keep their obligations to a policy holder after they had ceased to do business in life and other types of insurance.

I brought to the notice of the hon. Parliamentary Secretary a case where the Indian Insurance Corporation has, since the devaluation of the Indian rupee, chosen to pay its policy holders in Ceylon only two-thirds the value of their policies, because they have taken up the position that, as they are paying in Indian rupees, the value of the policy translated into Ceylon rupees is only two-thirds.

That position is completely wrong because the contract was entered into in Ceylon and the agreement was that payment was to be made in Ceylon rupees.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

And the premia would have been paid in Ceylon.

**එම්. සිවසිතම්පරම් මයා.**
*(திரு. எம். சிவசிதம்பரம்)*
(Mr. M. Sivasithamparam)

The premia would have been paid in Ceylon in Ceylon money.

All these are matters which need the attention of the Insurance Corporation and, therefore, I think all of us are agreed that we should have very comprehensive legislation.

I think the hon. Member for Yatiyantota appreciates the point why it is necessary to amend Section 79 of the Act giving the power for us to go to court in view of the recent judgment dealing with the question of Ministers and others arrogating to themselves judicial power. The hon. Member for Yatiyantota was a little perturbed over the inclusion of policy holders among the category of people who could go to court to have this remedy.

Sir, as long as the amendment keeps to the same pattern, that is, as long as the responsibility of the Controller or the Liquidator who has been appointed to see that all the monies are recovered and the policy holders paid, is provided for, I ask the hon. Member for Yatiyantota, what is the harm in also giving the right to the policy holder, if all these persons should fail, to avail himself of the remedy that has been given here ?

I can understand the hon. Member's point of view if the pattern of the entire Act was changed and the burden of collecting the money was taken away from the Controller, or the obligation to act was taken away from the Controller. But all that the amendment now seeks to do is, besides all the others, besides retaining the obligation of the Controller to Act, to give the right also to the policy holder to avail himself of the remedy to go to court to have the money recovered.

The House will appreciate that there is in this amendment a departure from the normal method of recovering money in a court of law. Here is a provision by which, by summary procedure—that is like suing on a promissory note or a cheque—a very short method of recovering money has been included in the Act.

Therefore I ask, what is the harm in giving the right to the policy

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

holder also if everybody else fails, to avail himself of the right that is given here to the Controller and to the Liquidator to recover the money? I do not see the danger or the harm in including the policy holder also among the people who have got the right to recover this money.

Before I finish I must refer to the, if I may say so, thoroughly unnecessary and unwanted remarks made by the hon. Member for Kolonnawa (Mr. Ilangaratne) who sought to speak about the Attorney-General.

I could have understood it if the hon. Member for Kolonnawa had any case against the Attorney-General and he had moved a Motion on the Floor of this House. That would have been a different matter. But in the course of a Debate on the Control of Insurance (Amendment) Bill to drag in the Attorney-General because the Attorney-General has chosen to give certain advice to the Government, which he is entitled to do and which the Government can accept or reject, is something of which this House should show its dislike.

Once the Government agrees to accept the advice of the Attorney-General it is a Government matter, Government policy, and not a matter for the Attorney-General alone. I was particularly unhappy that in the course of his remarks the hon. Member should have referred to a certain type of meat. I know he chose to do this for a particular reason when he referred to the Attorney-General in his speech.

I think it was a sad lapse on the part of the hon. Member for Kolonnawa who is a very senior Member of this House although he has come here on this occasion only recently. If a substantive Motion is brought then we would be prepared to meet whatever arguments the hon. Member for Kolonnawa may wish to raise. But in the course of this Debate on the Control of Insurance (Amendment) Bill to make disparaging remarks about the Attorney-General is something that we all should abhor. I hope the House will treat such remarks with the contempt they undoubtedly deserve.

The hon. Member for Yatiyantota has, I think, now almost accepted the principle of this Bill and the necessity for this Bill except for one or two small matters that he thinks need amendment. I think there is no harm in including the policy-holders among a host of other people who can go to courts to have grievances redressed.

I would earnestly request the hon. Parliamentary Secretary to look into the question of the Indian Insurance Corporation seeking to pay policy-holders in Ceylon only two-thirds of the value of their policies. It would be a very sad thing if the policy-holders were to lose nearly one-third of their money. Legally I think that position would not be tenable. This is a matter that the hon. Parliamentary Secretary should look into.

අ. භා. 2.51

**ආර්. ජේ. ජී. ද මැල් මයා.** (දෙව්නුවර)
*(திரு. ஆர். ஜே. ஜீ. டி மெல்—தெவிநுவர)*
(Mr. R. J. G. de Mel—Devinuwara)

ගරු කථානායකතුමනි, ලංකාවෙ පෞද්ගලික රක්‍ෂණ සමාගම් ජනසතු කරන්න පෙර මේ රටේ ලාංකිකයින්ගෙ සමාගම් කීපයකුත් තිබුණා, ඉන්දියානු ජාතිකයින්ගේ කොම්පැනි කීපයකුත් තිබුණා. ඒ වාගේම සුද්දන්ගෙ එහෙම නැතිනම් යුරෝපීයයන්ගෙ කොම්පැනි කීපයකුත් තිබුණා. සුද්දන් කෙරෙහි අපේ වැඩි පැහැදීමක් නැතත් ඔවුන්ගේ කොම්පැනි සාමාන්‍ය වශයෙන් හොඳින් පාලනය කෙරුණා. ලාංකික කොම්පැනි එහෙම නැතිනම් සිංහල කොම්පැනි 32 ක් පමණ මේ රටේ තිබුණා. ඒ වාගේම ඉන්දියානු ජාතිකයින්ගේ කොම්පැනි 10 ක් තිබුණා. මෙම රක්‍ෂණ සමාගම් ජනසතු කරන්න පෙර "ඇක්චුවේරියල් සර්වේ" නැතිනම් "ඇක්චුවේරියල්" පරීක්‍ෂණයක් මේ රටේ තිබුණා. එම පරීක්‍ෂණයෙන් පෙනී ගියා, ලාංකිකයින්ගේ කොම්පැනිවලින් හතරෙන් තුනක් පමණයි—බොහොම අතලොස්සක් පමණයි—පාලන කටයුතු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද මැල් මයා.]
සාධාරණ පිළිවෙළට ගෙන ගියේ කියා. අනිකුත් රක්ෂණ සමාගම්වල පාලන කට යුතු ගෙන ගියේ කොයි ආකාරයෙන් ද කියා අපි දන්නවා. හතු පිපෙන්නා වාගේ පෞද්ගලික රක්ෂණ සමාගම් ඇතිවුණා. ඒ වාගේම දවසට දෙකට හතු මැරී යන්නා වාගේ මෙම පෞද්ගලික සමාගම් ඇති වී නැති වී ගියා. අපි දන්නවා, මේ කොම්පැනි වල අධ්‍යක්ෂවරුන් නොයෙකුත් අන්දමේ දූෂණ ව්‍යාපාර ගෙන යමින් අයුතු අන්ද මින් මුදල් රැස් කර ගත් බව. මම දන්නවා, සමහර කොම්පැනි නොයෙකුත් විධියෙ ජාවාරම් ගෙන ගිය බව. සමහර කොම්පැනි රැකී රක්ෂාවලට බඳවා ගැනීමේ පොරොන්දුව පිට ඇප වශයෙන් රුපියල් දහස් ගණනින් තරුණයින්ගෙන් වංචා කර ගත් අවස්ථා ගැන අපි දන්නවා. සම හර කොම්පැනිවල අධ්‍යක්ෂවරුන් ජීවිත රක්ෂණ වාර මුදල් තමන්ගෙ දූවරුන්ට දෑවැද්ද වශයෙන් දුන් අවස්ථා ගැනත් අපි දන්නවා. සමහර අධ්‍යක්ෂවරු රක් ෂණ අරමුදල්වලින් මාලිගා වැනි විශාල ගොඩනැගිලි, පෞද්ගලික නිවාස, බංගලා වල් තැනුව. සමහර අධ්‍යක්ෂවරු එම මුදල්වලින් වතුපිටි මිලදී ගත්ත. ඔවැනි දේවල් අපේ ලාංකික රක්ෂණ සමාගම්වල එදා සිදු වුනා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)*
(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

කොයි කොම්පැනිවලද?

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

සමහර කොම්පැනිවල. මේ මැති සබය ඇතුළේ ඒ අයගේ නම් කියන්න මම කැමති නැහැ. ඒ මන්ද? උන්නැහෙලා මෙහි නැති නිසා. හැබැයි, මම ගරු වෙළඳ ඇමතිතුමාට මේ කරුණු විස්තර වශයෙන් පෞද්ගලිකව ඉදිරිපත් කරන්න ලැස්තියි. මේ මැති සබය ඇතුළේ පෞද්ගලික පහර වල් ගැහීම හරිය කියා මම හිතන්නෙ නැහැ. මම ප්‍රතිපත්තියක් හැටියට මගේ පාර්ලිමේන්තු ජීවිතයෙදි පෞද්ගලික පහර වල් ගහන්න කැමති නැහැ.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

මම ඒ ගැන එකඟ වෙනවා.

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

ආණ්ඩුවෙ නිලධාරියකුට විරුද්ධව මම කවදාවත් පහරක් ගහන්න කැමති නැහැ. ඇයි? ඒ අයට ඒවට උත්තර දෙන්න අවස්ථාවක් නැති නිසා. මම ආණ්ඩුවේ නිලධාරියකු වශයෙන් සේවය කරන විට මට පිට හරහට පහරවල් ගැහුවා. මට ඒවට උත්තර දෙන්න අවස්ථාවක් ලැබුණෙ නැහැ. ආණ්ඩුවේ නිලධාරියකු වශයෙන් සිටි මට ඒ අන්දමට පෞද්ගලි කව පහර ගැසූ එක වැරදියි. ගරු ඇමති තුමාට පහරවල් ගැහුවා නම් ඒකට කමක් නැහැ. එතුමාට පිළිතුරු දෙන්න පුළුවන්.

සමහර කොම්පැනිවල එක්සත් ජාතික පක්ෂයේ පතාක යෝධයෝ ඉන්නවා. මෙ තැනදි ඒ අයගේ නම් කීම හරි නැහැ. ප්‍රති පත්තියක් හැටියට එසේ කිරීම හරිය කියා මම කල්පනා කරන්නෙ නැහැ. අවසථාවක් දුන්නොත් කාර්යාලයට ඇවිත් වෙළඳ ඇමතිතුමාට හෝ එතුමාගේ පාර්ලි මේන්තු ලේකම්තුමාට ඒ විස්තර සම්පූර්ණයෙන් දෙන්න මම ලැස්තියි. දැන් මේ කොම්පැණි විශාල සංඛ්‍යාවක් අහෝසි වෙලා. ඒවායේ අධ්‍යක්ෂවරුන් හොයා ගන්න නැහැ; සාමාන්‍යාධිකාරි වරුන්, කළමනාකාරවරුන් සොයා ගන්න නැහැ. අපේ රක්ෂණ පාලකතුමා ඉතා මත්ම අවංක දක්ෂ ආණ්ඩුවේ නිලධාරි යෙක්. සමහර කොම්පැනිවල අධ්‍යක්ෂ මණ්ඩලවල සිටි අය අද මේ රටේවත් ඉන්නවද කියා සොයාගන්නට උන්නැ හෙට බොහොම අමාරු වෙයි. ඒ අයගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලිපිනයන් කොහේද කියා දැන ගන්නවත් එතුමාට අමාරු වෙයි. ඒකත් අතුරුදහන් වෙලා තියෙන බව මම දන්නව.

විශේෂයෙන්ම එක ලාංකික රක්ෂණ කොම්පැනියක සිදු වූ සිද්ධීන් කීපයක් ගැන සඳහන් කරන්න මම කැමතියි. මේ සිද්ධීන් පිළිබඳව නම් සහිතව පැහැදිලි විස්තරයක් ගරු වෙළඳ ඇමතිතුමාට හෝ එතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාට හෝ දෙන්න මම කැමතියි. දැන් ඒ සිද්ධීන් පිළිබඳව ස්වල්ප විස්තරයක් පමණයි, මම දෙන්න බලාපොරොත්තු වන්නෙ. එක්තරා ලාංකික රක්ෂණ කොම්පැනියක කළමනාකාර අධ්‍යක්ෂතුමා, ඒ රක්ෂණ කොම්පැනියේ කළමනාකර අධ්‍යක්ෂ තනතුර දරණ අතරම තවත් කාර්මික කොම්පැනියක කළමනාකාර අධ්‍යක්ෂ හැයටිටත් සේවය කළා. ඒ කාර්මික කොම්පැනියේ fපයර් ඉන්ෂුවරන්ස් ප්‍රිමියම් එක අවුරුද්දට රුපියල් එක ලක්ෂ පනස් දාහයි. ඒකට සියයට 33 ක කොමිස් එකක් දුන්නා. ඒ කොමිස් එක හැටියට රුපියල් 50,000 ක් ලැබුනා. අවුරුද්දකට ලැබුණු ඒ රුපියල් 50,000 කොමිස් මුදල, ඩිස්කවුන්ට් එකක් හැටියට ඒ කාර්මික කොම්පැනියට දීමයි, කළ යුතුව තිබුනේ. නමුත් ඒක කළේ නැහැ. ඒ කළමනාකාර අධ්‍යක්ෂතුමා එතුමාගේ බිරිඳගේත්, දූදරුවන් තිදෙනාගේත් නමින් පෞද්ගලික කොම්පැනියක් ඇති කර අවුරුදුපතා කොමිස් මුදල වශයෙන් රුපියල් 50,000 ඒ පෞද්ගලික කොම්පැනියට වෙන් කළා. මගේ කල්පනාවෙ හැටියට මේක විශාල වංචාවක්. ඒ නිසා මේ කොම්පැනියේ කටයුතු ගැන ටිකක් සොයා බලන ලෙස මම රක්ෂණ පාලකතුමාගෙන් ඉල්ලා සිටිනව. මේ පිළිබඳව විස්තරත් මුම කාර්යාලයට ඇවිත් දෙන්නම්.

ඒ කොම්පැනියෙම තවත් විශාල ජාවාරමක් සිදු වුනා. කළමනාකාර අධ්‍යක්ෂතුමා එක දවසක් කාර් එකේ යන විට රුපියල් 90,000 ක ආභරණ ඒ කාර් එකේ දාගෙන ගොස් එක්තරා තැනකදී—කුරුවිටදී—නිදා ගන්න ගියාය, එසේ නිදාගෙන සිටිද්දී ඒ ආභරණ ටික නැති වුනාය කියා උන් නැහෙගෙම කොම්පැනියට රුපියල් 90,000 ක ක්ලේම් එකක් දැම්මා. ඒ රුපියල් 90,000 හේ ක්ලේම් එක ගෙව්වේ නැහැ කියා අපට ආරංචියි. ඒ කළමනාකාර අධ්‍යක්ෂතුමාටත් ඉල්ලා අස් වන්න සිදු වුනා. ඒක විශාල ලාංකික කොම්පැනියක්. කොටස් මුදල් පමණක් මහජනයාගෙන් රුපියල් විසි ලක්ෂයක් පමණ එකතු කර තිබුනා. සංරක්ෂණ පාලකතුමා ඒ කොම්පැනිය ගැන පරීක්ෂා කර බලන විට විශේෂයෙන්ම "ඇක්සිඩන්ට් ක්ලේම්ස්" ගැනත් පරීක්ෂා කරන්නැයි ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. ජනසතු කරන්නට පෙර වූ අවුරුද්දේ කෝටි ගණන් "කාර් ඇක්සිඩන්ට් ක්ලේම්ස්" ඇවිත් තිබෙනවා. ඒ වගේම ඒ කොම්පැනියෙන් කෝටි ගණන් මුදල් ගෙවා තිබෙනවා. ඒ අවුරුද්දේ ජයටම හොර ජාවාරම් කෙරී ඇති බව කියන්නට පුළුවනි. "බෝගස් ඇක්සිඩන්ට් ක්ලේම්ස්" බොහෝ ගණනක් ඉදිරිපත් කොට ඒ කොම්පැනියෙන් මුදල් වංචා කරගෙන තිබෙනවා. එපමණක්ද? තේ fපැක්ටරි පුළුස්සා දමා "fපයර් ඉන්ෂුවරන්ස් ක්ලේම්ස්" ඉදිරිපත් කිරීම මේ රටේ සිරිතයි. නොයෙකුත් තේ fපැක්ටරි පුළුස්සා ක්ලේම්ස් ඉදිරිපත් කළ බව මා දන්නවා. ඒවා පිළිබඳ විස්තර දෙන්නටත් මා කැමතියි. විශේෂයෙන්ම ඉන්ෂුවරන්ස් කොම්පැනිවල ජාවාරම් යන්නේ "රි-ඉන්ෂුවරන්ස්" මඟිනුයි. ඒ කොම්පැනි එංගලන්තයේ "රෝයල් එක්ස්චේන්ජ්" කොම්පැනියත් සමග රි—ඉන්ෂුවරන්ස් ජාවාරම් ගෙන ගිය බව අපට ආරංචි වී තිබෙනවා. ඒ රි—ඉන්ෂුවරන්ස් ජාවාරම් මගින් සමහරුන් ලන්ඩන් නගරයේ රන් පවුම්වලින් විදේශ විනිමය එකතු කර ගත් බවත් ආරංචියි. ප්‍රතිරක්ෂණ ගිවිසුම්—"Re-insurance Treaties"—ගැන විශේෂයෙන් පරීක්ෂා කරන ලෙස සංරක්ෂණ පාලකතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මේ සම්බන්ධව මේ අවස්ථාවේදී තවත් වචනයක් කියන්නට කැමතියි. දැන් රක්ෂණ ව්‍යාපාරය ජනසතු වෙලා. නමුත් ජනසතු වූ පමණින් එහි ඇති දූෂණ නැති වන්නේ නැහැ. පාලනය වෙනස් වූ පමණින් දූෂණ නැති වන්නේ නැහැ. ජීවිත රක්ෂණ සමාගම්වල—Life Insurance Company—ප්‍රතිරක්ෂණ සම්බන්ධව නොයෙකුත් දූෂණ තිබෙන බව ආරංචියි. "ලයිfප් ඉන්ෂුවරන්ස්" කොම්පැනිවල ප්‍රතිරක්ෂණ ගිවිසුම් ගැන පරීක්ෂා කර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද මැල් මයා.]
බැලීමට විධිවිධාන යොදන ලෙස මා වෙළෙඳ කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ රටේ තිබෙන ලොකුම ජාවාරම විදේශ විනිමය ජාවාරමයි. "රි-ඉන්ෂුවරන්ස්" මාර්ගයෙන් විදේශ විනිමය පිට යවන්න පුළුවනි. ඇතැම් රක්‍ෂණ ආයතන "ඉන්වොයිස්", "අන්ඩර් ඉන්වොයිස්" කරන බව තමුන්නාන්සේ දන්නවා ඇති. එයින් මෙන්ම රි-ඉන්ෂුවරන්ස් එකෙනුත් විදේශ විනිමය ජාවාරම ගෙන යන්න පුළුවනි. ඉතින් ජාතික සංරක්‍ෂණය මණ්ඩලය රි-ඉන්ෂුවරන්ස් ක්‍රමය ගැනත් විශේෂ පරීක්‍ෂණයක් කර එහි දූෂණ තිබෙනවා නම් ඒ දූෂණ නැති කිරීමට ක්‍රියා කරන ලෙස ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

රක්‍ෂණ සංස්ථාවල තවත් ලොකු අඩුපාඩුකම් ඇති වන්නේ investment policy නැත්නම් ධනය යෙදවීමේ ප්‍රතිපත්තිය මතයි. ධනය යෙදවීමේ ප්‍රතිපත්තිය යටතේ හුඟක් "රැකට්ස්" ඇති වන්න පුළුවනි. ඉන්දියාවේ "ලයිෆ් ඉන්ෂුවරන්ස්" කොම්පැණියක ධනය යෙදවීමේ ව්‍යාපාරයෙහි විශාල දූෂණයක් ඇති වූ බව තමුන්නාන්සේ දන්නවා ඇති. "මුන්ද්‍රාස් දූෂණය" යි ඒ. එය නිසා එදා ලෝක් සභාවෙහි සිටි මුදල් ඇමති වරයකු වූ ක්‍රිෂ්ණමචාරි මහත්මයාට ඉල්ලා අස්වන්නට පවා සිදුවුණා. ධනය යෙදවීමේ ප්‍රතිපත්තියෙහි තිබෙන ජාවාරම්වල හැටි එහෙමයි. ලංකාවෙ දැනට ආරම්භ කර තිබෙන සංරක්‍ෂණ මණ්ඩලයෙ ධන යෙදවීමේ ප්‍රතිපත්තිය ගැනත් පරීක්‍ෂණයක් කර එය නියම පිළිවෙලට, සැලැස්මක් අනුව, හොඳ අවංක ප්‍රතිපත්ති උඩ ගෙන යාමට කටයුතු යොදන ලෙස මා ඉතා කරුණාවෙන් ඉල්ලා සිටිනව.

මේ රටේ ජනසතු ව්‍යාපාරවලත් දූෂණ ඇති වී තිබෙන බව අප කවුරුනුත් දන්නව. ජනසතු කිරීමම පමණක් රටක ආර්ථික බාධාවලට එකම ප්‍රතිකාරය නොවන බව, ජනසතු කිරීමේ ප්‍රතිපත්තියට සම්පූර්ණයෙන්ම එකඟවන පක්‍ෂයක් වශයෙන් අප පිළිගන්නව. ඩෙල්බර්ග් සාමි කීවාක් මෙන් බලය වැඩි වුණු විට දූෂණ යත් වැඩි වෙනව. සම්පූර්ණ බලය ඇති වුණු සමහර අවස්ථාවලදී සම්පූර්ණ දූෂණයක් ඇති වෙනව. එම නිසා, විශේෂයෙන් අපේ සංරක්‍ෂණ මණ්ඩලයේ කටයුතු අවංක ප්‍රතිපත්ති අනුව ගෙන යාමට රජය විශේෂ උනන්දුවක් දක්වනව ඇතැයි විශ්වාස කරමින් මගෙ වචන සවල්පය මෙයින් අවසාන කරනව.

අ. භා. 3.05

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු කථානායකතුමනි, සංරක්‍ෂණ මණ්ඩල සංශෝධන පනත පිළිබඳව කලින් කථා කළ ගරු මන්ත්‍රීවරුන් තම අදහස් ප්‍රකාශ කරද්දි, මතක් කළ යුතු වැදගත් කරුණු එකක් දෙකක් මටත් සිහිපත් වුණා. විශේෂයෙන්ම සංරක්‍ෂණ කාර්යාලවල පවතින දූෂණ සම්බන්ධවයි. වරක් මා මේ සම්බන්ධයෙන් ප්‍රශ්න මාලාවක් මේ සභාවට ඉදිරිපත් කළා. මා එයින් අදහස් කෙළේ, සමහර රක්‍ෂණ සංස්ථාවල කළමනාකාරවරුන් ගෙන යන දූෂිත ක්‍රියා මාර්ගය අනාවරණය කිරීමයි. කෙලින්ම රක්‍ෂණ කාර්යාලවලට ඇවිත් රක්‍ෂණවලට බැඳෙන්නට ඒ කටයුතු කරන අයට පුළුවන්කම තිබෙනව. එහෙත්, රක්‍ෂණවලට බැඳෙන අය කෙලින්ම කාර්යාලයට පැමිණීමෙදි රක්‍ෂණ කළමනා කරුවන්ට ඔවුන්ගෙන් යම් යම් ලාභ ලබා ගන්නට බැරි වන නිසා, කොමිස් මුදල් කාර්යාලයටම ලැබෙන නිසා, එය කාර්යාලයට නොදී තමන්ටම ලබා ගැනීමේ අදහස ඇතුව ඒජන්තවරුන්ගෙ නම් යොදා ඒ මාර්ගයෙන් කළමනාකරුවන් මුදල් වංචා කරන බව පෙන්නුම් කිරීමටයි, මා එකී ප්‍රශ්න මාලාව වෙළෙඳ උප ඇමති තුමාගෙන් ඇසුවෙ. ඊට පිළිතුරු දීමට එතුමා දීර්ඝ කාලයක් ගත්ත. අන්තිමේදි එතුමා මගෙ ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් කිව්වෙ එවැනි තත්ත්වයක් නැති බවයි. එසේ පිළිතුරු දී එතුමා, රක්‍ෂණ සංස්ථා වෙහි සිටි කළමනාකාර මහතා අනුරාධ පුරයට මාරු කර දැම්ම. එසේ කෙළේ, රක්‍ෂණ සංස්ථාවෙහි තිබුණු ඒ ගඳගහන දූෂිත ව්‍යාපාරය එළි වුණේ ඒ කළමනාකාර මහතාගෙන්ය යන අදහස ඇති කර ගෙනයි. මේ අදහස උඩ එක්සත් ජාතික පක්‍ෂයෙ යම් යම් උදවිය වෙළෙඳ උප ඇමති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුමාට දුන් උපදෙස් කල්පනාවට ගෙන එතුමා, රක්‍ෂණ සංස්ථාව නියම අන්දමින් ක්‍රියාත්මක කිරීමට වැඩ කළ නිලධාරියා අනුරාධපුරයට මාරු කර දැම්ම. ඇත්ත වශයෙන්ම, මට ඒ තොරතුරු ලැබුණේ කළමනාකාර මහතාගෙන් නොවෙයි. මට තොරතුරු ලැබුණේ රක්ෂණ සංස්ථාව යටතේ සේවය කරන යම් යම් ඒජන්ත මහත්වරුන්ගෙනුයි. රක්ෂණ සංස්ථාව තුළ බරපතල වැරදි කෙරෙන බවත් නොයෙකුත් වැරදි ක්‍රියා මාර්ගයන් නිසා රක්ෂණ සංස්ථාවට නිසි ලෙස ආදායම් නොලැබෙන බවත් රක්ෂණ සංස්ථාවට ලැබෙන්න තියෙන මුදල් ආදිය වෙනත් මාර්ගවලින් කළමනාකාරතුමා ලබා ගන්න බවත් ඇතැම් ඒජන්තවරුන්ගෙන් මට දැන ගන්න ලැබුණා. ඒජන්තවරුන්ගේ නම් යොදා මෙම දූෂණ ක්‍රියාවන් කර ගෙන යන බවත් මට දැන ගන්න ලැබුණා. රක්ෂණ සංස්ථාව සම්බන්ධයෙන් වුවත් වෙනත් ආයතන සම්බන්ධයෙන් වුවත් ඇති තතු පෙන්වා දෙන විට ඇත්ත වශයෙන්ම සිදු වන්නේ ඒ වැරදි නැති කර ගැනීමට තැත් කිරීම නොවෙයි. තමන්ගේ පක්ෂයට වැඩ කරන ප්‍රාදේශීය දේශපාලන නායකයන් සතුටු කරන්නටයි අපේ මේ හත් හවුල් ආණ්ඩුවේ ඇතැම් ඇමතිවරුන් ක්‍රියා කරන්නෙ. ඒ කනගාටුදායක තත්ත්වය මේ ගරු සභාව වෙත කියා සිටින්න ඕනෑ.

ජනසතු ව්‍යාපාර දියුණුවෙන් දියුණුවට පත් වෙනවා දකින්නට අප කැමතියි. ඒවා ඉදිරියට ගෙන යන්නට අප කැමතියි. ජනසතු ව්‍යාපාරවලට අප කැමතියි. ජනසතු ව්‍යාපාරවලට අප එකඟයි. ඒවා කාර්යක්ෂම ලෙස ක්‍රියා කරනු දැකීම අපේ බලවත් ප්‍රීතියට හේතු වෙනවා. දූෂණයන්ගෙන් තොරව මහජනතාවට ඉතාමත් ප්‍රයෝජනවත් ලෙස සාධාරණ අන්දමට ජනසතු සේවාවන් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ආධාරය දෙන්නට අප ලෑස්තියි. ඒ කොයි හැටි වෙතත් යම් ප්‍රශ්නයක් ඇහුවාම ඊට පිළිතුරු දීමේදී ප්‍රශ්නයේ නියම තත්වය පැහැදිලි වන ආකාරයට කරුණු එළිදරව් කිරීමට මැලි විය යුතු නැහැ. සමහර ඇමතිවරුන් පිළිතුරු දෙන්නෙ කරුණු එළිදරවු වන අන්දමට නොව වැහෙන ආකාරයටයි. එය කනගාටුදායකයි.

පසුගිය කාලයේදී රක්ෂණ සහතික ලබා ගත් බොහෝ දෙනකුට තම තමන් විසින් ගෙවන ලද මුදල් ආපසු ලබා ගන්නට නොයෙක් දුෂ්කරතා ඇති වුණා. ඒ ගැන මෙහිදී සඳහන් කළ යුතුව තිබෙනව. මේ සම්බන්ධයෙන් බේරුම්කාර මණ්ඩලවලට වගකීම භාර දුන් අවස්ථා කෙතෙකුත් ඇතත් තවමත් ඒවා අවසන් වී නැහැ. ඒ නිසා මේ තත්ත්වය ගැන සොයා බලා යම්කිසි සහනයක් ලබා දීමට ක්‍රියා කරන මෙන් ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගෙන් මේ අවස්ථාවේදී මා ඉල්ලා සිටිනව. රුපියල් දහස් ගණන් ලබා ගැනීමට බලාපොරොත්තු වූ පුද්ගලයන්ට එක තඹ සතයක්වත් ආපසු ලබා ගන්න බැරිවීම කනගාටුදායකයි. එවැනි තත්ත්වයට පත්වූ විශාල පිරිසක් ඉන්නව. විරුද්ධ පාර්ශ්වයෙන් හෝ ආණ්ඩු පාර්ශ්වයෙන් හෝ ඉදිරිපත් කරනු ලබන කරුණු ගැන අපක්ෂපාත ලෙස සොයා බලා සාධාරණත්වය ලබා දෙන මෙන් ඉල්ලමින් මගේ වචන සවල්පය මෙයින් අවසන් කරනව.

අ. භා. 3.12

බී. එච්. බණ්ඩාර මයා. (බදුල්ල)
*(திரு. பி. எச். பண்டார—பதுளை)*
(Mr. B. H. Bandara—Badulla)

ගරු කථානායකතුමනි, රක්ෂණ ව්‍යාපාර ජනසතු කිරීම මේ රටේ ඓතිහාසික සිද්ධියක්. රක්ෂණ ව්‍යාපාර ජනසතු කිරීමේ එක් ප්‍රතිඵලයක් වශයෙන් මේ රටේ විදේශ විනිමය විශාල වශයෙන් ඉතිරි වූ බවත්, මේ රටින් පිටරටවලට ඇදී ගිය විශාල මුදල් ප්‍රමාණයක් මේ රටේ ඉතිරි වූ බවත් අප කවුරුත් පිළිගන්නව. එපමණක් නොව විශ්වාසයක් ඇතිව තමන්ගේ මුදල් රක්ෂණ ව්‍යාපාරයෙහි යොදන්නත් අවස්ථාවක් අප රට වැසියන්ට එයින් ලැබුණා.

රක්ෂණ ව්‍යාපාරය ජනසතු කරන ලද නමුත් එහි තවමත් යම් යම් අඩුපාඩු තිබෙන බව අපට පැහැදිලියි. තව දුරටත් එය දියුණු කරන්න ඉඩ තිබෙනව. කොයි දෙයක් වුවත් ආරම්භ කර පවත්වාගෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

යන විට ක්‍රම ක්‍රමයෙනුයි එහි අඩුපාඩු පෙනෙන්න පටන් ගන්නෙ. රක්ෂණ ව්‍යාපාරය ජනසතු කිරීම සම්බන්ධයෙනුත් කියන්න තියෙන්නෙ එයමයි. රක්ෂණ ව්‍යාපාර ජනසතු කිරීම නිසා එතෙක් මෙරටින් පිට රටවලට ඇදී ගිය විශාල ධනස්කන්ධයක් මෙහිම රැඳුණු බවත්, රක්ෂණ ව්‍යාපාරවල තමන්ගේ මුදල් යෙදීමේදී වැඩි විශ්වාසයක් ඇතිව එය කරන්නට හැකියාවක් මහජනතාවට ලැබුණු බවත් අපට පිළිගන්න පුළුවනි. ඒ සමගම අප විසින් පිළිගත යුතු තවත් එක් කරුණක් තිබෙනවා. පෞද්ගලික රක්ෂණ සමාගම්වල සේවය කරමින් සිටි ඇතැම් අය ජනසතු කරන ලද රක්ෂණ සංස්ථාවට ඇතුළු වුණා. ඒ සමගම සමහර අය තමන්ගේ පරණ පුරුදු හොරකම් ඇතුළු නොයෙක් විධියේ දූෂණ ක්‍රියාත් මේ රක්ෂණ සංස්ථාව තුළට ගෙන ආ බවත් රහසක් නොවෙයි. අපට නිතර නිතර මහජනයා හමු වෙනවා. නොයෙක් තරාතිරම්වලට අයත් ජනයා අප හමු වීමට එනවා. ඒ අය නොයෙක් විධියේ පැමිණිලි අප ඉදිරියේ තබනවා. තමන් විසින් රක්ෂණ සහතික සඳහා ගෙවන ලද මුදල් ආපසු ලබා ගැනීමේදී මුහුණ පෑමට සිදු වන අමාරුකම් ඇතුළත් පැමිණිලිත් අප ඉදිරියට ගෙන එනවා. බොහොම අමාරුවෙන් හරි හම්බ කර ගත් මුදලින් සැලකිය යුතු ප්‍රමාණයක් රක්ෂණ ව්‍යාපාරය තුළ යෙදූ සමහර අයට එය ආපසු ගැනීමට වුවමනා වූ විට ඒ පෞද්ගලික රක්ෂණ සමාගම් හිමියන් නොයෙක් විධියේ කූට උපක්‍රම යොදන නිසා අමාරුකම් ඇති වෙනවා. මේ අනුව අහිංසකයන් විශාල සංඛ්‍යාවක් දැනටමත් අමාරුවේ වැටී සිටින බව රහසක් නොවෙයි. එය ඉතාමත් පැහැදිලි දෙයක්.

දැන් මෙම පනත අනුව රක්ෂිකයන්ට නඩු මඟට බසින්න අවස්ථාව සැලසුණත් දුප්පත් බොහෝ දෙනකුට නඩු කියන්න ශක්තියක් නැහැ. ඒ මොකද? ඒ පෞද්ගලික රක්ෂණ සමාගම් හිමියන් නොයෙක් කූටෝපක්‍රම යොදා මුදල් හදල් වියදම් කිරීමට ඉඩ තිබෙන නිසයි. ඒ නිසා දුප්පත් මිනිසුන්ට අර සමාගම් හිමියන් සමග නඩු කියා සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට ශක්තියක් නැහැ. රක්ෂණ ව්‍යාපාරය සම්පූර්ණයෙන් ජන සතු කිරීමෙන් සැහෙන ප්‍රතිඵල ලබා ගැනීමට පුළුවන් බව අපට පේනවා. එසේ ජන සතු කිරීමෙන් පෞද්ගලික සමාගම් සම්පූර්ණයෙන්ම නැති කරන්න පුළුවනි. මුදල් ඉපයීමේ පරමාර්ථයෙන්ම අහිංසකයන් අමාරුවේ දමා ක්‍රියා කරන පෞද්ගලික සමාගම් සම්පූර්ණයෙන්ම නැති කර දමන්න ඕනෑ.

රක්ෂණ ව්‍යාපාරයේ යෙදී සිටින ඒ පෞද්ගලික රක්ෂණ සමාගම්වල නියෝජිතවරුන් අහිංසකයන් හමුවට ගොස් නොයෙක් විධියෙන් ඔවුන් මුළා කර තිබෙනවා. නොයෙකුත් කූටෝපක්‍රම යොදා බොරු පොරොන්දු දී ඔවුන්ගේ ජීවිත රක්ෂණ කර තිබෙනවා. ඒ රක්ෂිකයන් තමන්ගේ මුදල් ආපසු ලබා ගැනීමට ගිය විටයි අමාරුවට පත් වන්නෙ. ඒ විධියේ කූටෝපක්‍රම යොදන අයගෙන් මහජනතාව බේරා ගැනීම රජයේ යුතුකමක්ව තිබෙනවා. එම නිසා ඒ සම්බන්ධයෙන් ආණ්ඩුවේ සැලකිල්ල යොමු කිරීම ඉතාමත් වැදගත් කාරණයක් බව මම දන්වන්න කැමතියි.

ඒ සමගම මම සඳහන් කරන්න කැමතියි, රජයේ ජනසතු ව්‍යාපාර අතර රක්ෂණ ව්‍යාපාරය ජනසතු කිරීම මේ රටේ ආර්ථික ඉතිහාසයේ වැදගත් පිටුවක් පෙරළීමක් බව. එම ජනසතු ව්‍යාපාරය—රක්ෂණ ව්‍යාපාරය—විශාල ලාභයක් ලැබෙන ව්‍යාපාරයක්. එහෙත් යම් යම් හේතුන් නිසා සමහර විට එහි වැඩ කරන සමහර නිලධාරීන්ගේ දූෂණකම් නිසා එයින් රටට ලැබිය යුතු නියම ප්‍රයෝජනය නොලැබෙන බව අපි දන්නවා. එය රහසක් නොවෙයි. ඒ නිසා රජයට විශාල ආදායමක් ලැබෙන්නාවුත්, රටේ ධන නිධානයක් හැටියට සලකන්නට පුළුවන් වූත් රක්ෂණ ව්‍යාපාරයෙන් රටට ලැබිය යුතු නියම ප්‍රයෝජනය නොලැබී ඇත්තේ කුමක් නිසාදැයි සොයා බලා ඊට නිසි පිළියම් යෙදීම ඉතාමත් වැදගත් කාර්යයක්.

රක්ෂණ සංස්ථාවේ සමහර ශාඛාවලට කළමනාකාරවරුන් පත් කිරීමේදී නොයෙකුත් හේතුන් නිසා සුදුසු අය පත් නොවන බව අපට පෙනී යන කාරණයක්. සමහර විට නොයෙකුත් දේශපාලන

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

හේතූන් නිසාත්, පෞද්ගලික නැදෑහිත වත්කම් නිසාත් කළමනාකාරවරුන් වශයෙන් නියම සුදුස්සන් පත් නොවී නුසුදුස්සන් පත් වී තිබෙනව. එසේ පත් වී ඇති යම් යම් ශාඛා භාර කළමනාකාර වරුන් සිටිනව. නම් වශයෙන් කියන්න අවශ්‍ය නැහැ. වුවමනා නම් කියන්නත් පුළුවනි. සමහර ශාඛාවලට පත් වී සිටින කළමනාකාරවරුන් ඒ තත්ත්වයට නොගැළපෙන, ඒ නිලය දැරීම සඳහා සුදුසුකම් නැති අයයි. ඒ හේතුකොටගෙන ඒ ශාඛාවල කටයුතු හරිහැටි පවත්වාගෙන යන්න පුළුවන්කමක් නැහැ. සමහර ස්ථානවල කටයුතු ඇණහිට තිබෙනව; දුර්වල තත්ත්වයකට පත්ව තිබෙනව. ඒ නිසා රක්ෂණ ව්‍යාපාරයේ ඒ ඒ ශාඛා භාරව පත් කරන කළමනාකාරවරුන් ඉතාම දක්ෂ ඒ වාගේම රක්ෂණ ව්‍යාපාරය දියුණු කරන්න පුළුවන් ශක්තියක් ඇති උදවිය වුවහොත් රක්ෂණ ව්‍යාපාරයෙන් මීට වඩා විශාල ප්‍රයෝජනයක් ලබා ගැනීමට පුළුවන් බව මම මතක් කරන්න කැමතියි.

මෙහි ඇති තවත් දුර්වලකමක් නම් කලින් සමාගම්වල සිටි සමහර අය මෙම ව්‍යාපාරයට ඇතුළු වීමෙන් අර පරණ හොර කම් මෙම ව්‍යාපාරයට බෝවීම හේතුකොට ගෙන මෙයින් බලාපොරොත්තු වූ ප්‍රතිඵල සැහෙන ප්‍රමාණයකින් අඩු වීමයි. ඒ පිළිබඳවත් සැලකිල්ල යොමු කළ යුතු බව දන්වන අතර රක්ෂණ ව්‍යාපාරයට අවශ්‍ය සේවකයන් පත් කිරීමේ වැරදි පිළිවෙල නිසා මෙයද කතෝලික ගුහාවක් හැටියට පත් වී තිබෙන බව පෙන්වා දෙන්න කැමතියි. ඒ නිසා රක්ෂණ සංස්ථාව තුළට කතෝලික ආක්‍රමණයකුත් ඇතුළු වී තිබෙනවාද කියන සැකයක් අපට ඇතිවී තිබෙනව. පසුගිය කාලයේ ලංකා බැංකුව වැනි ආයතනවලට ද්‍රවිඩ අයම පත් වේගන ගියා. සිංහලයෙක් දකින්නවත් සිටියෙ නැහැ. එමෙන්ම රක්ෂණ සංස්ථාවේ අභ්‍යන්තර තත්ත්වය ගැන බලන විට කතෝලික ආක්‍රමණයක් එහි තිබෙනවාය කියා සැක කරන්නට හොඳටම ඉඩ තිබෙනව. ඒ නිසා ආගම් අනුව විශේෂ සැලකිලි නොදක්වා කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. අවශ්‍ය සුදුසුකම් හැර වෙනත් බලපෑම්වලට රක්ෂණ සංස්ථාවට ඇතුළු වීමට ඉඩ නොතබන හැටියට ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනව.

අ. භා. 3.20

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

ගරු කථානායකතුමනි, මේ පනත අනුමත කරගෙන මුදල් ඇමතිතුමා විසින් කරගෙන යෑමට අදහස් කරන වැඩ කටයුතු පහසුවෙන් කරගෙන යෑමට ඉඩ ප්‍රස්තාවක් දීම සඳහා මේ ඉදිරිපත් කර තිබෙන සංශෝධන පනතට ආධාර දෙන්නට අපි සූදානම්. එහෙත් එක කරුණක් කියන්න කැමතියි. රක්ෂණ සංස්ථාව හරියාකාර ගෙන යාවිය කියන විශ්වාසය තබන්නට අමාරුයි. රක්ෂණ සංස්ථාව ගෙන යන මේ රජය කෙරෙහිවත්, එය භාර ඇමතිවරයා කෙරෙහිවත්, එවැනි විශ්වාසයක් තබන්නට බැරි වීම ගැන මා කණගාටු වෙනව. මේ රක්ෂණය පවත්වාගෙන යන්නේ කුමන අදහසක් උඩද කියන කාරණය ගැන—වෙනත් රජයක් විසින් කළ කටයුත්තක් නිසා—අවබෝධයක් ලබාගන්නට මේ රජයට බැරි වී තිබෙනව. මේ රජය මෙය පවත්වාගෙන යන්නේ සල්ලි හම්බ කිරීමේ ව්‍යාපාරයක් හැටියටයි.

රක්ෂණ සංස්ථාවේ ශාඛා කීපයක් ලංකාවේ නානා ප්‍රදේශවල තිබෙනව. ලාභය අඩු වන්නේ නැත කියන ප්‍රතිපත්තිය උඩ එයින් ශාඛා කීපයක්ම වසා දමා තිබෙනව. මහජනයාගේ පහසුව ගැන හෙ... රක්ෂණ ක්‍රමය දියුණු කිරීම ගැන නො...කා, ලාභය අඩු වන්නේ නැත කියන එ...ම ප්‍රතිපත්තිය උඩ ශාඛා සමහරක් වස... දමා තිබෙනව. එක් අවස්ථාවක් මම පෙන්වා දෙන්නම්. ඒ ප්‍රශ්නය ගරු ඇමතිතුම...ටත් මේ ගරු සභාවටත් මා ඉදිරිපත් කළ... ලියුම් හා විදුලි පණිවුඩ මාර්...යෙනුත් ඉදිරිපත් කර තිබෙන... රක්ෂණ සංස්ථාවේ ශාඛාවක් පානදු... තිබුණා. එහි ලක්ෂ ගණනක වාර්ෂි... "බිස්නස්" එකකුත් තිබුණා. එහෙත් ඒ ශාඛාව දැන් වසාදමා තිබෙනව. ඒ කාරණ... සම්බන්ධව මා බැසගත් තීරණය නම් ර...

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලෙස්ලි ගුණවර්ධන මයා.]

ෂණ සංස්ථාව හා එහි ශාඛා පවත්වාගෙන යන්නේ කුමන පරමාර්ථයක් උඩද කියන එක මේ රජයට තවම තේරුම් ගන්නට බැරි වී තිබෙන බවයි. මේ රජය හිතාගෙන ඉන්නේ රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යන්නේ ලාභ ලැබීම සඳහාය කියලයි. ඒ මගින් සෑහෙන ලාභයක් ලැබෙන එක ඇත්තයි. මීට කලින් විදෙශීය කොම්පැනිවලට ලැබුණු ලාභයක් අද රජයට ලැබෙනව. එහෙත් මෙහි පරමාර්ථය ලාභය නොවෙයි, සේවයයි. පානදුරේ ශාඛාවේ තිබුණු "බිස්නස්" කොළඹට ලැබෙයි කියන පරමාර්ථය උඩ පටු අන දමින් කටයුතු කිරීම පමණක් නොවෙයි, මෙයින් සිදු වී තිබෙන්නෙ. රක්ෂණ සංස්ථාවෙන් රටේ ආර්ථික ක්‍රමයට හා ජනතාවට ඇති වන සේවය කුමක්ද කියන කරුණ වැටහීමක් නැතිව කටයුතු කිරීමක් කර තිබෙනව. ඒ විධියට ශාඛා කීපයක්ම වසා දමා තිබෙනව. ඒ හැම එකක්ම වසා දැමුවේ ලාභය අඩු වන්නේ නැත කියන ප්‍රතිපත්තිය උඩයි. එසේ කර තිබෙන්නේ මහජනයා වියදම් කර ගෙන කොළඹට පැමිණ රක්ෂණ කටයුතු කර ගනීවිය කියන ප්‍රතිපත්තිය උඩයි.

තවත් වැරදි ප්‍රතිපත්තියක් තිබෙනව. පානදුරේ ශාඛාව වසා දැමුවේ එය ඇති කිරීමේ නියම පරමාර්ථය මේ රජයට නොතේරුණු නිසා වන්නට ඇති. ඊට වඩා ටිකක් නපුරු ප්‍රතිපත්තියකුත් එහි තිබෙනව. පානදුරේ ශාඛාවට වඩා හුඟක් අඩුවෙන් "බිස්නස්" තිබුණු, වසා දමන්නට නියම කර තිබුණු, අම්බලන්ගොඩ ශාඛාව නැවත විවෘත කර තිබෙනව. පානදුරේ ශාඛාව වසා දැමීම නැවැත්වීමට පානදුරේ මන්ත්‍රීවරයාට (ලෙස්ලි ගුණවර්ධන මයා.) බැරිවුණත්, අම්බලන්ගොඩ ශාඛාව වසා දැමීම නතර කිරීමට අම්බලන්ගොඩ මන්ත්‍රීවරයාට (වෛද්‍යාචාර්ය එම්. එච්. සද්ධාසේන) පුළුවන් වුණා. එතන පානදුරේ තිබුණු "බිස්නස්" වලින් බාගයක්වත් නැහැ. එම නිසා මේ ශාඛා වසා දැමීමේ වැඩ පිළිවෙළේ එක්තරා නපුරු ප්‍රතිපත්තියක් ගැබ්ව තිබෙනවාය කියා පෙනෙනව මා නොකීවාට එය පාර්ලිමේන්තු ලේකම්තමාට තේරෙනවා ඇති. පානදුරේ මන්ත්‍රීතුමාගේ පක්ෂයත්, අම්බලන්ගොඩ මන්ත්‍රීතමාගේ පක්ෂයත් ගැන හිතන විට එය සිදු වී තිබෙන්නේ කොහොමද කියන එක තේරෙනවා ඇති. ඒ ගැන වැඩි විස්තර කියන්ට ඕනෑ නැහැ. එහෙත් මේ විධියට කටයුතු කරන විට එක අතකින් රක්ෂණ ව්‍යාපාරයේ නියම තේරුම වටහා නොගෙන ක්‍රියා කරන විටත්, අනික් අතින් දේශපාලන බලපෑම් උඩ කොයි ශාඛාව වසා දමනවද, කොයි ශාඛාව පවත්වාගෙන යනවාද යන්න තීරණය කරන විටත්, මේ රජය රක්ෂණ ව්‍යාපාරය සාර්ථක අන්දමට ගෙන යාවි යයි බලාපොරොත්තුවක් තැබිය නොහැකි වීම ගැන මගේ කනගාටුව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනව.

අ. භා. 3.25

**එස්. ඒ. පීරිස් මයා.**
*(திரு. எஸ். ஏ. பீரிஸ்)*
(Mr. S. A. Peeris)

ගරු කථානායකතුමනි, දෙව්නුවර ගරු මන්ත්‍රීතුමා (ද මැල් මයා.) මේ විවාදයේදී ඉදිරිපත් කළ කරුණු ගැන මා පළමුකොටම එතුමාට ස්තුති කරන්ට සතුටුයි. ආණ්ඩුවේ සේවකයන්ගේත්, පෞද්ගලිකව මේ ස්ථානයේ නැති අයගේත් වැරදි මේ ස්ථානයේ ඉදිරිපත් නොකිරීමේ ප්‍රතිපත්තිය අනුව ඉස්සරහටත් වැඩ සිදු වුණොත් අපකාටත් සතුටුවන්ට පුළුවන්. කොයි පක්ෂයේ සිටියත් මන්ත්‍රීවරුන්ගෙන් අපි බලාපොරොත්තු වෙන්නෙ මේ සභා ගැබ තුළ කෙරෙන විවාදවලදී කාටත් අයුත්තක් නොවන අන්දමට සාකච්ඡා පැවැත්වීමයි. එම නිසා දෙව්නුවර ගරු මන්ත්‍රීතුමාට අපගේ ස්තුතිය නැවත වරක් පුද කරනව.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

එහෙම නම් තමුන්නාන්සෙලා වගකීම භාර ගන්න ඕනෑ. නිලධාරීන්ගෙ ඇඟ උඩ දලා—[බාධාකිරීමක්.]

**එස්. ඒ. පීරිස් මයා.**
*(திரு. எஸ். ஏ. பீரிஸ்)*
(Mr. S. A. Peeris)

නිලධාරියකුට විරුද්ධව පෞද්ගලික වශයෙන් යම් චෝදනාවක් ඉදිරිපත් කරන්ට තිබෙනව නම් කරුණාකර කෙළින්ම ඉදිරිපත් කරන්න. එවිට ඒ ගැන සෑහෙන විභාගයක් පවත්වන බවට අප පොරොන්දු වෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මාතර ගරු මන්ත්‍රීතුමා (තුඩාවෙ මයා.) එක්තරා චෝදනාවක් ඉදිරිපත් කරන්ට යෙදුණා. මට මතකයි, ඒ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නය අනුව පාර්ලිමේන්තු ලේකම් හැටියට රක්ෂණ සංස්ථාවෙන්ම කරුණු සොයා බලා මා පිළිතුරක් දුන්න බව. සමහරවිට ඒ අංශය දුන්න උත්තරය පෞද්ගලික වශයෙන් මමත් පිළිගන්නෙ නැහැ. එහෙත් සංස්ථාවෙන් දුන් පිළිතුර පිළිගන්නට සිද්ධ වුණා. පිළිතුරක් වශයෙන් මා එය ඉදිරිපත් කළා. එහෙත් එතුමා සඳහන් කළ අන්දමට කළමනාකරු මාරු කළා යයි අපට පිළිගන්ට බැහැ. ඒක අපේ අනුදැනුම ඇතිව කළ දෙයක් නොවෙයි. ඒ ගැන සොයා බලා මා ඒ මන්ත්‍රීතුමාට දන්වනව.

ගරු කථානායකතුමනි, මේ පනත ඉදිරිපත් කර තිබෙන්නෙ රක්ෂණ ව්‍යාපාරය පාලනය කිරීමෙදි එහි නිලධාරීන්ට මුහුණ පාන්ට සිදු වී තිබෙන අමාරුකම් කීපයක් පිළිබඳව ඔවුන් විසින් ඉදිරිපත් කළ කරුණු පරීක්ෂා කිරීමෙන් පසුවයි. රක්ෂණ පනත ඉදිරිපත් කරන ලද අවස්ථාවෙදි කෙසේ හෝ ඒ පනතේ මේ දුබලකම් ඇති වී තිබෙනව. 1964 න් පසුව ගත වූ මේ කාලය තුළදී පැමිණිලි 695 ක් රක්ෂණ කටයුතු සම්බන්ධයෙන් ඉදිරිපත් වී තිබෙනව. නිලධාරී මහත්වරුන් වැඩ කර ලත් තිබෙනව. නමුත් ඒ ගැන තව දුරටත් වැඩ කරන්ට බැරිව තිබෙන්නෙ මේ පනතේ ඇති දුර්වලකම් නිසයි. නීතිපතිතුමා කවුරු වුණත් අමාත්‍යාංශයකට නීතිපති කෙනෙක් යම් අවවාදයක් දුන්නොත් එය හේතු යුක්ති උඩ පිළිගත යුතුව තිබෙනව. කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) හිටපු නීතිපතිතුමාගේ අවවාද උඩ නොවෙයි මේ සංශෝධන පනත ඉදිරිපත් කළේ. මෙය ඉදිරිපත් කළේ දැනට ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර ධුරයක් දරන ඊට කලින් හිටපු නීතිපතිවරයෙකුගේ අවවාද අනුවයි. පක්ෂ ප්‍රතිපත්ති අනුව හෝ වෙනත් කරුණු අනුව මෙම කෙටුම්පත ඉදිරිපත් කර නැහැ. ඒ ගැන අවිශ්වාසයක් ඇති කර ගන්ට වුවමනාවකුත් නැහැ. මහජනතාවගෙ සුබ සිද්ධිය තකාමයි මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නෙ. මෙම පනත් කෙටුම්පතට අදාලව දෙපැත්තෙන්ම කතා කළ ගරු මන්ත්‍රීන් 79 (ඒ) කොටස හැර අනික් කොටස් පිළිගත්ත. ඇමතිතුමා ගැසට් නිවේදනයකින් ඔය ඉල්ලන දේ දීමෙදී යම් අවස්ථාවක එය උසාවිවලින් පිළි නොගන්ට පුළුවන් නිසයි මෙය ඉදිරිපත් කර තිබෙන්නෙ. වැඩි දීර්ඝ විස්තරයක් කිරීම අවශ්‍ය යයි මා සිතන්නෙ නැහැ.

තව එක කාරණයක් කියන්ට ඕනැ. ඉන්ෂුවරන්ස්කාරයින්ටත් නඩු දමන්ට ඉඩ තිබෙන එකෙන් සමහරවිට ආණ්ඩුවට තිබෙන යුතුකම ඉටු නොකරාවිය කියා යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) කීව. එහෙම දෙයක් නැහැ. සමහරවිට ආණ්ඩුවෙ අදහස් වැරදි වුණොත් ඇමතිතුමා ඒ ගැන වැඩ කෙරුවෙ නැතිනම් තමන්ගෙ සුබ සිද්ධියට වැඩ කර ගැනීමට පුද්ගලික උදවියට බලය තියෙන්ට ඕනැ. ඒකයි එයින් අදහස් කරන්නෙ.

කොලොන්නාවෙ ගරු මන්ත්‍රීතුමා (ඉලංගරත්න මයා.) තම කතාවෙදි කරුණු කීපයක් ගැන සඳහන් කරන්ට යෙදුණා. මම ඒව ගැන මතක් කරන්ට බලාපොරොත්තු වන්නෙ නැහැ. නමුත් ගරු ඇමතිතුමා පිළිබඳව කී වචනයකට පමණක් උත්තර දිය යුතුයි. [බාධා කිරීම්] එම කතාවෙදී කියනව, ගරු ඇමතිතුමාට ධෛර්‍යය තියෙනවය; පක්ෂයෙ උදවිය විරුද්ධවුවත් සාකච්ඡා කරන්ට පුළුවන්ය, යනුවෙන්. ඇමතිතුමාට බලය තිබුණා. යුතුකමක් වශයෙන් සිතුව. කොලොන්නාවෙ ගරු මන්ත්‍රීතුමා හැර හිටපු ඇමතිවරු දෙදෙනෙක් එක්ක යම් යම් කරුණු ගැන සාකච්ඡා කළා. දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා සමගත් සාකච්ඡා කළා. ඇමතිතුමාට ධෛර්‍යය තිබෙනව. ඒ අනුව පාලනය කර ගෙන යනව. එම ධෛර්‍යය නැතෙයි කියන නිසයි මේ වචන ටික කීවෙ.

කම්කරුවන්ගෙ ඉල්ලීම් සම්බන්ධව කීව. ඒ ඉල්ලීම් 10න් 8ක් 9ක් පමණ සපිර කරල තියෙනව. එකක් පමණයි තව සාකච්ඡා කරන්ට ඉදිරිපත් වී තිබෙන්නෙ. මාර්තු මාසෙ 15 වෙනිදට ප්‍රථම එය කරනව කීව. නමුත් කිසි දැන්වීමක් නැතුව ස්ට්‍රයික් කළ නිසා එය තවමත් තිබෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එස්. ඒ. පීරිස් මයා.]

ඒ ගැන සාකච්ඡා කර ගෙන යනව. මීට වඩා යමක් කියන්ට මා අදහස් කරන්නෙ නැහැ.

මෙම පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය කියා මම යෝජනා කරනව.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

62 වන වගන්තිය සංශෝධනය කර තිබෙන පිළිවෙළ කුමක් ද කියා කරුණා කර කියන්න. ඇයි ඒ වගන්තිය සංශෝධනය කළේ ?

**එස්. ඒ. පීරිස් මයා.**
*(திரு. எஸ். ஏ. பீரிஸ்)*
(Mr. S. A. Peeris)

ඒක මේ අන්දමට සංශෝධනය කිරීමට වුවමනා කරනව.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**කෙටුම්පත් පණත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.**

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி., மசோதா இரண்டாம் முறையாக மதிப்பிடப்பெற்றது.*

*Question put, and agreed to.*

*Bill accordingly read a Second time.*

**මතු පළ වන යෝජනාව සභාසම්මත විය.**

"කෙටුම්පත් පණත පූර්ණ මන්ත්‍රී මණ්ඩල කාරක සභාවට පැවරිය යුතුය."—[ගරු ජේ. ආර්. ජයවර්ධන.]

*பின்வரும் பிரேரணை ஏற்றுக்கொள்ளப்பட்டது*

*" மசோதா முழுச்சபைக் குழுவுக்குச் சாட்டப்படுமாக —[கௌரவ ஜே. ஆர். ஜயவர்தன]*

*Resolved :*

"That the Bill be referred to a Committee of the Whole House."—[*The Hon. J. R. Jayewardene.*]

**කාරක සභාවෙහිදී සලකා බලන ලදි.**

**[කථානායකතුමා මූලාසනාරූඪ විය.]**

*முழுச்சபைக் குழுவில் ஆராயப்பெற்றது.*
*[சௌரவசபாநாயகர் தலைமை தாங்கினார்.]*

*Considered in Committee.*
[MR. SPEAKER *in the Chair.*]

**1 වන හා 2 වන වගන්ති කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.**

*1 ஆம் 2 ஆம் வாசகங்கள் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.*

*Clauses 1 and 2 ordered to stand part of the Bill.*

CLAUSE 3.—(*Amendment of section 52 of the principal Act.*)

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු සභාපතිතුමනි, මේ 3 වන වගන්තිය ගැන තමයි මා පාර්ලිමේන්තු ලේකම් තුමාගෙන් අවසාන වරට ප්‍රශ්නයක් ඇසුවෙ. නමුත් මට ඒ ප්‍රශ්නයට සතුටු දායක පිළිතුරක් ලැබුණෙ නැහැ. මුල් පනතෙ 62 වැනි වගන්තියෙ තිබෙන්නෙ මෙහෙමයි :

"The Minister may, for the purposes of this Act, appoint one or more Winding-up Tribunals."

වෙනසකට කර තිබෙන්නෙ මුල් පනතෙ "The Minister may, for the purposes of this Act appoint" කියන එක—අළුත් සංශෝධනයෙ ඒ වගන්තිය සම්පූර්ණයෙන්ම වෙනස් කර දමා තිබෙනව—"There may be appointed, for the purposes of this Act" යනුවෙන් සඳහන් කර තිබීමයි.

මුල් පනතෙ ඒ සමාගම් විසුරුවා හැරීමේ බලය පවරා දී තිබෙන්නේ ඇමතිවරයාටයි. මෙතැන මේ සංශෝධනයෙ අසවලා විසින් පැනවිය යුතුය කියා සඳහන් කර නැහැ. "There may be appointed"—කවරකු විසින් හෝ පත් කරන්ට පුළුවනි. මා අසන ප්‍රශ්නය මේකයි. කවුද පත් කරන්ට යන්නෙ ? මා සිතන්නෙ අර කම් කරු ආරාවුල් මණ්ඩලවලට වූ හදිය නිසා, ඒ නඩුව රාජාධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතිද්දි තිබුණු බියක් නිසා, හොල්මනක් කෙරෙහි වූ බියක් නිසා වෙන්න පුළුවන් මේ අන්දමට මේ වගන්තිය සංශෝධනය කර තිබෙන්නෙ. අසවලාට පත් කරන්ට පුළුවන්ය කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සංශෝධනයෙ කියා නැහැ. මේ වගන්තිය විස්තර කරන කොටස දෙවන පිටුවෙ තිබෙනව :

"The legal effect of this clause is that the power of appointing Winding-up Tribunals under the principal Act is vested in the appropriate authority."

මේ කියන මණ්ඩලය පත් කිරීමේ බලය පැවරෙන්නේ නියමිත බල මණ්ඩලය කට කියා සඳහන් කර තිබෙනව. නමුත් නියමිත බල මණ්ඩලය කවුද කියා සඳහන් කර නැහැ. මුල් පනතෙ එනම් 1962 අංක 25 දරණ රක්ෂණ පාලන පනතෙ ඇමති වරයාට යම් බලතල වගයක් පවරා තිබුණා. රක්ෂණ පාලකයකු පත් කරන්ට ඇමති වරයාට පුළුවන්කම තිබුණා. ඒ වාගේම මේ යෝජිත සමාගම් විසුරුවා හැරීමේ මණ්ඩලයට දිස්ත්‍රික් විනිශ්චයකරුවකුව සිටින හෝ සිටි නැනැත්තකු තවත් දෙදෙනෙකුත් සමග පත් කරන්ට පුළුවන් කම තිබුණා. ඒ වචන ඉවත් කර අළුතෙන් කියනව පත් කළ හැකිය කියා. කාටද මේ පත් කිරීමේ බලය දී තිබෙන්නෙ? ඒ එක ප්‍රශ්නයක්. නිකම් ආකාසෙන් වැටෙ නව වගෙ නැත්නම් ඕපපාතිකව වගෙ හිටි ගමන්ම දිස්ත්‍රික් විනිශ්චයකරුවෙකුයි තවත් දෙදෙනෙකුයි මණ්ඩලයට පත් වෙන්ට බැහැ. කාට හරි ඒ බලය තියෙන්න ඕනැ.

**එස්. ඒ. පීරිස් මයා.**
*(திரு. எஸ். ஏ. பீரிஸ்)*
**(Mr. S. A. Peeris)**

මෙයින් අදහස් කරන්නෙ අධිකරණ සේවා කොමිෂන් සභාවට බලය දීමයි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

එහෙම පුළුවන්ය කියා කොතැනද තිබෙන්නෙ? අධිකරණ සේවා කොමිෂන් සභාවට මේක කරන්ට පුළුවන්ය යන්න පනතට ඇතුළත් වී නැහැ. අර කම්කරු ආරාවුල් මණ්ඩලවලට වූ හදිය නිසා බයෙන් කළ වැඩක් වගෙයි මේක. ඇමති වරය පත් කළොත් ඊට විරුද්ධව නඩු කියාවි. එතකොට කල් යනව.

**සභාපතිතුමා**
*(அக்கிராசனர்)*
(The Chairman)

මුල් පනතෙ 76 වන වගන්තියෙ තිබෙන්නෙ, ඒ විධියටයි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

කාටද බලතල දී තිබෙන්නෙ? දැන් ටිකකට කලින් පාර්ලිමේන්තු ලේකම්තුමා කීව, අධිකරණ සේවා කොමිෂන් සභාවට බලතල දෙන්ට ඕනැය කියා. කම්කරු විනිශ්චය සභා සිද්ධියෙදිත් ඔහොම දෙයක් වුණා. එක නඩු තීන්දුවකින් බේරෙන්ට ඕනැකම තිබුණ නිසා අධිකරණ සේවා කොමිෂන් සභාවට කීව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කළ අයටම තවත් පත්වීමේ ලිපියක් දෙන්ට කියා. එතකොට ඒ අයගෙ එක සාක්කුවක රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් දුන් පත්වීම් ලිපිය, අනෙක් සාක්කුවෙ අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් දුන් පත්වීම් ලිපිය. ලිපි දෙකම තියාගෙන නඩු ඇසුව. පත්වීම් කරන්ට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය නැත කියන අමාරුවෙන් බේරෙන්ටයි, අධිකරණ සේවා කොමිෂන් සභාවටත් කීවෙ පත්වීම් ලිපි නිකුත් කරන්ටය කියා. සාක්කු දෙකේ පත්වීම් ලිපි දෙක තියාගෙන ඒ අය කම් කරුවන්ගෙ නඩු ඇසුව. අන්තිමේදී රාජාධි කරණය තීන්දුවක් දුන්න, කලින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් දුන් පත්වීම ඇතිය කියා.

ඒ හැරෙන්නට, විනිශ්චය සභාවට වර්තමාන දිස්ත්‍රික් නඩුකාරවරයෙක් හෝ දිස්ත්‍රික් නඩුකාර ධුරයක් දැරූ කෙනෙක් පත් කරන බවකුත් සඳහන් වෙනව. දැනට සිටින දිස්ත්‍රික් නඩුකාරයෙක් පත් කරන්ට නම් බලය තිබෙන්නෙ අධිකරණ සේවා කොමිෂන් සභාවටයි. අධිකරණ නිලයක් දරන කෙනෙකුට වෙනත් පත් වීමක් දෙන්ට අධිකරණ සේවා කොමිෂන් සභාවට හැරෙන්නට වෙනත් කිසිම කෙන කුට පුළුවන්ය කියා මම හිතන්නෙ නැහැ. එසේ නම් එය පැහැදිලි කරන්න. එහෙම නැත්නම් වර්තමාන දිස්ත්‍රික් නඩුකාරවර යකු පත් නොකර හිටපු දිස්ත්‍රික් නඩුකාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

යෙක් පත් කළ යුතුයි. දැනට සිටින නඩු කාරවරයකුට පත්වීමක් දෙන්ට ඇමතිවර යාට තබා වෙන කිසිම කෙනකුට බෑ, අධි කරණ සේවා කොමිෂන් සභාවට හැරෙන් නට. එම නිසා මේ ඡේදය සංශෝධිත විධි යෙනුත් නොයෙකුත් ප්‍රශ්න මතු වන්ට පුළුවන්.

3 වන වගන්තිය කෙටුම්පත් පණතෙහි කොට සක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

3 ஆம் வாசகம் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.

*Clause 3 ordered to stand part of the Bill.*

4 වන හා 5 වන වගන්ති කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

4 ஆம் வாசகமும் 5 ஆம் வாசகமும் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.

*Clauses 4 and 5 ordered to stand part of the Bill.*

CLAUSE 6.—(*Amendment of section 79 of the principal Act*)

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Why is the Hon. Minister moving the deletion of sub-section (2) of Section 79? You are removing the power of the Hon. Minister to make any regulations with regard to seizure of property and so on. Is it the position that this is unnecessary now in view of the new Section 79A?

**එස්. ඒ. පීරිස් මයා.**
*(திரு. எஸ். ஏ. பீரிஸ்)*
(Mr. S. A. Peeris)

That is the position.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Are you quite satisfied?

**එස්. ඒ. පීරිස් මයා.**
*(திரு. எஸ். ஏ. பீரிஸ்)*
(Mr. S. A. Peeris)

Yes.

6 වන වගන්තිය කෙටුම්පත් පණතෙහි කොට සක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

6 ஆம் வாசகம் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.

*Clause 6 ordered to stand part of the Bill.*

CLAUSE 7.—(*Insertion of new section 79A in the principal Act*)

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

I am not quite happy about this because my interpretation is slightly different. Section 79A operates in order to complete the implementation of Section 53. Is that correct? Under Section 53, in Part VII of the original Act, the main burden is on the Controller. In Section 53 you have completely kept out the policy holder. There is nothing at all in that section dealing with the policy holders.

**එස්. ඒ. පීරිස් මයා.**
*(திரு. எஸ். ஏ. பீரிஸ்)*
(Mr. S. A. Peeris)

Section 53?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Why are you, in implementing Section 53, now bringing in the policy holder? The point raised by my good Friend seated behind the hon. Parliamentary Secretary is that this is an additional safeguard. If, for any reason, the Controller is negligent, careless or not doing his job properly, the policy holder also has his remedy in law. That was his position. If that is your argument it is all right. But, my worry is this: suppose, now that the policy holder has the right to go to court, the Controller says, "Why should we bother about it? Let the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

policy holder look after his business." Would you not therefore give the Controller now the opportunity of shirking his responsibility? That is what I am worried about.

එස්. ඒ. පීරිස් මයා.
*(திரு. எஸ். ஏ. பீரிஸ்)*
(Mr. S. A. Peeris)

It will not be that.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

You cannot say that. We have seen this in practice. Where Government officers are concerned, the path of least resistance is the best policy they have always followed. They think that if they do the least amount of work, the better it is. The best public servant is the man who does the least amount of work or takes the least amount of decisions. That is the standard rule among public servants.

එස්. ඒ. පීරිස් මයා.
*(திரு. எஸ். ஏ. பீரிஸ்)*
(Mr. S. A. Peeris)

That is the reason.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

I hope you are right. That is the only reason why we are objecting to this clause. But you must see that the Controller does not shirk his responsibility—that is what is wanted—and leave it to the policy holder. Then it will be all right.

7 වන වගන්තිය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

ප්‍රඥප්ති වගන්ති සහ නාමය කෙටුම්පත් පණතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

කෙටුම්පත් පණත, සංශෝධන රහිතව, වාර්තා කරන ලදී.

7 ஆம் வாசகம் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.

சட்டமாகு வாசகமும் தலைப்பும் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென ஆணையிடப்பட்டது.

மசோதா திருத்தமின்றி ஏற்றுக்கொள்ளப்பட்டதாக அறிவிக்கப்பட்டது.

*Clause 7 ordered to stand part of the Bill.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported without Amendment.*

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

I move,

"That the Bill be now read the Third Time."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

කෙටුම්පත් පණත ඊට අනුකූලව තුන්වනවර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, மசோதா மூன்றும் முறையாக மதிப்பிடப்பெற்று நிறைவேற்றப்பெற்றது.

*Question put, and agreed to.*

*Bill accordingly read the Third time, and passed.*

## ටී. පී. ඇල්. ද සිල්වා මහතාට පාරිතෝෂිකයක්

## திரு. ரீ. பி. எல். த சில்வாவுக்குப் பணிக்கொடை

## GRATUITY TO MR. T. P. L. DE SILVA

අ. භා. 3.45

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

I move,

"That a gratuity of Rupees Two thousand four hundred and thirty-eight and cents ninety-two (Rs. 2,438.92) chargeable to Head 37—Pensions, Vote No. 2. Sub-head 21—Non-Statutory pension awards granted by Resolution

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ජේ. ආර්. ජයවර්ධන]

of Parliament be paid to Mr. T. P. L. de Silva, Engine Room Artificer of the Royal Ceylon Navy."

The Parliamentary Secretary to the Minister of Finance will make his explanation.

**විමලසේන මයා.**
*(திரு. விமலசேன)*
(Mr. Wimalasena)

In 1959, a committee under the chairmanship of Mr. E. F. N. Gratiaen, Q.C., recommended, among other things, increased rates of pension and gratuity to armed services personnel. These recommendations were accepted and it was decided to implement them with effect from 1.10.60. The recommendations relating to naval personnel were embodied in a revised Navy Pensions and Gratuities Code published in the Gazette of 7.12.62, and those who retired between 1.10.60 and 7.12.62 were awarded the difference in the amounts due under the revised code and under the old code on the authority of a Resolution passed by the House of Representatives at its meeting of July 6, 1965.

An application for payment of the difference between the gratuity due under the revised code and the old code has now been received in respect of Mr. T. P. L. de Silva, an Engine Room Artificer of the Royal Ceylon Navy, who retired on 18.7.62. The naval authorities report that they had not been able to include Mr. de Silva's name in the Resolution of 6.7.1965 as his service particulars were not ready by that time. Mr. de Silva is entitled to Rs. 2,438.92 as the difference in the gratuity due under the revised code and the old code.

This Resolution seeks the authority of the House for the payment.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.
வினா எடுத்தியம்பப்பெற்றது.
*Question proposed.*

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

While supporting the Motion before the House, I have to draw the attention of the Government, through the Hon. Minister of State and the Parliamentary Secretary to the Minister of Finance, to the fact that this payment has arisen out of a little omission in respect of the implementation of the recommendations of the Gratiaen Commission.

A number of recommendations made by the Gratiaen Commission have not been implemented in respect of the armed services, including the recommendation on pay scales. At the same time some of these recommendations have now become completely outdated; conditions have changed and it is time that some body is appointed to revise the pay scales of those who are in the armed services.

There is no provision to pay any pension to the widow and other dependants when this person dies; There is no widows' and orphans' pension fund for personnel in the armed services. Until such time as we can undertake an actuarial survey in regard to the expectancy of life and so on in the armed services on the basis of which a scheme can be formulated, and since this country is not at war, the same figures that apply to persons in the Public Service might be applied to those in the armed services. The expectancy of life in the armed services can be taken to be more or less the same as in the Public Service, and therefore the Widows' and Orphans' Pension Scheme applicable to the Public Service may be applied to the armed services in normal circumstances.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## පරිපූරක මුදල: ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව — මැහුම් කර්මාන්ත මධ්‍යස්ථාන පිහිටුවීම

*குறைநிரப்புத் தொகை: கிராம அபிவிருத்தி, சிறு கைத்தொழில்கள் திணைக்களம்—தையல் வேலை நிலையங்களை நிறுவுதல்*

## SUPPLEMENTARY SUPPLY: DEPARTMENT OF RURAL DEVELOPMENT AND SMALL INDUSTRIES—ESTABLISHMENT OF NEEDLE WORK CENTRES

අ. භා. 3.53.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ගරු කථානායකතුමනි, ගරු ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා වෙනුවෙන් මෙම යෝජනාව මම ඉදිරිපත් කරනවා:

1966 ඔක්තෝබර් මස 1 වැනිදායින් ආරම්භ වී 1967 සැප්තැම්බර් මස 30 වැනිදායින් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවය සඳහා ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් හෝ ලංකාණ්ඩුවේ වෙන යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ලංකාණ්ඩුවට සුදුස්සන් කළ හැකිව තිබෙන මුදලකින් හෝ, ලංකාණ්ඩුව විසින් ණයට ලබාගන්නා ලද මුදලකින් හෝ රුපියල් තුන් ලක්ෂ හය දහස් හත්සිය අසූ අටකට (රු. 3,06,788) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර, එම මුදල මෙහි පහත පෙනෙන උප ලේඛනයේ නියමිත පරිදි වැය කළ යුතුය.

උපලේඛනය

| | රු. |
|---|---|
| ශීර්ෂය: 76—ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව ... සම්මතයේ අංකය :1—කාර්ය මණ්ඩල පුද්ගලික පඩිනඩි සහ වෙනත් දීමනා... ... ... ... | 1,79,974 |
| සම්මතයේ අංකය :2—පාලන ගාස්තු පුනරාවර්තන වියදම් ... | 32,900 |
| සම්මතයේ අංකය :7—ආර්ථික සංවර්ධන—මූලධන වියදම් ... | 93,914 |
| | 3,06,788 |

රජයේ තීරණයක් අනුව මන්ත්‍රී කොට්ඨාශය 151ක මැහුම් මධ්‍යස්ථාන විවෘත කරන්න ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වෙනවා. කාන්තාවන්ට හා දැරියන්ට මැහුම් කර්මාන්තය පිළිබඳ පුහුණුවක් ලබාදීම සඳහායි මෙම වැඩ පිළිවෙළ සකස් කර තිබෙන්නෙ. ඊට වැයවන මුදල් අනුමත කර ගැනීමටයි, මෙම යෝජනාව ඉදිරිපත් කරන්නෙ. ජංගම නැති නම් "මොබයිල්" මැහුම් මධ්‍යස්ථාන ගමක් ගමක් පාසා යමින් ඒ ගමේ මැහුම් කර්මාන්තය පිළිබඳව පුහුණුවක් ලබන්න කැමති කාන්තාවන්ට හා දැරියන්ට ආධාර කිරීමටයි මෙම වැඩ පිළිවෙළින් බලාපොරොත්තු වෙන්නෙ. එක් මධ්‍යස්ථානයක වරකට 30 දෙනකුට පමණ ඉගෙන ගන්න පුළුවනි. පුහුණුවීමේ කාලය අවසන් වුණාම තමන්ගෙ ගෙදරදොරේ මැහුම් කටයුතුවල නිරතවීම හෝ මැහුම් මධ්‍යස්ථානයක වැඩ කිරීම හෝ කරන්න පුළුවනි. දැනට දිවයිනේ මෙවැනි මැහුම් මධ්‍යස්ථාන 68ක් තිබෙනවා. ඒ ගණන 151 දක්වා වැඩි කිරීමටත්, අවශ්‍ය යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමටත්, ගුරුවරුන් පත් කර ගැනීමාදි කටයුතු කිරීම පිණිසත් මෙම මුදල අනුමත කර ගැනීම අවශ්‍ය වී තිබෙනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

අ. භා. 3.55

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු කථානායකතුමනි, තමුන්නාන්සේට මතක ඇති මෙයට අවුරුද්දකට පමණ පෙර ගරු ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා විසින් සෑම මන්ත්‍රී කොට්ඨාශයකම පාහේ පේෂකර්මාන්ත මධ්‍යස්ථාන පිහිටුවීම පිණිස මෙයට සමාන යෝජනාවක් ඉදිරිපත් කර මුදල් වගයක් සම්මත කර ගත් බව. එක මන්ත්‍රී කොට්ඨාශයකට මධ්‍යස්ථාන 7 බැගින් පිහිටුවීමට යනවාය කියා රුපියල් ලක්ෂ ගණනක මුදලක් වෙන් කර ගත්ත. පේෂකර්ම මධ්‍යස්ථාන පිහිටුවන තැන තීරණය කිරීම පිළිබඳව—සමහර විට වැඩි විවාදයක් නැතුව දෙපැත්තෙ ගරු මන්ත්‍රීවරුන්ගෙ කැමැත්ත, සහයෝගය ලබාගැනීමේ චේතනාවෙන් වෙන්න ඇති—ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා විසින් එක්තරා චක්‍ර ලේඛයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

එවා තිබුණා. එම චක්‍රලේඛයෙ සඳහන්ව තිබුණෙ, සෑම මන්ත්‍රී කොට්ඨාශයකම රෙදි මධ්‍යස්ථාන 7 බැගින් පිහිටුවනවාය, එසේ පිහිටුවීමේදී ප්‍රදේශයේ මන්ත්‍රීතුමාගෙ අදහස් විමසා බලා ඕනෑකම් අනුවයි එසේ කරන්නෙ කියා. ඒ වගේම කොට්ඨාශයෙ මන්ත්‍රීතුමාගෙන් පිහිටුවිය යුතු ස්ථාන ගැන විපරම් කර බලා ඒතුමාගෙ අනුමැතිය ඇතුවයි මධ්‍යස්ථාන පිහිටුවීමට තීරණය කරන්නෙ කියා සඳහන්ව තිබුණා. චක්‍රලේඛයෙ ඒ අන්දමට සඳහන්ව තිබුණත් එම යෝජනාව ඇත්ත වශයෙන්ම ක්‍රියාත්මක කරන්ට ගියාම සිදු වුණේ වෙනත් දෙයක්. චක්‍රලේඛයෙන් ප්‍රකාශ කළ අන්දමට ගරු ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා ක්‍රියා නොකළ නිසා විරුද්ධ පක්ෂයෙ මන්ත්‍රීවරුන් කීප පොලක්ම, කීප වාරයක්ම එතුමාට සිය බලවත් විරුද්ධත්වය ප්‍රකාශ කළ බව තමුන්නාන්සේටත් මතක ඇති.

අද ඉදිරිපත් කර තිබෙන යෝජනාවලියෙහි ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා විසින් මෙයට පෙර අවස්ථාවෙදි යෝජනාව ඉදිරිපත් කරමින් චක්‍ර ලේඛයක් මගින් පොරොන්දුවක් දුන්නා වාගේ මේ යෝජනාව ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කරන ප්‍රතිපත්තිය පිළිබඳව පොරොන්දුවක් දී නැහැ. කෙසේ වෙතත් මේ අවස්ථාවෙදි අපට මතක් වෙනව, ගිනි පෙනෙල්ලෙන් බැට කෑ මිනිහ කණා මැදිරියාටත් භයය කියන ගැමි කියමන. චක්‍රලේඛයක් මගින් ලිඛිත ප්‍රතිඥාවක් දී ක්‍රියා කළේ කොයි අන්දමටද කියා අප කව්රුත් දන්නව. පළාතෙ මන්ත්‍රීතුමාගෙන් අසා, ඒ කියන ස්ථානවල පිහිටුවනවාය කිව්වත් ඒ විධියට නොවෙයි ක්‍රියා කළේ; ක්‍රියා කළේ ප්‍රදේශයෙ සිටින එක්සත් ජාතික පක්ෂයෙ පරාජිත අපෙක්ෂකයාගෙත් එක්සත් ජාතික පක්ෂයෙ බලවතුන්ගෙත් වුවමනාකම් අනුව පමණයි. අන්තිමේදි සවදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාට පිළිගන්න සිදු වුනා, තමා කලින් එවූ චක්‍රලේඛයේ යම් යම් වෙනස් කිරීම් කරන්නට තමාට නියෝග කර තිබෙනවය කියා. මේ මධ්‍යස්ථාන පිහිටුවීම පිළිබඳ ප්‍රශ්නයේදී ඒ තරම් කණගාටුදායක තත්ත්වයකට මුහුණ දෙන්න එතුමාට සිදු වුණා. මට පසුව කරන විරුද්ධ පාර්ශ්වයේ

පරිපූරක මුදල

මන්ත්‍රීවරු තම තමන්ගේ ආසනවල ඔය ප්‍රශ්නය සම්බන්ධයෙන් රජය ගත් පියවර විසතර කරනවා ඇති. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මගේ ආසනයේදි නම් මම එක්සත් ජාතික පක්ෂයේ බලපෑම්වලට යට වෙන්න ඉඩ දුන්නෙ නැහැ. ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා, පළාතේ සාමාන්‍ය මිනිසුන්ගේ ඉල්ලීම අනුව ඒ පළාතේ නොදියුණුකම සලකා බලා මුලින්ම යෝජනා කළ තැන්වල පමණක් ඒ ස්ථාන 7 දුන්නා. දකුණු පළාතෙන් ප්‍රථම වරට ඒ මධ්‍යස්ථානයක් විවෘත කරන්න පුළුවන් වුනේ හබරාදුව ආසනයෙයි. ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාත් එයට සහභාගි වුනා. මේ යෝජනා කර තිබෙන මධ්‍යස්ථාන පිහිටුවීමේදී මා කලින් සඳහන් කළ විධියේ අමාරුකම්වලට මුහුණ පෑමට ගරු ඇමතිතුමාට සිදු නොවේවා කියා මම ප්‍රාර්ථනා කරනව. මන්ත්‍රීවරුන්ගේ අදහස් අනුව මේ මධ්‍යස්ථාන පිහිටුවනවාද එසේ නැත්නම් වෙන යම් පිළිවෙළකට පිහිටුවනවාද කියා පොරොන්දුවක් දීල නැහැ.

ගරු කථානායකතුමනි, යෝජනාව ගැන විස්තර ඉදිරිපත් කළ ගරු රාජ්‍ය ඇමතිතුමා කීවා, මේවා ජංගම මධ්‍යස්ථාන වගයක්ය කියා. කොට්ඨාශ 151 ටම මධ්‍යස්ථාන දෙනවා නම් ඇයි මේ මධ්‍යස්ථාන ජංගම කරන්නෙ? කලින් ආසන 151 ක් තිබුනත් මධ්‍යස්ථාන තිබුනේ හැට ගණනක් පමණක් නිසා ඒ මධ්‍යස්ථාන ජංගම කරලා තිබුනා. එසේ තිබෙන විට එක පළාතක උගන්වා පසුව වෙනත් පළාතකට මධ්‍යස්ථානය ගෙන යන්න පුළුවන්. නමුත් හැම ආසනයකටම මැහුම් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් දෙනවා නම් ඒක එහාට මෙහාට හොල්ලන්නෙ ඇයි? ඒක ජංගම කරන්නෙ ඇයි?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)

The Sitting is suspended till 4.30 P.M. On resumption, the Hon. Deputy Chairman of Committees will take the Chair.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් සිටුවන ලදින් අ. භා. 4.30 ට කාරක සභා නියෝජ්‍ය සභාපති තැන් පත් ටී. ක්වින්ටින් ප්‍රනාන්දු මහතාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

*இதன்படி அமர்வு பி. ப. 4.30 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. குழுக்களின் உப அக்கிராசனர் [திரு. ரி. குவின்ரன் பெர்ணாண்டோ] தலைமை தாங்கினார்.*

*Sitting accordingly suspended till 4.30* P.M. *and then resumed,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. T. QUENTIN FERNANDO], *in the Chair.*

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විවේක යට පෙර මා සඳහන් කරමින් සිටියේ ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාගේ යෝජිත ජංගම මධ්‍යස්ථාන ගැනයි. රාජ්‍ය ඇමතිතුමාගෙන් මා ප්‍රශ්න කළේ ආසන 68 කට පමණක් මධ්‍යස්ථාන තිබෙද්දී හැම ආසනයකටම මේ පහසුකම් ලබා දෙන්ට වුවමනා නිසා මේ මධ්‍යස්ථාන ජංගම මධ්‍යස්ථාන හැටියට පිහිටෙව්වත්, ආසන 151 ටම මධ්‍යස්ථාන දෙන්නට යන මේ අවස්ථාවේදී ජංගම ස්වරූපය වැඩි දුරටත් පවත්වාගෙන යන්නේ කුමක් නිසාද කියායි. එයින් එක්තරා ප්‍රයෝජන යක් ඇති වන්න පුළුවන් බව මම පිළි ගන්නව. මා නියෝජනය කරන ආසනය වැනි කුඩා ප්‍රදේශයකින් යුත් ආසනයකට එයින් ප්‍රයෝජනයක් සිදු නොවුනත්, උතුරු-මැද පළාතේ තිබෙන වර්ග සැතැප්ම සිය ගණනක් විශාල ආසනවල මේ ජංගම මධ්‍යස්ථාන පිහිටුවීම නිසා එක ආසනයේ ම එකිනෙකට ඈත ප්‍රදේශවල පදිංචි වී සිටින මහජනයාට මෙයින් එක්තරා පහසු වක් සැලසෙන බව මමත් පිළිගන්නව. හබරාදුව කොට්ඨාශය නම් වර්ග හැතැප්ම සියයක්වත් නැති බව කියන්නට පුළුවනි. එසේ හෙයින් හැම දෙනාටම පහසුවෙන් යා හැකි පොදු තැනක් තෝරාගෙන ඒ මධ්‍යසථානය පිහිටුවීම අමාරු වන්නේ නැහැ. නමුත් මිහින්තලේ අනුරාධපුරය, මැදවච්චිය, වැලිමඩ වැනි ගමන් පහසුකම් නැති ප්‍රදේශවල සිටින ඡන්දදායකයන්ට නම් ජංගම මැහුම් මධ්‍යස්ථාන පිහිටුවීමෙන් පහසුවක් ඇති වන බව පිළි ගන්නවා. එසේ වුවද වැඩිපුර එහා මෙහා යන්නේ නැතිව ගමන් පහසුකම් තිබෙන ප්‍රදේශවල පමණක් මන්ත්‍රීවරුන්ගේ හෝ පරාජිත අපේක්ෂකයන්ගේ හෝ අනුමැතිය ඇතිව ස්ථිර මධ්‍යස්ථාන පිහිටුවීමට ඇමතිතුමා බලය තබා ගන්නවා නම් හොඳයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යෝජනාව පිළිබඳ විස්තර පත්‍රිකාවක් අප වෙත එවා තිබෙනවා. එහි මට තේරුම් ගන්නට බැරි තැනක් තිබෙනවා. සමහර විට මගේ දුර්වලකමක් නිසා වන්නට පුළුවනි. රාජ්‍ය ඇමතිතුමා හෝ මට එය පැහැදිලි කර දෙන ලෙස ඉල්ලා සිටිනවා. පත්‍රිකාවේ 5 වැනි ඡේදයෙහි මෙසේ සඳහන් වෙනවා :

......මේ වැඩ පිළිවෙළ ආරම්භ වූ විට, දෙපාර්තමේන්තුව විසින් සේවයෙහි යෙදැවී සිදුනා අඩු-දා ප්‍රදර්ශිකාවන් අන්තර්ග්‍රහණය කිරීමටද අදහස් කර තිබේ.

ප්‍රදර්ශිකාවන්ට මොනවා කරන්නට හදනවාදැයි මට මෙයින් තේරෙන්නේ නැහැ. “ සිදුනා අඩු-ද ප්‍රදර්ශිකාවන් ” යන මේ වචනවල අදහස කුමක්ද? ඔවුන් අන්තර්ග්‍රහණය කරන්නට ඕනෑලු. ගරු දහනායක ඇමතිතුමා ඒ ප්‍රදර්ශිකාවන්—

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

අන්තර්ධාන කරන්නට.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

සමහර විට මේ පාරිභාෂික ශබ්ද වගයක් යොදා තිබෙන නිසා අපට නොතේරෙනවා වන්නට ඇති. කරුණාකර රාජ්‍ය ඇමතිතුමා අපට මෙය තෝරා දෙන්න. රාජ්‍ය භාෂාව පිළිබඳව පැරණිම යෝජනාව ගරු සභාව වෙත ඉදිරිපත් කළ මන්ත්‍රීවරයා හැටියට බොහෝ අවස්ථාවල මෙම ගරු සභාවෙහිදී සඳහන් කර ඇති එතුමා අප වගේ ආධුනික හුදී ජනයන්ගේ පහන් සංවේගය සඳහා මෙය තෝරා දෙනවා ඇතැයි මා හිතනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

නැවත වරක් එය කියවන්න.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

මෙ වැඩ පිළිවෙල ආරම්භ වූ විට, දෙපාර්තමේන්තුව විසින් සේවයෙහි යෙදැවී සිදුනා අඩු-දූ ප්‍රදර්ශිකාවන් අන්තර්ග්‍රහණය කිරීමටද අදහස් කර තිබේ.

ඉංග්‍රීසියෙන් ඇති විස්තරය බලා හෝ සිංහල කොටස තේරුම් කර දෙන්න. මොනවා කළත් අපේ ගම්බදව සිටින තරුණියන් ටික අන්තර්ධාන නොවන තැනට වැඩ කළොත් ඇති. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉල්ලා ඇති මුදල් වියදම් කරන්නට අදහස් කරන්නේ කෙසේ දැයි විස්තර පත්‍රිකාවේ සඳහන් කර තිබෙනවා. එක මධ්‍යස්ථානය කට රුපියල් 1,131,50 බැගින් මධ්‍යස්ථාන 83 ට රුපියල් 93,914 ක් වියදම් වෙනවා. එක ජංගම මධ්‍යස්ථානයකට දෙන බඩු වර්ග 14 ගැනද ලැයිස්තුවේ සඳහන් වෙනවා. මා හිතන්නේ ඒ සමහර බඩු වලට වුව මනාවට වඩා මිළ යොදා තිබෙන බවයි. ලොකු කතුරකට රු. 15 කුත් හැඩ කපන කතුරකට රු. 25 කුත් ඇති රෝද තුනකට රු. 10.50 කුත් මෙහි සඳහන් කර තිබෙනව. ඒ අනුව එක ඇති රෝදයක් රු. 3.50 ක් වෙනව. යාරයෙ කෝදුවක් රු. 5 ක් බව පෙන්වා තිබෙනව. මේ හැම බඩුවකම වටිනාකම මා නොදන්න නමුත් යාරයෙ කෝදුවකට රු. 5 ක් දමා තිබීම වැඩි බව කියන්නට පුළුවනි. යාරයෙ කෝදුවකට මෙතරම් විශාල මුදලක් වියදම් වන්නෙ නෑ. යකඩ කඩයකින් වුවත් එය රු. 3.50 කට ගන්න පුළුවනි. මා විවේක ඇති වෙලාවට ටිකක් වඩු වැඩ කරන මනුෂ්‍යයෙක් නිසා ඊයෙ පෙරෙයිද වඩු උපකරණ ටිකක් මිළට ගන්න ගියා. යාරයෙ කෝදුවක් රු. 3.50 කට ගන්න මට පුළුවන් වුණා. එහෙත් මෙම යෝජනාවෙහි යාරයෙ කෝදුවකට රු. 5 ක් දමා තිබෙන්නෙ එය ආණ්ඩුවේ මධ්‍යස්ථානයකට ගන්නට අදහස් කරන නිසා දැයි මම දන්නෙ නෑ. යකඩ බඩු විකුණන මුදලාලි කෙනකු යාරයෙ කෝදුවක් සාමාන්‍ය කෙනකුට රු. 3.50 කට විකුණනව නම්, එය ඊට වඩා අඩු මිළ කට ටෙන්ඩර් මගින් ලබා ගන්නට ආණ්ඩුවට පුළුවන්කම තිබිය යුතුයි. එහෙත් යෝජනා කර තිබෙන මුදල් ලැයිස්තුව අනුව පෙනෙන්නෙ එය රු. 5 කට මිළකර තිබෙන බවයි. අනෙක් බඩු සඳහාත් ඒ විධියට මිළ ගණන් සඳහන් කර තිබෙනව නම්, එයින් පෙනෙන්නෙ ටිකක් අත වැඩියෙන් ඇස්තමේන්තු හදා තිබෙන බවයි.

**වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාතන්** (නල්ලූර්)
(டொக்டர் ஈ. எம். வி. நாகநாதன்—நல்லூர்)
(Dr. E. M. V. Naganathan—Nallur)

What is your tender ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

දොස්තර මහත්මය මොකද කිව්වෙ ?

**වෛද්‍යාචාර්ය නාගනාතන්**
(டொக்டர் நாகநாதன்)
(Dr. Naganathan)

We shall give you the contract. We want your estimate.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

මම ඔය කෝදු විකුණන වෙළෙන්දෙක් නෙමෙයි. මම කිව්වේ සති දෙකකට පමණ කලින්—[බාධා කිරීමක්]

**එම්. සිවසිතම්පරම් මයා.**
(திரு. எம். சிவசிதம்பரம்)
(Mr. M. Sivasithamparam)

Are you sure it is 36 inches long ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ඒ කෝදුව ගෙනත් තමුන්නාන්සෙගෙ උස මැනල පෙන්නන්න මට පුළුවනි.

ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා විසින් මේ සභාවට ඉදිරිපත් කරන ලද යෝජනා අතුරින් මේ යෝජනාව මා ඉතා මත් කැමැත්තෙන් අනුමත කරන එකක්. බොහෝ අවස්ථාවලදී අපේ රටේ සල්ලි වියදම් වන්නෙ මේවගෙ ගම්බද දේශීය කර්මාන්ත දියුණු කිරීමට නොවෙයි. නේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වතුවලට වැඩිපුර ආධාර දී තේ පඳුරු වලින් වැඩිපුර දළු කඩාගෙන ඒ මගින් විදේශ විනිමය ඉපයීමේ චේතනාව අනුවයි අපේ ආර්ථික විශෙෂඥයන්ගෙන් ආණ්ඩුවට උපදෙස් ලැබෙන්නෙ. එහෙත්, අපේ ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා තතන තතනා වුවත් යෝජනා කරන මෙවැනි දේවලින්, කෝටි ගණනක විදේශ විනිමයක් ඉතිරි නූනත් මේ රටේ මිනිසුන්ට එක්තරා විධියක රක්ෂා ලැබෙනව. ඒ නිසා විදේශීන්ට දත නියවන්නෙ නැතිව ජීවත් විය හැකි මාර්ග පාදා ගන්න පුළුවන් වෙනව. අපේ තරුණ තරුණියන් මැහුම් කර්මාන්තය ඉගෙන ගත් පලියටම එය සිදු නූනත්, ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා යෝජනා කරන මේ රෙදි විවීමේ මධ්‍යස්ථානත් ජංගම මැහුම් මධ්‍යස්ථානත් නිසා, නිකරුණේ කම්මැලිකමින් කාලය ගත කරණ තරුණ තරුණියන්ට ප්‍රයෝජනයක් සැලසෙන අතරම එක්තරා විධියක ජාතික සේවයකුත් සිදුවෙනව. මෙය ආණ්ඩුවට ආර්ථික සංවර්ධනය සම්බන්ධයෙන් උපදෙස් දෙන විශේෂඥයන්ගේ අනුමැතිය ලැබෙන යෝජනාවක් නොවන්නට පුළුවනි. මෙයින් විදේශීය ධනය ඉපයෙන්නෙ නැතැයි ඔවුන් කියාවි. මුදල් ඉතිරි නොවෙනවාය කියන්නත් පුළුවනි. ඒ නිසා මේවා වැදගැම්මකට නැති වැඩයයි කියන්නත් පුළුවනි. එහෙත් විදේශීය ධනය හම්බ කරන්න ඉදිරිපත් කරන යෝජනා රාශියකින්ම සිදු වන්නේ විදේශීය අධිරාජ්‍යවාදී රටවලට අපේ තිබෙන ගැතිකම තව තවත් තහවුරු වන මාර්ගයන් පාදා ගැනීමයි. අන්න ඒ නිසා තමයි, තේ කර්මාන්තයට ආධාර දෙන යෝජනාවකට වඩා—තේ වතුවලට වැඩිපුර පෝර දමා තේ දලු වැඩිපුර නිපදවන්න ආධාර කළ යුතුය කියන යෝජනාවකට වඩා—ගම්බද රැකීරක්ෂා හිඟය නැති කරන මෙවැනි යෝජනාවකට මා සන්තෝෂයෙන්ම ආධාර කරන්නෙ; මගේ අනුමැතිය දෙන්නෙ.

අ. භා. 4.44

ටී. බී. එම්. හේරත් මයා. (වලපනේ)
(திரு. ரி. பி. எம். ஹேரத்—வலப்பனை)
(Mr. T. B. M. Herath—Walapane)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ග්‍රාම සංවර්ධන අංශය යටතේ ඇති කරන්නට යන මැහුම් පුහුණු කිරීමේ මධ්‍යස්ථානවලට මුදල් ලබා ගැනීමට යෝජනාවක් ඉදිරිපත් කර ඇති මේ අවස්ථාවේදී මා විශේෂයෙන් සඳහන් කළ යුතුයි දැනටමත් මෙවැනි මධ්‍යස්ථාන සෑහෙන සංඛ්‍යාවක් දිවයිනේ තැන් තැන්වල පිහිටුවා තිබෙන බව. ඒවායින් ඇත්ත වශයෙන්ම මැහුම් වැඩ ඉගෙනීමේ ආශාවක් දක්වන ගැහැණු ළමයින්ට අල්ප වශයෙනුයි ප්‍රයෝජනය ලැබෙන්නෙ. එවැනි තත්ත්වයක් පවතින්නේ ඒවාට ලබා දී තිබෙන පහසුකම්වල තිබෙන අප්‍රාණවත්කම නිසයි.

සුළු වේතනයක් ලබන මැහුම් ගුරුවරියන් සමහර විට ගම්බද කොට්ඨාශවලට පත් කර යවනු ලබන බව මා දන්නව. මැහුම් ඉගෙනීමට කැමති ගැහැණු ළමයින් තෝරාගෙන ඊළඟට ඒ කොට්ඨාශවල මධ්‍යස්ථාන ආරම්භ කරනව. එහෙත් එවැනි මධ්‍යස්ථාන සාර්ථක ලෙස පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ඉඩකඩ, උපකරණ ගොඩනැගිලි, වෙනත් පහසුකම් ආදිය ඒ මධ්‍යස්ථානවලට ලැබෙන්නෙ බොහොම කලාතුරකිනුයි. මේ නිසා ඒ මධ්‍යස්ථාන බොහොමයක් මහජනයාට එපා වන තත්වයට තිබෙන බව මා දන්නව. මෙවැනි මධ්‍යස්ථාන ඇති කිරීමේදීත්, ඒවා පාලනය කරගෙන යාමේදීත් පසුගිය කාලයේ දී ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව ගෙන ගිය වැඩ පිළිවෙල ඇත්ත වශයෙන්ම දුර්වල බව සඳහන් කරන්න පුළුවන්කම තිබෙනව.

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යන්නෙ මැහුම් පුහුණු කිරීමේ මධ්‍යස්ථාන පමණක් නොවෙයි. වඩුවන් පුහුණු කිරීම, මැටි කර්මාන්ත කරුවන් පුහුණු කිරීම ආදිය සඳහාත් එම දෙපාර්තමේන්තුව මධ්‍යස්ථාන පවත්වනව. එහෙත් මේ මධ්‍යස්ථාන බොහොමයකින්ම ලැබෙන ප්‍රයෝජනය අල්ප බවට ස්වල්ප බවට පත්වෙලායි තිබෙන්නෙ. එසේ වීමට හේතුව ඒවා සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තියේ යම්යම් වැරදියි. මේ කාරණය උදාහරණයකින්—නිදර්ශනයකින්—පැහැදිලි කරන්න පුළුවනි. වඩු කර්මාන්ත ශාලාවක් ඉදි කළාම වඩු වැඩ පුහුණු වීමට කැමති ළමයින් තෝරා ඒවාට ඇතුළු කර ගන්නව. ඔවුන්ට වඩු වැඩ උගන්වන්නට තිබෙන ක්‍රමය කුමක්ද? රජයේ



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩී. බී. එම්. හේරත් මයා.]

යම් දෙපාර්තමේන්තුවකට නැත්නම් ශාඛ ශාලාවකට ලී බඩු සපයන්න කොන්ත්‍රාත් ලැබෙනව මේ මධ්‍යස්ථානවලට. කිසිම දැනුමක් තේරුමක් පුහුණුවක් නොලබා මේ මධ්‍යස්ථානවලින් පිට වන්නටයි ඒවාට ඇතුළත් වන ළමයින්ට අන්තිමේදී සිදු වන්නෙ. ඒ කොහොමද? බොහෝ විට ළමයින්ට ඒ වැඩ කරන්න ලැබෙන්නෙ නැහැ. මධ්‍යස්ථානය භාර ගුරුවරයායි ඒ වැඩ කොටස කරන්නෙ. මධ්‍යසථානයේ හදන බඩු ප්‍රමාණයටයි මුදල් ලැබෙන්නෙ. වඩු වැඩ දන්න මිනිසුන්ගෙ උදව් ලබාගෙන ගුරුවරයා ඒ කොන්ත්‍රාත්තුවට අවශ්‍ය බඩු සාදනව. ළමයින්ට වැඩ කරන්න ඉඩ දෙන්නෙ නැහැ. ඒ නිසා ඔවුන්ට වැඩ ඉගෙන ගන්න ලැබෙන්නෙත් නැහැ. අන්තිමට මොකක්ද සිද්ධ වෙන්නෙ? වඩු වැඩ ඉගෙන ගැනීමට අර ළමයා තුළ කොතරම් ආශාවක් තිබුණත් ඒ වැඩේ ඉගෙනගැනීමට ඒ ළමයට ඉඩක් ලැබෙන්නේ නැහැ. ඒ මොකක්ද? ඒ බඩුව නරක් වේවිය, ඒ නිසා කොන්ත්‍රාත්කරුවා ඒ බඩුව නොගනීය කියන ප්‍රශ්නය උඩ ළමයා අතින් ඒ වැඩ කරන්න ඉඩක් දෙන්නෙ නැහැ. සුමාන දෙකකින් නැත්නම් මාසෙකින් පුහුණු වන්නට පුළුවන් කර්මාන්තය සඳහා අවුරුදු හත අටක් ගත කිරීමට ඒ ළමයට සිද්ධ වෙනව. අන්තිමේදී වැඩෙත් එපා වෙනව. ඒ විධියට එපා වී අත් හැර ගිය ළමයි දහස් ගණනක් මේ රටේ ඉන්නව. ඒ ගැන යම් යම් පරීක්ෂණ කළ කෙනෙක් හැටියටයි මම මේ කාරණා ඉදිරිපත් කරන්නෙ. එම නිසා මේ ක්‍රමය සම්පූර්ණයෙන්ම අසාර්ථක ක්‍රමයක් බවට පත් වී තිබෙනව.

එක පැත්තකින් කම්කරු දෙපාර්තමේන්තුව කර්මාන්ත පුහුණු කරනව. අනික් පැත්තෙන් ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව කර්මාන්ත පුහුණු කරනව. තමුන්නාන්සේ දන්නවා ඇති නියෝජ්‍ය සභාපතිතුමනි, කර්මාන්ත දෙපාර්තමේන්තුව වඩු වැඩ හෝ මේසන් වැඩ හෝ මැහුම් වැඩ හෝ මොන වැඩක් හෝ පුහුණු කරනවා නම් ඒ ළමයෙකුට දිනකට රුපියල් දෙක බැගින් දීමනාවක් ඒ පුහුණුවන කාලය තුළ දෙන බව. එසේ පුහුණු කර සහතිකයකුත් දී වෙනත් තැනක රක්ෂාවක් කිරීමේ අවසථාවක් සලසා දෙනවා. එහෙත් මේ ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙ පුහුණු කිරීම්වලින් ඒ කිසිවක් ඉටු වන්නෙ නැහැ. ඒ කිසිවක් නොකර ගුරුවරයෙක් පමණක් පත් කර මධ්‍යසථාන පිහිටුවනව. අන්තිමට සිදු වන්නේ මෙම ව්‍යාපාරය සුදු අලියෙක් බවට පත්වීමයි. සම්පූර්ණයෙන්ම මුදල් අපතේ යනව. ඒවායේ අමුද්‍රව්‍ය හොරු ගන්නව. කිසිම වැඩක් කෙරෙන්නේ නැහැ.

මෙම කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් මධ්‍යසථාන පිහිටුවා වඩු කර්මාන්තය, මැහුම් කර්මාන්තය ආදි නොයෙකුත් කර්මාන්ත පුහුණු කරවීම සඳහා පසු ගිය අවුරුදු ගණනාව තුළ ආණ්ඩුවෙන් වැය කර ඇති මුදල, පුහුණු වී ඇති පුද්ගලයන්ගේ සංඛ්‍යාව, ආදී කරුණු ගැන පරීක්ෂා කිරීමට කොමිසමක් පත් කළොත් මෙය රටේ මුදල් ඉතාම කනගාටුදායක අන්දමින් විනාශ කර තිබෙන ව්‍යාපාරයක් බව පැහැදිලිව පෙනී යනවා ඇති.

මේ විධියේ මැහුම් මධ්‍යසථාන වැඩි වැඩියෙන් පිහිටුවීම ගැන අපි කොහෙත්ම විරුද්ධ වන්නෙ නැහැ. එහෙත් මේවායේ ඇති අඩුපාඩුකම් දුර්වලකම් අනුක්‍රමයෙන් සකස් කරන්න ඕනැ. එසේ අඩුපාඩු සාදා වැඩි වැඩියෙන් ආරම්භ කරන්න. මධ්‍යස්ථාන පිහිටුවීමෙන් පමණක් ආණ්ඩුව බලාපොරොත්තු වන දේ ඉටු වන්නෙ නැති බව මේ සභාවේදී මම මතක් කරන්න කැමතියි. මේ විධියට මධ්‍යසථාන පිහිටුවීම යම් කිසි පිරිසකට රැකීරක්ෂා ලබා දීමේ හෝ තමන්ට ඕනැ කරන පිරිසක් සන්තෝෂ කිරීමේ හෝ අදහසින් කරන දෙයක් නම් එය සාර්ථක ක්‍රමයක් නොවෙයි.

අපි හොඳින්ම දන්නවා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ඇති රෙදි වියන මධ්‍යසථාන ගැන. රටේ සෑම තැනකම සෑම ආසනවලම ඒව පිහිටුවාගෙන යනව. සමහර ආසනවල පිහිටුවා විවෘත කර තිබෙනව. එම මධ්‍යසථානවල දැනට සිද්ධ වන්නේ මොකක්ද? ඒ මධ්‍යසථාන වලට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ළමයින් ඇතුළත් කරගන්නෙ කොහොමද? මම දන්නව, මගේ ආසනයෙ සිදු වන දේ ගැන. ඒ මධ්‍යස්ථානයට ඇතුළත් වෙන්න පුළුවන්කම ඇත්තේ එක්සත් ජාතික පක්ෂයේ පරාජිත අපේක්ෂකයාගෙන් ලියුමක් අරන් ගියොත් පමණයි. මම එය කෙළින්ම කියනවා. නිලධාරීන් ළමයින් හරවා යවනවා රාමනායක මහතාගෙන් ලියමනක් ගේන්නය කියා. එම නිසා මේ විධියෙ මැහුම් මධ්‍යස්ථාන පිහිටුවන්න බලාපොරොත්තු වන්නේ එවැනි තත්ත්වයකින් කටයුතු කිරීමට නම් අපි ප්‍රකාශ කරනවා, මේ රටේ මහජනතාවගේ මුදල් ආණ්ඩු කරන පක්ෂයේ දැවැද්දට අයිති මුදල් නොවේය කියා. ඒ මුදල් කාටත් අයිති මුදල්. ඒ නිසා මැහුම් මධ්‍යස්ථාන සඳහා හෝ වේවා, වෙන මොන මධ්‍යස්ථාන සඳහා හෝ වේවා ළමයින් තෝරනවා නම් ඉල්ලුම් පත්‍ර කැඳවා සුදුසු අය තෝරාගන්නය කියා අපි මතක් කරන්න කැමතියි.

මේ ආණ්ඩු පක්ෂයේ සිටින සමහර මන්ත්‍රීවරුන් එදා මේ පැත්තෙ ඉඳගෙන අපට ගල් ගැසුව ශිෂ්‍ය ගුරුවරුන් පත් කිරීමේදී ඇමතිවරුන් සහ මන්ත්‍රීවරුන් අත ගහනවාය, ඒ පත් කිරීම් යුක්ති සහගත විධියට කරන්නෙ නැත්තෙ ඇයි කියා. ඒ පිළිබඳව විශාල උද්ඝෝෂණයක් කළා. එයට පිළිතුරු වශයෙන් කළුගල්ල ඇමතිතුමා එදා කිව්ව, එක ලකුණක්වත් වෙනස් කර තිබෙන බව ඔප්පු කළොත් තමා ඇමතිකමින් අස් වී පිට වෙනවාය කියා. අපි එදා එක ආසනයකට 75 දෙනා බැගින් යුක්තිසහගතව, මධ්‍යස්ථව, පක්ෂ භජනයෙන් තොරව ශිෂ්‍ය ගුරුවරුන් වශයෙන් 10,000 කට පත් වීම් ලබා දුන්න. එහෙත් අද සිදු වී තිබෙන්නේ මොකක්ද? අද පත්වීම් දෙන්නේ කෙලින්ම මන්ත්‍රීවරයාගේ තුණ්ඩුව උඩයි. මගේ කොට්ඨාශයේ අද වන තුරු ශිෂ්‍ය ගුරු පත්වීම් දී නැහැ. හේතුව මේකයි: විසි දෙනෙකුට පත්වීම් දෙනවලු. එහෙත් විභාගයෙන් සමත් වී සිටින්නේ 17 දෙනෙයි. ඒ සමත් වී සිටින 17 දෙනාම විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීන්ට ලැදි අය. ඒ නිසා පත්වීම් කරන්නට ක්‍රමයක් නැහැ. ලංකාවේ හැම තැනකම ශිෂ්‍ය ගුරු පත්වීම් දීලා ඉවරයි. එහෙත් මගේ කොට්ඨාශයේ පමණක් දුන්නෙ නැහැ. අන්න අරකයි හේතුව. මේ විධියට කටයුතු කරන්න නම් මේවා සඳහා මහජන මුදල් යොදවන්නය කියා කියන්න අපට බැහැ. දක්ෂකම් තිබෙන අය තෝරාගෙන පක්ෂ ගැන නොසලකා යුක්තිසහගතව මධ්‍යස්ථව මෙවැනි පත්වීම් කරන්නට ඕනෑ.

මගේ කොට්ඨාශයේ තිබෙන හරස්බැද්ද කියන රෙදි වියන මධ්‍යස්ථානයේ අර්බුදයක් තිබෙනව. එයට ළමයින් තේරුවේ අර තුණ්ඩු ක්‍රමයට. ග්‍රාම සංවර්ධන සමිතියෙ සභාපති මහත්මය කියනව ඒ අය යුක්තිසහගතව තෝරන තුරු ගොඩනැගිල්ලේ යතුර දෙන්නේ නැත කියල. ඒ නිසා ඒ මධ්‍යස්ථානය විවෘත කරන්න බැරි වී තිබෙනව. මේ වැඩ කරන්නේ තම තමන්ගේ දේශපාලන අතකොළු වශයෙන් සිටින අය මෙවාට රිංගවීමට නම් මෙවැනි දේ සඳහා අපේ ඡන්දය පාවිච්චි කරන්න අපට පුළුවන්කමක් නැහැ. මහජන කියන වචනයට නින්දා කරන්න එපාය කියා අපි මේ රජයට කියනවා. යමක් මහජන නම් ඒවා තම තමන්ට පන්දම් අල්ලන අයට පමණක් සීමා කිරීම වැරදියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේ විරුද්ධ පාර්ශ්වයේ සිටියදී තමුන්නාන්සේගේ ආසනයේ ශිෂ්‍ය ගුරු පත්වීම් 75 දුන්නේ කොයි ආකාරයටද කියා තමුන්නාන්සේ දන්නවා ඇති. එදා පැවැති ආණ්ඩුව ගත් ඒ මධ්‍යස්ථ ක්‍රියා මාර්ගය ගැන තමුන්නාන්සේටත් ආඩම්බර වන්නට පුළුවන්. එහෙත් අද විරුද්ධ පාර්ශ්වයේ සිටින මන්ත්‍රීවරුන් වශයෙන් අපට සිදු වී තිබෙන්නේ මොකක්ද? අපේ පළාත් වලට යන්නවත් අපට ක්‍රමයක් නැහැ. මොකක් සඳහා තේරීමක් කළත් තෝරනු ලබන්නේ ලියුම් අරගෙන යන අය පමණයි. ඒ සඳහා සාක්ෂි වශයෙන් මා ළඟ ලියකියවිලි තිබෙනව. වෙනත් අවස්ථාවකදී ඒවා ඉදිරිපත් කිරීමට මා බලාපොරොත්තු වෙනව.

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් දිස්ත්‍රික්ක අනුව රෙදි වියන ගුරුවරියන් තේරුව. එහෙත් මගේ කොට්ඨාශයේ සිටි, රෙදි වීවීමේ ගුරුවරියන් වශයෙන් පත්වීමට සුදුසුකම් ලත් අයට ඒවා ලැබුණේ නැහැ. එයට හේතුව ඔවුන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල

[ටී. බී. එම්. හේරත් මයා.]

විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීන්ට ලැදි අය වීමයි. සුදුසුකම් ලැබූ මගේ කොට්ඨාශයේ අයගේ ඉල්ලීම් ගැන නොසලකා ඒ වෙනුවට පිට පළාත්වලින් පත්වීම් කර තිබෙනව. එහෙත් ප්‍රජාතන්ත්‍රවාදය ගැනත් මධ්‍යස්ථ භාවය ගැනත් වේදිකා පුපුරන්නට කැගහනව. තවත් යම්කිසි කාලයක් තමුන්නාන්සේලා ඔය පැත්තට වී ඉන්නවා ඇති. සමහරවිට නියමිත කාලයටත් වැඩියෙන් ඉන්නට උත්සාහ කරාවි.

ගරු මන්ත්‍රීවරයෙක්
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
එහෙම අදහසක් නැහැ.

ටී. බී. එම්. හේරත් මයා.
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
තමුන්නාන්සේ නැහැ කියන්නෙ නොදන්නා නිසයි. කැබිනට් කුඩුව කියා පුදුම සතුන්ගෙ කුඩුවක් තිබෙනව. තමුන්නාන්සෙ ඒක ඇතුළේ නැහැ. ඒ නිසා තමුන්නාන්සෙගෙත්, මගෙත් දැනීමේ වෙනසක් නැහැ. සමහරවිට ගරු රාජ්‍ය ඇමතිතුමා අපට වඩා ඔව ගැන දන්නවා ඇති.

මා කියන්නේ මේකයි: මොන ආණ්ඩුව ආවත් මහජනයාට සාධාරණයත්, යුක්තියත් ඉටු වෙන්න ඕනෑ. මැහුම් මධ්‍යස්ථානයකට ළමයකු තෝරන්න ගිය විටත් තමන්ගේ පක්ෂයට වැඩ කළ අයගෙන් පමණක් තෝරනවා නම්, රෙදි වියන මධ්‍යස්ථානයකට ළමයකු තෝරන්න ගිය විට තම පක්ෂයේ ඡන්ද අපේක්ෂකයාගෙන් ලියමනක් ගෙනෙන්න කියනවා නම්, තමන්ගේ දක්ෂතාවය අනුව යම් ළමයකු ශිෂ්‍ය ගුරු විභාගයෙන් සමත් වූ විට "උඹට පත්වීමක් ඕනෑ නම් පරාජය වූ ඡන්දඅපේක්ෂකයාගෙන් ලියමනක් අරගෙන වරෙන්" කියා නිලධාරීන් ලවා කියවනවා නම්, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයක් ඉතිරි වන්නේ කොහොමද? එහෙම නම් මහජනතාවට යුක්තිය ඉටුවන්නේ කොහොමද? කටයුතු කරන්නේ ඒ අන්දමට නම් තමුන්නාන්සේලාගේ එක්සත් ජාතික පක්ෂයේ උදවියගෙන් පමණක් තමුන්නාන්සේලා බදු අය කරන්න. අනික් අයට සාධාරණයත්, යුක්තියත් ඉටු නොකරනවා නම් ඔවුන්ගෙන් බදු ගන්නත් එපා. අනික් අයගෙනුත් බදු අය කරනවා නම් ඔවුන්ටත් සාධාරණයත් යුක්තියත් ඉටු කිරීමට තමුන්නාන්සේලා බැඳී සිටිනව. ඒ නිසා මෙවැනි අයුක්තිසහගත අසාධාරණ ක්‍රියාවන් කරන්නට එපාය කියා අපි තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනව.

අපේ ආණ්ඩුව කාලයේ අපි මේ මේ දේවල් කළාය කියා පසුගිය කාලයේ තමුන්නාන්සේලා නොයෙකුත් දේවල් කියා තිබෙනව. එහෙත් අද එක පත්වීමක්වත් විරුද්ධ පාර්ශවයේ මන්ත්‍රීන්ට ලැදි කෙනෙකුට දෙන්නෙ නැහැ. එකක්වත් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීන්ට ලැදි කෙනෙකුට දුන්නා නම් අපි කියනව විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීන්ට ලැදි අයටත් දුන්නය කියල. එහෙත් දැන් සිදු වෙන්නෙ ඇබෑර්තු 10ක් තිබෙනවා නම් ඒ දහයම තුණ්ඩු ගෙන යන අයට දීමයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ කාලයෙදි ලංගමයට මම දුන්නු ලියමනකට උත්තරයක් එවා තිබෙනව, "අසුවල් පුද්ගලයා—ජී. ඩබ්ලිව්. ආරියසේන—අට පාස් කරල නැහැ. පාස් කරල තියෙන්නෙ හතයි. ඔහුගේ පාඨශාලා සුදුසුකම නැති නිසා ඔහුට පත්වීමක් දෙන්නෙ නැහැ" කියා. ඒ ලියුම මා ළඟ තිබෙනව. නමුත් එයා නැවත ඉස්කෝලෙ ගියෙ නැහැ, දැන් පත්වීමක් දීල තියෙනව. එස්. එස්. සී. පාස් වුණු උදවිය සම්මුඛ පරීක්ෂණවලටවත් අඩ ගහල නැහැ.

තමුන්නාන්සේලා දැන් ගොවි හමුදාවක් හදාගෙන යනව. පසුගිය සතියේ රාමනායක මහත්මයා ඒ ලැයිස්තුත් අරගෙන ගිහින් සංචාරක බංගලාවේ තබාගෙන එක්සත් ජාතික පක්ෂයේ ගම්වල නියෝජිතයන් ගෙන්වල එක් එක් ඉල්ලුම්කරුවන්ගෙ තොරතුරු අහල ඉල්ලුම් කර තිබුණු විරුද්ධ පක්ෂයේ මිනිසුන්ගෙ නම් ඔක්කොම කපා දැම්ම. ඒ ගොල්ලන්ගෙ බටගොයි හමුදාවෙ නම් ටික විතරයි ඉතුරු කරගෙන ගියේ. බටගොයි හමුදාවෙ අයගේ නම් විතරක් අරන් ගිහින් ඒ අයට සම්මුඛ පරීක්ෂණවලට කථා කළා. තමුන්නාන්සේල ආහාර අතින් මේ රට ස්වයංපෝෂිත කරන්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල

යන්නෙ තමුන්නාන්සේලාට පත්දම් අල්ලන පිරිස පමණක් ගොවි හමුදාවට බඳවා ගෙන ද? ඇයි අනික් අයට ගොවි තැන් කරන්ට බැරිද? ඒ මිනිස්සු රතු ලූනු වැව්වොත් වැවෙන්නේ නැද්ද? මොකක්ද තමුන්නාන්සේලාගේ මේ ප්‍රතිපත්තිය ? අපි මේ ප්‍රතිපත්තිය මොකක් දැයි ප්‍රසිද්ධියේ අහනව. හැම එකක්ම ඉතාම කැත විධියටයි කරන්නෙ. කෙළින්ම කියන්න " අපි ප්‍රජාතන්ත්‍රවාදි නැහැ. අපි අපේ පාක්ෂිකයන්ට පමණයි " කියා. බොරු නොකියා එහෙම කියනව නම් අපි භාර ගන්නම්. එතකොට අපි රටට කියන්නම්, ඒ ගොල්ලන් කරන්නෙ ඒ අයගේ පක්ෂයේ උදවියට විතරයි කියා. එහෙම නැත්නම් ඒ අය අපෙන් ප්‍රශ්න කරනව, " තමුන්නාන්සෙ තමයි වලපනේ මන්ත්‍රී. ඇයි මේ අයුක්ත? මම එච්. එස්. සී. පාස් කරල තිබෙද්දි මට සම්මුඛ පරීක්ෂණයටවත් කථා කළේ නැහැ. හතවත් පාස් නොකළ උදවියට පත්වීම් දී තිබෙනව " කියා. පාර්ලිමේන්තුවේ මේ වගේ කාරණයක් ගැන ප්‍රශ්නයක් ඇහුවාම 6 මාසයක් කල් ඉල්ලනව. මොකක්ද මේකෙ තේරුම ? ලංගමය ගැන නොවෙයි මම කියන්නෙ ; ළමයින් මේ ආයතනවලට තෝරා ගැනීමේ ප්‍රතිපත්තිය ගැනයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මැහුම් විද්‍යාලවලට ළමයින් තෝරා ගන්නෙත් මා කලින් සඳහන් කළ ප්‍රතිපත්තිය උඩයි. ප්‍රතිපත්තිය මේක නම් තමුන්නාන්සේල මැහුම් මධ්‍යස්ථාන ඉදි කරනවාට අපි විරුඬ විය යුතුයි. ම හුම් මධ්‍යස්ථානවලට ළමයින් තෝරා ගත් හැටි මම කියන්නම්. [බාධා කිරීමක්] බේරුවල මන්ත්‍රීතුමාට (අබ්දුල් බකීර් මාකර් මයා.) නම් සිංහල තේරෙන්නෙ නැතුව ඇති. [බාධා කිරීම්] තවත් උපමා උදාහරණ තියෙනව, නොයෙක් ඒව. තමුන්නාන්සේලාගේ භාෂාවට වැඩිය සිංහල භාෂාව බොහොම පෝෂණය වෙච්ච භාෂාවක්—[බාධා කිරීමක්] තමුන්නාන්සේලාගේ භාෂාව අරාබි භාෂාව නේ ද? [බාධා කිරීමක්] දෙමළ භාෂාව නොවෙයි. දෙමළ භාෂාව ගැන නම් මම ඒ තරම් කර්ක කරන්නෙ නැහැ.

නියෝජ්‍ය සභාපතිතුමනි, මැහුම් මධ්‍යස්ථාන ඇති කරනවා කියා බෝඩ් ලෑල්ලක් ගහල හරි යන්නෙ නැහැ. ඒවාට හොඩ නැගිලි තිබෙන්ට ඕනැ. සුදුසුකම් ඇති ගුරුවරුන් තෝර ගන්ට ඕනැ. කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව භාර ඇමතිතුමා මේ සථානයේ දැන් නැහැ. මා එතුමාගෙන් ඉල්ලා සිටිනව, අද මැහුම් ගුරුවරියන් වශයෙන් යම් තරමක් සිටිනව නම් ඒ අයගේ අධ්‍යාපන සුදුසුකම් ලැයිස්තුවක් මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න කියා. මැහුම් විෂයයෙන් ඉතාම උසස් අධ්‍යාපනයක් ලබාගෙන ජ්‍යෙෂඨයන් සමත් වුණු උදවිය අද රක්ෂා නැතිව සිටිනව. මැහුම් ගුරුවරුන් තෝරාගෙන තිබෙන්නෙ කිසිම ප්‍රතිපත්තියක් නැතිවයි. හය හතවත් සමත් නොවුණු උදවිය මැහුම් ගුරුවරුන් හැටියට සිටින බව මා දන්නව. පොඩි පත්දමක් අල්ලුවාම පත්වීමක් ලැබෙනව. මම අහන්නෙ, මෙහෙමද මේවා කළ යුත්තේ, කියායි. හොඳ වැටුප් ක්‍රමයක් සකස් කරල, හොඳ අධ්‍යාපනයක් ලබාගත් උදවිය මොන පක්ෂයේ වුණත් මේ තනතුරුවලට පත් කරන්ට ඕනැ. ඊට පසු ඔවුන් ආණ්ඩුවේ සේවකයන් බවට පත් වෙයි. මේ රටේ නීතියේ හැටියට ආණ්ඩුවේ සේවකයන් මධ්‍යස්ථ විය යුතුයි. එවිට ඒ අය මධ්‍යසථව ඒ අයගේ සේවය කරයි. කෙරුවෙ නැත්නම් දඬුවම් කිරීම වෙන ප්‍රශ්නයක්. නමුත් ඇතුළට ගන්ට පෙර දඬුවම් කරන එකයි වරද. එම තත්ත්වය නැති කිරීමටයි අපි මෙතරම් තමුන්නාන්සෙල ඉදිරියෙ කතා කරන්නෙ. මේ මැහුම් මධ්‍යසථාන විවෘත කරන වට අපේ විරුද්ධතාවයක් නැහැ. සුදුසු ගොඩනැගිලි, අවශ්‍ය උපකරණ සහ අවශ්‍ය ගුරුවරුන් සහිතවයි එය කළ යුත්තෙ. ඒවගෙම දේශපාලන බලපෑම්වලින් තොරව එය කරන්ට ඕනැ. එසේ කළොත් පමණයි අපි බලාපොරොත්තු වන සේවය ඉටු වන්නෙ. මන්ත්‍රීකම් නොලත්, මන්ත්‍රීකම්වලින් පරාජය වෙච්ච, තව විධියකින් කියනව නම් එක්වරක් මහජනය අතින් ප්‍රතික්ෂේප වුණු අනික් වර උසාවියෙන් එළවා දැමූ පුද්ගලයන් කෙරෙහි විශ්වාසය තබාගෙන මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය රකින්ට තමුන්නාන්සෙල උත්සාහ කරනව නම් ඒ වෙනුවෙන් අපේ ප්‍රබල කනගාටුව තරයේම තමුන්නාන්සෙල ඉදිරියෙහි අනතුරු හැඟවීමක් සහිතව ප්‍රකාශ කරමින්, එක් ඉල්ලීමක් කරනව. තමුන්නාන්සෙලගෙ රැකී රක්ෂා දීමේ නිත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

දින, කැන ප්‍රතිපත්ති වහාම නවත්වා යුක්ති සහගත පරිදි අවංකව, මධ්‍යස්ථව අපේ පුරවැසියන්ගෙ සුදුසුකම්වලට අනුව මේ රටේ රැකීරක්ෂා සැපයීමේ ප්‍රතිපත්තියක් ඇති කරන්ටය කියා රජයට අවවාද කරමින් මගේ වචන සවල්පය අවසාන කරනව.

අ. භා. 5.5

**බර්නාඩ් සොයිසා මයා.** (දකුණු කොළඹ)
*(திரு. பெர்னாட் சொய்ஸா—கொழும்புத் தெற்கு)*
(Mr. Bernard Soysa—Colombo South)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මැහුම් සම්බන්ධයෙන් කථා කළ යුතු පාර්ශ්වයට අයිති ගරු මන්ත්‍රිනියක් මෙම ප්‍රශ්නය ගැන කතා නොකරන නිසා ඒ අඩුපාඩුව පිරිමැසීමෙ පිළිවෙලක් වශයෙන් මේ පිළිබඳව අද දවසෙ ගරු මන්ත්‍රීවරුන් කීප දෙනෙක් කථා පවත්වන්ට අදහස් කරන බව පේනව. මා මෙම ප්‍රශ්නය ගැන කතා කරන්නට බලාපොරොත්තු වන්නෙ වෙන කරුණක් නිසා නොවෙයි, මෙම මුදල් වෙන් කිරීමෙදි අප විසින් දැනගත යුතුව ඇති කරුණු මෙහි සඳහන් කර නැති නිසයි. මෙතන පුහුණු කිරීමෙ ගුරුවරුන්ට ගෙවන පඩිය කීයද කියා නැහැ. ඒ අන්දමට 23 දෙනෙක් පත් කරන්ට බලාපොරොත්තු වෙනව. ඊට වඩා පල්ලෙහා තත්ත්වයෙන් 80 ගණනක් පත් කරන්ට බලාපොරොත්තු වෙනව. මේ කෙනෙකුගෙ පඩිය කීයද ?

**වෛද්‍යාචාර්ය නාගනාතන්**
*(டொக்டர் நாகநாதன்)*
(Dr. Naganathan)

What about the Gazette notification ? It says Rs. 171.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Have you become a Minister now ?

**ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)
*(திரு. ரீ. பி. தென்னகோன்—தம்புள்ள)*
(Mr. T. B. Tennekoon—Dambulla)

එයා දන්නෙ නැති එකක් නැහැ. ජාතියෙ දෙස්තර.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

නල්ලූර්හි ගරු මන්ත්‍රීතුමාට (වෛද්‍යාචාර්ය නාගනාතන්) මා ස්තුතිවන්ත වෙනව මේ කරුණු ඉදිරිපත් කළාට. ඇයි මෙම සේවකයන්ට අඩු පඩි ගෙවන්නෙ ? කොළඹ නගරයෙ දැනට මෙවැනි මධ්‍යස්ථාන කීපයක් තිබෙනව. ඒ තිබෙන ඒව හැර දැන් මේ යෝජනාවෙ හැටියට ගරු රාජ්‍ය ඇමතිතුමාටත් මටත්—අපේ කොට්ඨාශයට—දෙකක් දෙන්ට යන බව පෙනෙනව. හැබැයි, කොළඹ නගර සභාව මගින් දැනටම පාලනය කරන මධ්‍යස්ථාන කීපයක්ම කොළඹ නගරයෙ තිබෙනව. ඒ හැර, සවදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා කොළඹ නගරයෙ තිබෙන ආසන ගණනෙ හැටියට මැද කොළඹට තුනකුත් දකුණු කොළඹට දෙකකුත් බොරැල්ලට එකකුත් උතුරු කොළඹට එකකුත් දෙන්නට බලාපොරොත්තු වෙනව. මේ අන්දමට අමුතුවෙන් මධ්‍යස්ථාන හතක් කොළඹ නගරය තුළ පිහිටුවන්නට බලාපොරොත්තු වන බව පෙනෙනව. ඒකට අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත් මා එක් කාරණයක් පෙන්වා දෙන්නට සතුටුයි. ඔය රුපියල් 171 පඩියට කවුරුවත් වැඩ කරන්ට ලැස්ති වෙන්නෙ නැහැ. මක්නිසාද ? කොළඹ නගර සභාවෙන් පත් වීම් කරන්නෙ පඩි වැඩි වන ක්‍රමයක් අනුවයි. වැටුප මීට වඩා අඩු තත්ත්වයකින් පටන් අරගෙන අවුරුදු ගණනක් ගත වුණාම මීට වැඩි තත්ත්වයකට නගිනව. ඒ අනුව පඩි වැඩිවීමේ ක්‍රමයක් තිබෙනව. නමුත් මෙතැන සාමාන්‍යයෙන් අස්ථිර කම්කරුවන් බඳවා ගන්නව වගෙයි මේ පත්වීම් කරන්නෙ. එක මූලික පියවරක හැමදම පසු වෙන්නට සිද්ධ වී තිබෙනව. ඒ තත්ත්වය කිසිම විධියකින්වත් හොඳ තත්ත්වයක් නොවෙයි.

ඊළඟට, මහන මැෂිමක් නැත්නම් යන්ත්‍රයක් රුපියල් 450කට ගන්නට බලාපොරොත්තු වෙනව. රුපියල් 450 කට අද මේ යන්ත්‍රයක් ගන්නට බැහැ. සවදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා රුපියල් 450 කට මේ යන්ත්‍රයක් ගන්ට බලාපොරොත්තු වෙන්නෙ කොහෙන්ද ? සාමාන්‍ය යෙන් අද මේ යන්ත්‍රයක් රුපියල් 600 කට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අඩුවෙන් ගන්නට බැහැ. එම නිසා මේ වෙන් කරන මුදල මධ්‍යස්ථාන 83ට පමණ වත් වේයයි පිළිගැනීම අමාරුයි.

ඊළඟට, උගන්වන්ට බලාපොරොත්තු වන විෂයයන් ගැන බලමු. ඒකත් අමුතු පිළිවෙළකටයි සඳහන් කර තිබෙන්නෙ. මැහීම, ඇඳුම් සකස් කිරීම, ගෙතීම, රේන්ද ගෙතීම හා රටා—මෝස්තර—ඇඳීම යන විෂයයන් උගන්වන්ට බලාපොරොත්තු වෙනව. මේ සියලුම විෂයයන් අවුරුද්දකින් උගන්වන්ට පුළුවන්ද කියා මා ප්‍රශ්න කරනව. තිස් දෙනෙකුට අවුරුද්දකින් මේවා උගන්වා ගමින් ගමට යවන්නයි බලාපොරොත්තු වෙන්නෙ. ඊට පසු ගමින් ගමට ගිහින් ඒ අය උගන්වනව. ඇත්ත වශයෙන්ම සවදේශ කටයුතු භාර ඇමති තුමා හෝ එතුමාගේ පාර්ලිමේන්තු ලේකම් තුමාවත් මේ අවස්ථාවේදී සිටියා නම් මේවා ගැන අපට විස්තර කර දෙන්ට තිබුණා. මේ කාරණා සේරම විස්තර කර දෙන්ට ඕනැ. මේ වැඩ පිළිවෙළ සේරම අවුරුද්ද කින් කොහොමද නිම කරන්නෙ? ඒ අවුරුද්දෙන් පස්සෙ වෙනත් ගමකට සංචාරය කරනව. ගමෙන් ගමට යන ගමන් පාඨශාලාව පිහිටුවීම සඳහා ගොඩ නැඟිලි සොයා ගන්නෙ කොහොමද කියා වත් දක්වා නැහැ. ඒ සඳහා ඉඩම්, ගෙවල් ආදිය කුලියට ගන්ට සිදු වෙනව. ඒ ගැන වත් කියා නැහැ. මේ යෝජනාවෙ ඒ කිසිවක් සඳහන් වී නැහැ. එම නිසා මෙය අසම්පූර්ණ යෝජනාවක් බව පෙන්වා දෙන්ට කැමතියි. අපි මේ යෝජනාවට විරුද්ධ වන්නෙ නැහැ. නමුත් ඉදිරිපත් කර තිබෙන්නෙ අසම්පූර්ණ යෝජනාවක් බව පෙන්වා දෙන්ට සිදු වී තිබෙනව. මෙය ඉදිරිපත් කර තිබෙන්නෙ, ඒ ඒ කරුණු ගැන විස්තරාත්මකව සොයා බලන්නෙ නැතිවයි. මේ ගැන විස්තර කරන්න ගරු ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමාත් මෙතැන නැහැ. එතුමාගෙ පාර්ලිමේන්තු ලේකම්තුමාවත් නැහැ. මැහුම් ගෙතුම් ආදිය ගැන හොඳින් දන්න වැඩ බලන සෞඛ්‍ය ඇමතිණියවත් මෙතැන නැහැ. ඒ නිසා මේ සම්බන්ධයෙන් කර්මාන්ත හා ධීවර ඇමතිතුමාගෙ පාර්ලිමේන්තු ලේකම්තුමාවත් විස්තර කරනවා ඇතැයි අපි විශ්වාස කරනව.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)
මම තවම ඉගෙන ගන්නව.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்சா)*
(Mr. Bernard Soysa)
වාඩි වී ඉඳගෙන කියන කරුණු තමන් ගෙ ආසනයට ගිහින් නැඟිටල තමන්ගෙ ආණ්ඩුව මේ මේ දේ කරනවායයි කියනව නම් හොඳයි. කොයි ආකාරයටද උගන් වන්ට බලාපොරොත්තු වන්නෙ කියා දැන ගන්ට සතුටුයි. මෙය කර්මාන්තයක් හැටි යට සලකා, කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ ඇමතිතුමාගෙ පාර්ලිමේන්තු ලේකම්තුමා මේ සම්බන්ධයෙන් විස්තර යක් කරනවා ඇතැයි අපි විශ්වාස කරනව. මේ යෝජනාව ගැන විරුද්ධ වන්ට වුවමනාවක් අපට නැහැ. දැනට තිබෙන මධ්‍යස්ථාන 68 ක්‍රියා කරන්නෙ කොහොම ද? ඒවා හරියාකාරව ක්‍රියා කරන්නෙ නැත්නම් කොයි ආකාරයටද, සංශෝධනය කරන්නෙ? මේවා ගැන නොකියා අමුතු වෙන් මධ්‍යස්ථාන 83 ක් ආරම්භ කරන්ට බලාපොරොත්තු වෙනව. විස්තර නැතිව එවැනි යෝජනාවක් ඉදිරිපත් කළාම සැකයක් ඇති වෙනව.

මේ අනුව බලන විට ආණ්ඩුව මේ යෝජ නාව සලකන්නෙ රැකියා නොමැතිකමේ ප්‍රශ්නය විසඳීමේ යෝජනාවක් හැටියට බව පෙනෙනව. එවැනි යෝජනාවක් හැටි යට සලකන විට ආණ්ඩු පක්ෂයෙ මන්ත්‍රී වරුන්ගෙ වුවමනාවත් අනුව ඒ ප්‍රශ්නය විසඳීමට කටයුතු කරන බවට විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු චෝදනා නඟා තිබෙ නව. අදත් මේ සම්බන්ධයෙන් වලපනේ ගරු මන්ත්‍රීතුමා (පී. බී. එම්. හේරත් මයා.) හඳින් කථා කළා. ඒ නිසා තමයි, කොයි ආකාරයටද පත්වීම් දෙන්ට යන් නෙ කියා නියම විධියෙ ප්‍රතිඥාවක් දෙන හැටියට ඉල්ලා සිටින්නෙ. සමහර ස්ථාන වල, විශේෂයෙන් කාන්තාවන් සම්බන්ධ යෙන් කටයුතු කරන අවස්ථාවලදී ඔවුන් ගෙ දක්ෂතා ආදිය සොයා බලා නොවෙයි, වෙනත් දේවල් බලායි, පත්වීම් දෙන්නෙ. ඔවුන්ගෙ රූමත්කම ආදි කරුණු ගැනයි වැඩි සැලකිල්ලක් දක්වන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**පර්සි වික්‍රමසිංහ මයා.** (කඹුරුපිටිය)
*(திரு. பேர்ஸி விக்கிரமசிங்ஹ—கம்புறுப் பிட்டிய)*
(Mr. Percy Wickremasinghe—Kamburupitiya)

ඒවටත් ලකුණු තිබෙන්ට ඕනෑ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்சா)*
(Mr. Bernard Soysa)

ලකුණු තිබෙන්ට ඕනෑ බව මම පිළිගන්නවා. විශේෂයෙන් මේ විධියට පත්වීම් දෙන විට, කාටද පත්වීම් දෙන්නෙ, කාටද භාර දෙන්නෙ කියන කරුණු ගැන අපි දැන ගන්ට ඕනෑ. මේ කරුණු ගැන අප දැන ගන්න ඕනෑ. ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ලක්සලට සේවිකාවන් පත් කළ ආකාරයත්, එහි පාලනයත් නොයෙකුත් අන්දමේ දෝෂාරෝපණයන්ට ලක් වූ අවස්ථා ගැන අප දන්නවා. එම නිසා අද ලක්සල පාලනය කර ගෙන යන ආකාරය ගැන ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා කෙරෙහි සතුටක් ඇති වී තිබෙනවාය කියා අපට විශ්වාස කරන්න අමාරුයි. මේ කාරණය ගැන සඳහන් කළේ කරුණු දැනගෙනයි. එය එසේ නම් එම දෙපාර්තමේන්තුවෙ වැඩ කටයුතු තවත් පුළුල් කර මැහුම් පාසල් රාශියක්ම භාර දෙන්න යන මේ අවස්ථාවේදී දූෂණකම්වලින් තොරව ඒ කටයුත්ත කරන්න යනවාය කියන සහතිකයක් මේ ගරු සභාවෙ මන්ත්‍රීවරුන්ට දෙන්න යුතුකමක් තිබුණා. මේ කරුණ ගැන විශෙෂයෙන්ම මා සඳහන් කළේ ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් කරගෙන යන වැඩ පිළිබඳව දැනටමත් බලවත් අප්‍රසාදයක් පළ වී ඇති නිසයි. එම නිසා දැනට කෙරෙනවාට වඩා ප්‍රයෝජනවත් වැඩක් එම දෙපාර්තමේන්තුවෙන් මහජනතාවට කෙරෙනවාය යන සහතිකයක් නියම වශයෙන්ම දෙන්න ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාගෙ යුතුකමක් වී තිබුණා. එසේ නැතුව කලිනුත් මා විස්තර කළ අන්දමට මෙවැනි යෝජනාවකට අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. නමුත් අලුතෙන් මධ්‍යස්ථාන ඇති කරන්න යාමේදී දැනට කොළඹ නගර සභාව මගින් පාලනය වන මධ්‍යස්ථානවල වැඩ කටයුතු කෙරෙන්නේ කොහොමද, දැනට පිහිටුවා ඇති මධ්‍යස්ථාන 68 වැඩ කටයුතු කරන්නෙ කොයි ආකාරයෙන්ද, ඇති අඩුපාඩුකම් මොනවාද, නියම වශයෙන් මේවායින් ප්‍රයෝජනයක් වෙනවාද, ප්‍රයෝජනයක් ලැබෙන අන්දමින් ප්‍රතිසංවිධානය කළ යුත්තේ කොයි ආකාරයෙන්ද කියා සලකා බලා අලුතෙන් මධ්‍යස්ථාන 83 ආරම්භ කිරීමේ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරන්න තිබුණා. එසේ නොකිරීම ගැන, එවැනි වැඩ පිළිවෙළක් ඉදිරිපත් නොකිරීම ගැන, අපේ බලවත් කණගාටුව ප්‍රකාශ කරන අතරම මෙම යෝජනාවට අප විරුද්ධ වෙන්නෙ නැති බව අවසාන වශයෙන් ප්‍රකාශ කරන්න සතුටුයි.

අ. භා. 5.20

**එම්. අබ්දුල් බකීර් මාකර් මයා.** (බේරුවල)
*(ஜனாப் எம். அப்துல் பாக்கீர் மாக்கார்—பேருவல)*
(Mr. M. Abdul Bakeer Markar—Beruwala)

Mr. Deputy Chairman,—

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்கிரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ඇයි සිංහලෙන් කථා කරන්න බැරිද?

**අබ්දුල් බකීර් මාකර් මයා.**
*(ஜனாப் அப்துல் பாக்கீர் மாக்கார்)*
(Mr. Abdul Bakeer Markar)

ඒ භාෂාවෙන් කථා කරනව අවස්ථාව ආවාම.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

තමුන්නාන්සෙලාගේ මව් භාෂාව සිංහලය කිව්ව නේද? එහෙම නම් ඇයි ඉංග්‍රීසියෙන් කථා කරන්නෙ?

**අබ්දුල් බකීර් මාකර් මයා.**
*(ஜனாப் அப்துல் பாக்கீர் மாக்கார்)*
(Mr. Abdul Bakeer Markar)

ඇයි ඉංග්‍රීසියෙන් කථා කළාම මොකද වෙන්නෙ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

ඇයි ඉංග්‍රීසි ? සිංහලෙන් කථා කරන්න බැරිද ?

අබ්දුල් බකීර් මාකර් මයා.
(ஜனாப் அப்துல் பாக்கீர் மாக்கார்)
(Mr. Abdul Bakeer Markar)

කථා කරන්න නොවෙයි. තමුන්නාන්සෙට සිංහල උගන්වන්න වුණත් පුළුවනි.

I am sorry that the learned and hon. Joint Member for Colombo South (Mr. Bernard Soysa) went on finding fault with the Minister of Home Affairs on account of the paltry sum paid to these demonstrators and also the manner in which the present Government is trying to allow salary increases to some of these officers. I must remind the hon. Member that today there are 68 centres already functioning and each of them has a demonstrator. Those demonstrators are paid a certain salary. What the Hon. Minister has come before this House for now is a further sum to employ 83 more demonstrators.

It would appear that the intention of the hon. Member was to find fault with the allocation of funds to employ demonstrators. I think he has been in this House for quite a long time—he is one of the most senior Members—and he had the occasion either during the course of the last Budget Debate or on previous occasions when similar Votes came before this House for discussion, to point out that the salary to be paid was insufficient.

I would like to point out to him that the qualification required for demonstrators is the 6th or 7th standard, with training for a year or two. I might also point out to him that during the last Government they appointed pupil teachers who had either the S. S. C. or H. S. C. qualification, and some of them were even graduates. Does he say that the paltry salary of Rs. 100 paid to them was sufficient ?



බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்சா)
(Mr. Bernard Soysa)

Then why do you not increase that salary ?

අබ්දුල් බකීර් මාකර් මයා.
(ஜனாப் அப்துல் பாக்கீர் மாக்கார்)
(Mr. Abdul Bakeer Markar)

We are prepared to do that provided you co-operate with us in putting the exchequer in order and help us to get more revenue.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்சா)
(Mr. Bernard Soysa)

To put the exchequer in order you must get out.

අබ්දුල් බකීර් මාකර් මයා.
(ஜனாப் அப்துல் பாக்கீர் மாக்கார்)
(Mr. Abdul Bakeer Markar)

You were there for one year and you were sent out. Before our period ends we will put the exchequer in order. In spite of the financial wizard you had here as Finance Minister, you bungled.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்சா)
(Mr. Bernard Soysa)

You are already getting kicked out in instalments.

අබ්දුල් බකීර් මාකර් මයා.
(ஜனாப் அப்துல் பாக்கீர் மாக்கார்)
(Mr. Abdul Bakeer Markar)

We kicked you out.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பேர்னட் சொய்சா)
(Mr. Bernard Soysa)

You are being kicked out in instalments.

අබ්දුල් බකීර් මාකර් මයා.
(ஜனாப் அப்துல் பாக்கிர் மாக்கார்)
(Mr. Abdul Bakeer Markar)

You have a fat hope! I say that at the end of the five years we will be back here again.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பேர்னட் சொய்சா)
(Mr. Bernard Soysa)

You are going down the Gadarene slope!

අබ්දුල් බකීර් මාකර් මයා.
(ஜனாப் அப்துல் பாக்கிர் மாக்கார்)
(Mr. Abdul Bakeer Markar)

The country is not prepared to follow the Marxist ways. If the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) who was here as Finance Minister found Rs. 100 sufficient for those pupil teachers—some of whom were graduates—then I think a salary of Rs. 171 for a demonstrator qualified up to the 6th or 7th Standard is a handsome salary.

ෂෙල්ටන් ජයසිංහ මයා.
(திரு. ஷெல்றறன் ஜயசிங்ஹ)
(Mr. Shelton Jayasinghe)

He put a wage freeze on all labour.

අබ්දුල් බකීර් මාකර් මයා.
(ஜனாப் அப்துல் பாக்கிர் மாக்கார்)
(Mr. Abdul Bakeer Markar)

We are not introducing any innovations; we are only coming here for a supplementary vote to increase the 68 centres to 151. It is not possible for us at this juncture to increase the salaries of those at these demonstration centres.

Then with regard to the training that is to be given, my hon. Friend asked the Minister: Is one year sufficient to give them the necessary training? Here too we are only following the past practice when it was considered that one year's training was sufficient to equip oneself for a trade.

The hon. Member for Walapane quoted instances where this Government had appointed to certain posts such as pupil teachers persons nominated by Members of Parliament belonging to the U. N. P. and defeated candidates of the U. N. P. In this connection, I wish to state that I have addressed a memorandum to the Minister and the Prime Minister pointing out that out of the fifty demonstrators to be selected from my constituency not a single supported my party or even belongs to a family that voted for the U. N. P. Everyone who was to be selected had supported the opposite camp. In fact, the certificate that was given by me proved to be a disqualification. That was the position so far as my area was concerned. As a result of representations made by me they have now stopped recruiting and an inquiry is being held by one of the deputy directors.

Then, even in the choice of pupil teachers from my constituency I find that all those who have been selected are those who supported my opponent at the last election. One of the candidates selected is a young girl who was seen on the platform of my opponent at the last election, one Miss Dissanayake.—[*Interruption*]. I am telling you how appointments are made. I am answering you; you cannot get away after making false allegations. There was a girl by the name of K. Nandani Fernando, who had passed the H. S. C. examination in science. She was a candidate for the pupil teachers' examination, and her examination number was C. 922. That girl came and saw me, gave me her name and number and said, "Sir, there is a Miss Dissanayake who was unable to compete with me in the examination, who only got through her S. S. C. examination. I have got through the S. S. C. with so many credits, and the H. S. C. with

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

science subjects. My number is C 922. I have not been selected, but that girl, who is from a village near mine and who campaigned for your opponent, who is an S. L. F. P. stalwart, has been selected." With tears in her eyes she told me this.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

Ask your Minister to resign—the Education Minister.

**වෛද්‍යාචාර්ය නාගනාතන්**
*(டொக்டர் நாகநாதன்)*
(Dr. Naganathan)

Ask the whole Ministry staff to resign.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

Order, please!

**අබ්දුල් බකීර් මාකර් මයා.**
*(ஜனாப் அப்துல் பாக்கிர் மாக்கார்)*
(Mr. Abdul Bakeer Markar)

I am not holding a brief for the Minister of Education. I am not holding a brief for the officers in the Ministry—

**වෛද්‍යාචාර්ය නාගනාතන්**
*(டொக்டர் நாகநாதன்)*
(Dr. Naganathan)

They are all L. S. S. P.

**අබ්දුල් බකීර් මාකර් මයා.**
*(ஜனாப் அப்துல் பாக்கிர் மாக்கார்)*
(Mr. Abdul Bakeer Markar)

I am not holding a brief for any of the Government officials who form the bureaucracy. I am only placing before you, Mr. Deputy Chairman, and this House, stubborn facts to point out that false allegations have been made by Members of the Opposition. That is my purpose in addressing you just now.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

දූෂණය.

**අබ්දුල් බකීර් මාකර් මයා.**
*(ஜனாப் அப்துல் பாக்கிர் மாக்கார்)*
(Mr. Abdul Bakeer Markar)

දූෂණය ගැන දැන් කථා කරනව. තමන් බලයේ ඉන්න කාලයේදී තමන් ගෙන ගිය ක්‍රියා පටිපාටිය මතක නැහැ. තව පොඩ්ඩකින් මම ඒ ගැනත් මතක් කරන්නම්. සමහර නිලධාරීන් පත් කළේ මොන විධියටද කියා කියන්නම්. කරුණා කරලා කන්නාඩි ගෙවල්වල ඉන්න මිනිස්සු ගල් ගහන්න එපා. [බාධා කිරීමක්] වීදුරු ගෙවල්වල.

I wish only to point out to you on this occasion how these demonstrators were appointed.

There was also the hon. Member for Colombo South who asked: "How are you going to use these centres when you have to take those centres from one place to the other within the electorate?" I wish to say that the present practice will be continued. There are now certain centres, and for each of those centres the people of the area get together and provide the building. In some instances the rent is paid by the residents of the area. So the present practice will continue. There is no reason why we should adopt any new practice.

It has always been our desire to be fair. A person's political leanings or similar considerations do not count with the present Government. The Hon. Minister of Home Affairs has been fair to everybody regardless of the political party to which he or she belongs.

අ. භා. 5.36

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට පෙර කථා කළ බේරුවල ගරු මන්ත්‍රීතුමා (අබ්දුල් බකීර් මාකර් මයා.) සිංහල ඉගැන්වීම කෙසේ වෙතත් මේ ආණ්ඩුව බොහොම අපක්ෂපාතව වැඩ කරනවය කියා ඔප්පු කරන්නට තැත් කළා. මම කියන්නම්, ස්වදේශ අමාත්‍යාංශයෙන් තමුන්නාන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

සේගේ ආසනයටත්, මගේ ආසනයටත් —හැම ආසනයකටම—රෙදි වියන මධ්‍යස්ථාන 7 බැගින් දුන්නා. කලින් චක්‍රලේඛයක් එව්වා, ඒ ඒ කොට්ඨාශයේ මන්ත්‍රීවරයාගේ අදහස් විමසා ඒ මන්ත්‍රීවරයා යෝජනා කරන තැන්වල රෙදි වියන මධ්‍යස්ථාන ඇති කරනවය කියා. ඒ අනුව අපිත් මධ්‍යස්ථාන යෝජනා කළා. නමුත් පසුව ඇමතිවරයා ඒ මධ්‍යස්ථාන වෙනස් කළා. මම ගරු ඇමතිවරයාගෙන් ඇහුවා, තමුන්නාන්සේගේම චක්‍රලේඛයට පට හැනිව තමුන්නාන්සේ ක්‍රියා කරන්නේ කුමක් නිසාද කියා. මගේ ආසනය තරග කර පැරදුණු අපේක්ෂකයාගේ ඉල්ලීමටත් ඇහුම්කන් දිය යුතු නිසා වෙනස් කළාය කියා ඒ ඇමතිතුමා කිව්වා. ඔන්න අපක්ෂපාතව වැඩ කරන හැටි. ඇමතිවරයම කිව්වා, ඒක කැබිනට් තීරණයක්ය කියා. තමන් පක්ෂයක් හැටියට ආණ්ඩු කරනවා නම් තමන්ගේ පක්ෂයේ හිතවතුන්ගේ ඕනෑ එපාකම් ඉටු කරන්නත් සිදු වෙනවාය කියා පිළිගන්න ඕනෑ. එසේ නැතිව තමුන්නාන්සේලා සියළු දෙයක්ම අපක්ෂපාතව සර්ව සාධාරණව කරනවය කියා පෙන්වන්න උත්සාහ කරන්න එපා.

දැනට මැහුම් මධ්‍යස්ථාන 68 ක් තියෙනව. ඉතිරි ආසනවලත් මැහුම් මධ්‍යස්ථාන පිහිටුවන්නට තීරණය කරල තියෙනව. අපි ඒ ගැන විරුද්ධ නැහැ. නමුත් මේකෙන් රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන්නෙ නැහැ. 83 දෙනකුට ප්‍රදර්ශිකාවන් හැටියට රක්ෂාව ලැබෙයි. එපමණයි, සිදු වන්නෙ. මොනවා හෝ කළාය කියා කියන්න ආණ්ඩුවක් හැටියට තමුන්නාන්සේලාටත් ඉඩ තියෙන්න ඕනෑ. රෙදි මධ්‍යස්ථාන 7 බැගින් පිහිටෙව්වාය, මැහුම් මධ්‍යස්ථානය බැගින් පිහිටෙව්වාය කියන්න තමුන්නාන්සේලාටත් ඉඩ තියෙන්න ඕනෑ. කලින් 6 මාසයයි, මේ ස්ථානවල පුහුණුව දුන්නෙ. දැන් අවුරුද්දක පුහුණුවක් දෙන්න යනවා. මැහුම් මධ්‍යස්ථානයකින් දිය යුතු පුහුණුව අවුරුද්දක් ඇතුළතදී දෙන්න පුළුවන්ද යන ප්‍රශ්නය මේ මධ්‍යස්ථාන පටන් ගත්තාම විසඳේවි. රුපියල් 400 කට මැෂින් එකක් ගන්න පුළුවන්ද, බැරිද කියාත් තමුන්නාන්සේ දන්නව. ඒ අනුවයි, මුදල් වෙන් කර තිබෙන්නෙ. මැහුම් මධ්‍යස්ථානයකින් අන්තිමට ලැබෙන්නෙ සහතිකය



විතරයි. පොඩ්ඩක් මහන්න උගන්වයි. තව පොඩ්ඩක් ගොතන්න උගන්වයි. මොනවා හෝ උගන්වා වර්ෂය අවසානයේදී ප්‍රදර්ශනයක් පවත්වා කව්රුන් හෝ ගෙන්වා ඒක විවෘත කරවා ලොකු සහතිකයක් දෙනවා. මේ සහතිකය තමයි, ඇවැද්දට දෙන්නෙ, කසාද බඳින දාට. ඔකෙන් රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන්නෙ නැහැ. පික දෙනකු ප්‍රදර්ශිකාවන් වශයෙන් තෝරා ඒ අයට රක්ෂාව දීම පමණයි සිදු වන්නෙ. ප්‍රදර්ශිකාවන් තේරීමේදී සිදු වන්නෙ මොකක්ද? දැන් තමුන්නාන්සේ ඉදිරිපිටම බේරුවල ගරු මන්ත්‍රීතුමා කථා කර පැනලා ගියා. එතුමා කථා කරන විට, ආණ්ඩුව පරාජය වූ ආණ්ඩු පක්ෂයේ අපේක්ෂකයන්ගේ වුවමනාවල හැටියට වැඩ කරනවය කියා වලපනේ මන්ත්‍රීවරයා (ටී. බී. එම්. හේරත් මයා.) කළ ප්‍රකාශයට විරුද්ධත්වය පළ කළා. වරෙක ශිෂ්‍ය ගුරු පත්වීම් දීම ගැන කථා කළ ඒ මන්ත්‍රීතුමා, "මට සම්මාන දෙකක් තිබෙනවා. නමුත් මට ශිෂ්‍ය ගුරු පත්වීමක් ලැබුණේ නැහැ. තමුන්නාන්සෙට විරුද්ධව වැඩ කළ අසවල් තැනැත්තියට ශිෂ්‍ය ගුරු පත්වීමක් ලැබුණා." යනුවෙන් තමන් වෙත පැමිණි එක්තරා කාන්තාවක් ප්‍රකාශ කළ බව සඳහන් කළා. නමුත් ශිෂ්‍ය ගුරු පත්වීම් දීම සම්බන්ධයෙන් මා ගරු අධ්‍යාපන ඇමතිතුමා සමග සාකච්ඡා කරද්දී එතුමා කීවෙ තමන් පෞද්ගලික වශයෙන් සෑම පත්වීමක් ගැනම සලකා බැලූ බව හා සියලුම පත්වීම් අපක්ෂපාතවම දී ඇති බවයි. කිසිම අසාධාරණයක් සිදු වී නැති බව එතුමා කීවා. මේ ගැන කල්පනාකර බලනවිට බේරුවල ගරු මන්ත්‍රීතුමා (එම්. අබ්දුල් බකීර් මාකර් මයා.) ගරු අධ්‍යාපන ඇමතිතුමාට චෝදනාවක් එල්ල කර ඇති බව පෙනී යනවා. තමන්ගේ ඇමතිවරයාට චෝදනා කරනවා නම් ඔහුට ඉල්ලා අස්වන්න නොකියන්නේ මන්ද? මා නියෝජනය කරන කොට්ඨාශයේද ශිෂ්‍ය ගුරු පත්වීම් අටක් නැත්නම් දහයක් දෙන්නට ඇති. ඒ අය ගැන මා සොයා බැලුවේ නැහැ. අසාධාරණයක් සිදු වී තිබෙනවා නම් සෑම පැත්තකින්ම ඒක දැන ගනීවි. ඔය අන්දමට මෙම ගරු සභාවේදී තමන්ගේ ඇමතිවරයාගේ පත්වීම් වලට විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. අසාධාරණයක් කළාලු. විද්‍යා අංශයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සුදුසුකම් තිබෙන කාන්තාවකට පත් වීමක් නොදී වෙනත් කාන්තාවකට පත් වීමක් දුන්නාලු. මේ විධියට චෝදනා කරනවා නම් තමන්ගේ ඇමතිවරයාට ඉල්ලා අස්වන සේ බල කොට නැවත වරක් ශිෂ්‍ය ගුරු විභාගය පවත්වන ලෙස ඉල්ලා නොසිටින්නේ ඇයි? පරණ විභාගය අවලංගු කොට අලුත් විභාගයක්" පවත්වන ලෙස බල නොකරන්නේ ඇයි? ඒ විධියට ක්‍රියා නොකර ඕවා අපට කියන්නේ මොකටද? අප නම් මේ ගරු සභාවේදී කියන්නේ රටේ සිදු වන දේ ගැනයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉදිරිපත් කර ඇති යෝජනාව අනුව "ප්‍රදර්ශිකාවන්" පත් කිරීමේදී නොයෙකුත් බලපෑම් ඇති වන්නට පුළුවනි. අප සමඟ තරඟ කොට පරාජයට පත් වූ උදවියගෙන් නොයෙකුත් බලපෑම් ඇති වන්නට පුළුවනි. ඒ උදවිය සෑම ප්‍රශ්නයටම ඇඟිලි ගසනවා. ඔවුන්ගේ ඇඟිලි ගැසීම් ගැන කල්පනා කරන විට පුදුම හිතෙනවා. නමුත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් ඒ තරමට ඇඟිලි ගසන්නේ නැහැ. මා සමඟ තරඟ කොට පරාජයට පත් වූ ජස්ටින් විජේවර්ධන මහත්මයා දැන් එක්සත් ජාතික පක්ෂයට හිස රදයක් බව කියන්නට කැමතියි. ඔහු විසින් දම් පාට තීන්තෙන් ලියා යවන ලද ලියුම් සිය ගණනක් මාතර කච්චේරියේ නොයෙකුත් ලිපි ගොනුවල තිබෙනවා. පැය ගණන් අධ්‍යාපන කාර්යාලයේ 'සිටිමින් හැම මාරුවීමකටම ඇඟිලි ගසනවා. අප මේ චෝදනා ඉදිරිපත් කරන්නේ කරුණු ඇතිවයි.

මා පසුගිය දවසක රාජ්‍ය ඇමතිතුමාගෙන් කළ එක් ඉල්ලීමක් ක්‍රියාවට නඟා තිබෙනවා. අසාධාරණයක් පෙන්වූ විට එතුමා ඒ ගැන ක්‍රියා කර තිබෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

එහෙම නම් මට බණින්නෙ?

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

වැරදි කරන විට තමුන්නාන්සේට වුණත් බණිනවා. රාජ්‍ය ඇමතිතුමාට ඉදිරිපත් කළ ලිපියක් අනුව එතුමා ක්‍රියා කළ බව සඳහන් කරන විට බැණීමක් ගැන එතුමා කියනවා. හොඳක් කීම බැණීමක්ද?

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

කථා කරන එකට තමයි, සිංහලේ බණිනවා කියන්නේ.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහජන ඡන්දයෙන් තේරී පත් වුණු මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම්වලට ඇහුම්කන් දීම ඕනෑම ආණ්ඩුවක යුතුකමක්. එහෙත් මහජනයා විසින් ප්‍රතික්ෂේප කරන ලද පුද්ගලයන්ගේ ඉල්ලීම් අනුව කටයුතු කරන්නට ගියහොත් නම් නොයෙකුත් අවුල් ඇති වෙනවා නේද? තම පක්ෂයෙන් මන්ත්‍රී කොට්ඨාශයක් තරඟ කළ පලියට ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන සමිතියක, "මහිලා සමිතියක", ගොවි කාරක සභාවක වඩු කාර්මික සමිතියක සාමාජිකයකු නොවන ප්‍රදේශයට කල්ලතෝනියකු වූ පුද්ගලයකු විසින් ඒ කොට්ඨාශයේ කටයුතු සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලියුම් ආදිය ගැන ක්‍රියා කරන්නට ගියහොත් තමුන්නාන්සේලාගේ වැඩ අවුල් වෙනවා නේද? මේ "ප්‍රදර්ශිකාවන්" පත් කිරීම සම්බන්ධයෙන් සිදු වන දේත් අප දන්නවා. මාතර කච්චේරියේ සිටින කිසිම නිලධාරියකුට බලපෑම්වලින් තොරව වැඩ කරන්නට පුළුවන්කමක් නැහැ. හක්මන, දෙනියාය යන කොට්ඨාශ නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගෙන්වත් වැලිගම කොට්ඨාශයෙහි මන්ත්‍රීවරයා වූ තැපැල් ඇමතිතුමාගෙන්වත් කවදාකවත් වුවමනා නැති ඇඟිලි ගැසීම් සිදු වන්නේ නැහැ. එහෙත් කඹුරුපිටිය කොට්ඨාශය තරඟ කොට පරාජයට පත් වූ අපේක්ෂකයා ඇමතිකම් කරන්නට යනවා. ඔහුගෙන් ප්‍රවේශම් වන ලෙස මා මතක් කරන්නට කැමතියි. අද සමහර උදවිය අලුත් විධියේ වෙළෙඳ ව්‍යාපාරයක යෙදී සිටින බව කල්පනාවට ගන්න. අද මේව, සමහර අයගෙ ගෙවලට කිරි හට්ටි [illegible] ව්‍යාපාර බවඩ පත්වී තිබෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

මෙවැනි දේවලට ඉඩ තබන්න හොඳ නැ. ඇමතිවරයා කිසියම් තීරණයක් ගත්තොත්, එය හරි හෝ වැරදි හෝ වේවා, තීරණයක් වශයෙන් තිබිය යුතුයි. යම් තීරණයක් අර ගෙන අපක්ෂපාතව කටයුතු කරන්නට නිලධාරීන්ට ඉඩ තියෙන්න ඕනැ. මැතිවරණයෙන් පරාජය වුණු අපේක්ෂකයා වීම සුදුසුකමක් වශයෙන් තබාගෙන රජයෙ හැම කටයුත්තකටම ඇඟිලි ගසන පුද්ගලයින් සිටියදී යුක්තියක් ඉෂ්ට වන්නෙ කොහොමද ? මේ ප්‍රදර්ශිකාවන් පත්කිරීමෙදි ඉතාමත් දැඩි පියවරක් ගන්නයයි අපි ඉල්ලා සිටින්නෙ ඒ නිසයි. රෙදි විවීමේ මධ්‍යස්ථාන පිහිටුවීමෙදි, පරාජිත අපේක්ෂකයගෙ ඉල්ලීම පිට, ස්ථාන ගණනාවක් වෙනස් කරන්නට ඇමතිවරයට සිදුවුණා නම්, මේ මැහුම් මධ්‍යස්ථාන පිහිටුවීමෙදිත් එවැනි දෙයක් නොවේයයි හිතන්න පුළුවන්ද ? මා පළාතේ මන්ත්‍රීවරයා වශයෙන් යම් ස්ථානයකට මැහුම් මධ්‍යසථානයක් ඉල්ලා සිටියොත්, “එතෙන්ට එපා, අහවල් තැනට දෙන්න” කියා පරාජිත අපේක්ෂකය කියයි. ඔහු ඉල්ලන තැනට මැහුම් මධ්‍යස්ථානය දුන්නහම ඊළඟට ඔහු කරන්නෙ මොකද ? “මේක මගෙ මැහුම් මධ්‍යස්ථානය, මමයි මේක ලබා ගත්තෙ” කියමින් ප්‍රචාරයක් කරනව. ඔය ජාති දාල දැන් මහජනය රවටන්න බෑ. එහෙත් ජනතාව විසින් ප්‍රතික්ෂේප කරන ලද පුද්ගලයින් මේ විධියට ඇඟිලි ගහන්න පටන් ගත්තහම අමාත්‍යාංශය සාධාරණ පිළිවෙළට වැඩ කරන්නෙ කොහොමද යන ප්‍රශ්නය මම අහනව.

මේ යෝජනාවට අපේ සම්පූර්ණ සහයෝගය දෙනව. මෙයින් කාන්තා පක්ෂයට සෑහෙන ප්‍රයෝජනයක් ලැබෙනව. අප ඉල්ලා සිටින්නෙ, ප්‍රදර්ශිකාවන් හා වෙනත් අය පත් කිරීමෙදි සාධාරණය ඉෂ්ට වන අන්දමට කටයුතු කරන ලෙසයි.

අ. භා. 5.47

**වෛද්‍යාචාර්ය නාගනාතන්**

*(டொக்டர் நாகநாதன்)*

(Dr. Naganathan)

Mr. Chairman, if I understood the hon. Member for Kamburupitiya (Mr. Percy Wickremasinghe) correctly, the principle he wanted to emphasize was that the Member of Parliament of a particular constituency should be consulted or his recommendation should be accepted in the matter of appointments whether it be to the posts of pupil teacher or to any other posts. That appeared to be the burden of his song.

**පර්සි වික්‍රමසිංහ මයා.**

*(திரு. பேர்ஸி விக்கிரமசிங்ஹ)*

(Mr. Percy Wickremasinghe)

You have not understood what I said.

**වෛද්‍යාචාර්ය නාගනාතන්**

*(டொக்டர் நாகநாதன்)*

(Dr. Naganathan)

I understood you very well. [*Interruption.*]

It is quite clear that the principle which guides the hon. Member is that there should be political interference, and he says that he and the members of his party who are Members of Parliament are not listened to. I say that it is an obnoxious principle that there should be political interference in appointments in Government service.

In my constituency, Nallur, there are 4,000 to 5,000 pupils who have sat for the Pupil Teachers' Examination. They come to me and say that they understand that appointments will depend on my recommendation as Member of Parliament for the area. I tell them, "For God's sake, I will never have anything to do with appointments. It is a competitive examination and only the best fifteen or twenty candidates, or whatever is the number that is required, will be chosen."

My advice to the hon. Member for Kamburupitiya, who has run away, is not to interfere in these matters. Out of thousands of applicants only a few are selected for appointment after a competitive examination, and political interference will help neither the Member nor the person on whose behalf he has interfered.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

These things must be left to the appropriate authorities for them to act honestly and correctly. For instance, if the Hon. Minister of Education discriminates, we will see that he is shown up and thrown out of this House ; but we must give him all the power and authority to enable him to act with confidence and to do things properly.

For instance, this morning a Question was asked about science teachers' posts not being filled. For the past nine years no new science teachers have been appointed in Jaffna in place of those who have died, left the service or retired. This morning in reply to a Question an Answer was given by the department. Neither the Minister nor his Parliamentary Secretary was present to face the facts. The Parliamentary Secretary to another Minister answered the Question.

Sir, it is a breach of Privilege for the Minister not to be present to answer a Question relating to his department and to get another Parliamentary Secretary to answer with unmitigated lies on the Floor of this House. It is a breach of privilege. We will bring up the matter with the necessary details.

We do not want to interfere with the Minister. We only want to see that there is justice and fair play. If there is honesty, then there can be no discrimination. If there is honesty, then there will be no minority question. If a man is honest, how can he discriminate ? If a man is honest how can he put an inferior person over a superior person ? What we want is honesty in the administration. We are not for political pressure in the matter of appointments.

What happened when the previous Government was in office ? Take, for instance, appointments to the C. W. E. and the police, and the recruitment of teachers, and you will find that nominees of the previous Government had received favoured treatment.

It may be that the Hon. Minister of Home Affairs does not completely understand the problems arising out of the establishment of needlework centres. After all, he is an old bachelor and, therefore, he can be pardoned. It may be that he is not a knowing bachelor like the hon. Member for Colombo South (Mr. Bernard Soysa) who seems to know all about needlework. The Hon. Minister is an old good-hearted bachelor and he may slip up here and there, but generally he has tried to be as fair as he possibly could.

My good Friend the hon. Member for Colombo South was rather worried that the training period is restricted to only one year within which to learn five subjects, namely sewing, dress-making, knitting, lace-making and design-drawing. It would appear, however, from the speech of the hon. Member for Kamburupitiya—who is not here now and who seems to have run away—that formerly the training period was only six months. You will see, Sir, that our bachelor Minister of Home Affairs is learning something in that he now knows that six months is too short a period to learn these subjects. One year is, therefore, an improvement on the previous training period of six months. The previous Government had our charming, fair Lady as its leader. My good Friend from Colombo South, the knowing, well-knowing and well-experienced bachelor that he is, does not seem to know that these five subjects are intertwined. For instance, a girl cannot sew without knowing design-drawing ; she cannot sew without knowing dress-making ; so that sewing, dress-making and design drawing are intertwined subjects whereas lace-making and knitting go together. Therefore, really only two subjects are being taught.

How do you make a dress ? You must have a design and you must sew something. I think a married man knows more about these things than my bachelor Friend the hon. Member for Colombo South.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය නාගනාතන්]

I may point out that one subject which should be taught has been omitted. I refer to darning.

**සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය.** (අත්තනගල්ල)

*(திருமதி சிறிமாவோ ஆர். டீ. பண்டாரநாயக்க—அத்தனகல்ல)*

(Mrs. Sirimavo R. D. Bandaranaike—Attanagalla)

Sewing will include darning.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

Do all your villagers wear socks ?

**වෛද්‍යාචාර්ය නාගනාතන්**

*(டொக்டர் நாகநாதன்)*

(Dr. Naganathan)

Darning is necessary. You must know darning to darn the seat of your trousers ! The bachelor Minister, nice old man that he is, does not know that darning is necessary.

The question of salaries has been mentioned. I wish to point out to the hon. Member for Colombo South that the salary of the clerk in the G. C. C., is not going to remain fixed but that it will increase annually. Similarly, it is so in the case of the junior needle-work supervisors and the needle work demonstrators. The calculation of their salaries is simple arithmetic.

All I want to say is that this is a very desirable scheme. I am only sorry that the very charming Leader of the Opposition has not spoken on this Motion so far. I very much wish that she will speak and speak sense unlike some others from that side who spoke nonsense.

අ. භා. 5.57

**ඩී. ඊ. තිලකරත්න මයා.** (රත්ගම)

*(திரு. டி. ஈ. திலகரத்ன—ரத்கம)*

(Mr. D. E. Tillekeratne—Ratgama)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාගෙ මැහුම් කර්මාන්ත මධ්‍යස්ථාන පිළිබඳ යෝජනාව සාකච්ඡා කිරීමෙදි බොහෝ ගරු මන්ත්‍රීවරුන් කෙළේ යෝජනාවට අදාළ කරුණු ඉදිරිපත් කිරීම නොව ඒ පැත්තෙන් මේ පැත්තටත් මේ පැත්තෙන් ඒ පැත්තටත් මඩ ගැහීමයි. කඹුරුපිටියෙ ගරු මන්ත්‍රීතුමා (පර්සි වික්‍රමසිංහ මයා.) එතුමාගෙ කථාවේදි උත්සාහ කෙළේ මේ මැහුම් මධ්‍යස්ථාන අලුත් ඒව හැටියට පෙන්වා දීමටයි. මේ මධ්‍යස්ථානවලින් බිහිවන අයට දැවැද්දට සහතිකයක් දෙනවයයි එතුමා කිව්ව. මෙවැනි කරුණක් ගැන මේ ගරු සභාවෙහි කථා කිරීමෙදි යුක්ති සහගතව කරුණු ඉදිරිපත් කළ යුතු බව අප කල්පනාවට ගත යුතුයි. අවුරුදු ගණනක් තිස්සෙ මේ මධ්‍යස්ථාන තිබුණු නමුත් ඒ ඒ අවස්ථාවල තිබුණු ආණ්ඩුවල දුර්වලකම නිසා ඒවා නියම අන්දමින් සකස් කර ගන්නට බැරි වුණා. දැන් තවදුරටත් මේව ඒ දුර්වල තත්ත්වයෙන්ම පවත්වාගෙන යන්නෙ නැතිව, වැඩි දියුණු කර, ඒවායෙහි ඉගෙනීම ලබා පිට වන අයට කිසියම් රක්ෂාවක් කරගත හැකි වන අන්දමට වැඩ පිළිවෙලක් යෙදිය යුතුව තිබෙනව. අපගේ පරමාර්ථය විය යුත්තෙ ඒකයි. සමහරවිට, එක් මධ්‍යස්ථානයකින් වරකට 30 දෙනකු පිට වෙනව නම්, එකපාරටම ඒ 30 දෙනාටම රක්ෂා සපයා ගන්නට බැරි වෙන්න පුළුවනි. අඩු ගණනෙ එයින් 15 දෙනකුටවත් රක්ෂා සපයන්න පුළුවන් වුණොත් එය විශාල ජාතික සේවයක් වෙනව.

ඊළඟට, මේ මධ්‍යස්ථාන වැඩි දියුණු කර ගන්නා අතරම, ඒවායෙහි නිෂ්පාදනය කෙරෙන බඩු ගැනත් අපේ කල්පනාව යොමු කරන්නට ඕනෑ. මධ්‍යස්ථාන 150ක් ඇති කළත් 300ක් ඇති කළත් ඒවායින් නිපදවන බඩු හරියාකාර අලෙවි නොකළොත් ප්‍රයෝජනයක් ලැබෙන්නෙ නැහැ. ලක්සැල් කොතෙක් තිබුණත් සමහර ලක්සැල් මේ මධ්‍යස්ථානවල නිපදවන බඩුවත් ගන්නෙ නැහැ. දූෂණ ක්‍රියාවලට යට වීම නිසා සමහර විට යටින් බඩු දීලා කොමිස් මුදල් තමන්ට ලැබෙන ආකාරයට කටයුතු කරනව. සමහර මධ්‍යස්ථානවලින් නිපදවන බඩු සමහර ලක්සැල් මගින් නොගැනීම නිසා දුර්වල වී තිබෙන බව නිර්භයවම කියන්න ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி. சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

ආණ්ඩුවෙ දුර්වලකම නිසයි එහෙම දේවල් වෙනව ඇත්තෙ. ඒ විධියෙ දේවලට ඉඩ දෙන එක ආණ්ඩුවෙ දුර්වල කමක්.

**ඩී. ඊ. තිලකරත්න මයා.**
*(திரு. டி. ஈ. திலகரத்ன)*
(Mr. D. E. Tillekeratne)

මේ ආණ්ඩුව යටතෙ පමණක් නොවෙයි ඔය දුර්වලකම් ඇති වී තිබෙන්නෙ. මාත් හිටියා නේ ඔය ගරු මන්ත්‍රීතුමා ඇමති වරයෙකු හැටියට හිටපු ආණ්ඩුවෙ. ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා ගෙන් මා ඉල්ලා සිටින්නෙ එකී දුර්වලකම මඟ හරවා හැම මධ්‍යස්ථානයකින්ම නිපද වන බඩු හරියාකාර අලෙවි කිරීමට වැඩ පිළිවෙල සකස් කරන ලෙසයි.

මෙකී මධ්‍යස්ථාන පමණක් නොව රෙදි වියන මධ්‍යස්ථාන දාහකුත් පිහිටුවීමට ක්‍රියා කිරීම ගැන ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාට ප්‍රශංසා කළ යුතුව තිබෙනව. මගේ ඡන්දදායක කොට්ඨාශයටත් රෙදි වියන මධ්‍යස්ථාන හතක් එතුමා අනුමත කළා. එයින් දැනටමත් පහක් විවෘත කර තිබෙනව. ඒවායේ ළමයින් 25 දෙනා බැගින් ඉගෙනීම ලබනව. ඒ ළමයින් 25 දෙනා තෝරා ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රියා මාර්ගය ගැන ඇතැම් ගරු මන්ත්‍රීවරුන් දොස් කීවත්—අපට වුවමනා කළ අය ගත්තාය කියා ආණ්ඩු පක්ෂයේ අපට දොස් කීවත්—අසුවල් ළමයා ගන්නැයි කවදාවත් අප කියා නැති බව මතක් කර දෙන්න කැමතියි. ඒ කොයි හැටි වෙතත් අප කරා පැමිණ අපෙන් සහතික ඉල්ලා සිටි ළමයින්ට අප සහතික නිකුත් කළ බව පිළිගන්නව. විරුද්ධ පාර්ශ්වයට හිතවත් අය වුවත්, ආණ්ඩු පාර්ශ්වයට හිතවත් අය වුවත් අප ළඟට ඇවිත් සහතිකයක් ඉල්ලුවොත් ඒ උදවිය ඡන්දදායකයන් හැටියට සලකා සහතිකයක් දීම අපේ යුතුකමක්ව තිබෙනව.

ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා වෙත තවත් වැදගත් කාරණයක් ඉදිරිපත් කරන්න කැමතියි. මේ මධ්‍යස්ථාන බෙදා දෙන අවස්ථාවේදී මුහුදුබඩ ප්‍රදේශ ගැන වැඩි සැලකිල්ලක් දැක්වීම යුක්තිසහගත බවයි මා කියන්නෙ. මුහුදුබඩ ප්‍රදේශවල වැඩි වශයෙන්ම තිබෙන්නෙ හස්ත කර්මාන්තයයි. ගොවිතැන් කිරීමට කුඹුරු අක්කර දහස් ගණනින් ඒ ප්‍රදේශවල නැහැ. මහනුවර ආදි උඩරට ප්‍රදේශවල ඉඩම් ප්‍රශ්නය ඊට වඩා වෙනස්. ඒ නිසා මෙවැනි ආයතන ඇති කරන විට මුහුදු බඩ ප්‍රදේශ ගැන විශේෂයෙන් සැලකිලිමත් වන ලෙස මා ඉල්ලනව.

මීට වඩා දීර්ඝ ලෙස කථා කිරීම අවශ්‍ය නැතැයි මා කල්පනා කරනව. මේ මධ්‍යස්ථානයකට 30 දෙනකු ගත්තත් ඒ ගන්නා උදවිය විරුද්ධ පාර්ශ්වයේ වුවත් ආණ්ඩු පාර්ශ්වයේ වුවත් 30 දෙනකුට රක්ෂාවල් ලැබෙන බව කල්පනා කරන්න ඕනෑ. ඒ නිසා මේ ක්‍රියා මාර්ගය ගැනීම ගැන ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාට ප්‍රශංසා කරමින් මගේ කථාව අවසන් කරනව.

අ. භා. 6.3

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ විවාදය වෙනත් සවරූපයක් ගෙන තිබෙන බව මේ අවස්ථාවේදී පළමුවෙන්ම සඳහන් කළ යුතුව තිබෙනව. විශේෂයෙන්ම බේරුවල ගරු මන්ත්‍රීතුමාගේ කථාව ගැන කියන්න තියෙන්නෙ, "කොහෙද යන්නෙ, මල්ලෙ පොල්" කතාව සිහිපත් කර වන කථාවක් එතුමා කළ බවයි. වලපනේ ගරු මන්ත්‍රීතුමා කියා සිටියේ ශිෂ්‍ය ගුරුවරුන් තෝරා පත්වීම් දීම සම්බන්ධයෙන් කල්පනා කර බලන විට ඒ කාර්යය භාර ගරු ඇමතිතුමාගේ නොයෙක් විධියේ ඇඟිලි ගැසීම් නිසා පත්වීම් ලැබුණේ සුදුසු අයටම නොවන බවයි. ඒ පත්වීම් දීමේදී යම් යම් දූෂණ ක්‍රියා සිදු වූ බවයි එතුමා කියා සිටියෙ. එක්සත් ජාතික පක්ෂයේ හිතවතුන්ට වැඩි වශයෙන්ම මේ පත්වීම් ලැබුණාය යන්න බොරුවක් නොවෙයි. වඩාත් සුදුසුකම් ඇති අයට නොව, එක්සත් ජාතික පක්ෂයේ නියෝජිතයන් හැටියට යම් යම් ආසන තරඟ කළ අපේක්ෂකයන්ගේ නෑදැයින්ටත් හිතවතුන්ටත් ඒ පත්වීම් ලැබුණු බව පැහැදිලිව පෙනෙන බවයි ඒ ගරු මන්ත්‍රීතුමා කියා සිටියෙ. එය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

බොරුවක් නොවෙයි. එහෙත් බේරුවල ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළේ අපේ ආණ්ඩුව තිබුණු කාලයේදී ශිෂ්‍ය ගුරුවරුන් නමින් රුපියල් සියයේ දීමනාවක් ලැබෙන පිරිසක් ඇති කිරීම ලොකු වැරැද්දක් බවයි. ශිෂ්‍ය ගුරුවරුන් තෝරා ගැනීමේදී ඇති වූ දූෂණ ගැන සඳහන් කරන විට ඒ ගැන පිළිතුරු නොදී රුපියල් සියයට ශිෂ්‍ය ගුරුවරුන් පත් කිරීම ගැන සඳහන් කර මින් ප්‍රශ්නයෙන් බේරීමට උත්සාහ කිරීම සඳහා—ප්‍රශ්නයෙන් ගැලවෙන්ට උත්සාහ කිරීම සඳහා—වෙනත් කරුණු ඉදිරිපත් කිරීම සුදුසු නැහැ. මම හිතන්නෙ නිල ධාරීන්ට පවා ලොකු අතවරයකට මුහුණ පාන්න සිද්ධ වුණා සම්මුඛ පරීක්ෂණ කීපයක් පැවැත්වීම නිසා. ශිෂ්‍ය ගුරු පත් වීම් දීම සඳහා සම්මුඛ පරීක්ෂණ තුනක් පැවැත්තුවා. අපේ කාලෙ ශිෂ්‍ය ගුරු පත් වීම් දුන්නේ වැඩිම ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අයටයි. එක්සත් ජාතික පක්ෂ යෙ හෝ වෙන මොන පක්ෂයක හෝ වේවා වැඩිම ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අය පත් කළා. දෙපාර්තමේන්තුවෙන් කියනවා, එදා ශිෂ්‍ය ගුරුවරුන් වශයෙන් පත් කර ගත් අය උපාධිධාරීන්ටත් වඩා දක්ෂයි කියා. එදා ඔවුන්ට පඩි වශයෙන් දුන්නෙ රුපියල් සියයක් පමණක් වුණත් අද ඔවුන් වැඩි වශයෙන් අභ්‍යාස විද්‍යාල වලට ඇතුළු වීමෙන් ඔවුන්ගෙ වැටුප වැඩි වන බව තමුන්නාන්සේ දන්නවා ඇති.

එහෙත් මේ වතාවෙ ශිෂ්‍ය ගුරු පත්වීම් දීමේදි අක්‍රමිකතා රාශියක් ආණ්ඩුව ඕනෑ කමින්ම කර තිබෙන බවට සාධක දක් වන්න පුළුවන්. එයින් එකක් වශයෙන් "ජිවිරැස" පත්‍රයෙ තිබෙන ප්‍රවෘත්තියක් ගෙන හැර දක්වන්න පුළුවන්. මෙය තමුන්නාන්සේලාගෙම ප්‍රවෘත්ති පත්‍රයක්. මුල් පිටුවෙම එය පළ වී තිබෙනව. ශිෂ්‍ය ගුරු පත්වීම් දීමේදි ආණ්ඩුව අයුතු ආකා රයට ඇඟිලි ගසා තිබෙන බවට මෙය හොඳ ම සාධකයක්. "සිසු ගුරු ලියවිලි ගිනි බත්" යන සිරස්තලය යටතේ එහි මෙසේ සඳහන් වෙනව:

"අන්තිම වරට පවත්වන ලද ශිෂ්‍ය ගුරු විභාග යේ ප්‍රතිඵල සටහන් සහ එම විභාගයෙන් සමත් වූවන් සඳහා මෑතදී පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ වල ලකුණු ලේඛනයන් ද සියල්ලක්ම පුළුස්සා විනාශ කර දමා තිබේ.

කොළඹ ප්‍රධාන කාර්යාලය තුළ තිබුණු ලකුණු ලේඛන සියල්ල ඉතාම රහසිගත අන්දමින් ගිනි බත් කොට ඇති අතර ප්‍රාදේශීය කාර්යාලයන්හි ඇති සම්මුඛ පරීක්ෂණ ලකුණු ලේඛනයන්ගෙන් ද සමහරක් ඒ ආකාරයෙන්ම විනාශ කොට ඇති බව මා විසින් කරන ලද පරීක්ෂණයකදී අනාවරණය විය.

පසු ගිය ශිෂ්‍ය ගුරු විභාගයට පෙනී සිටි අයගෙන් එක්තරා ප්‍රමාණයකට ලබන මැයි මාසයේ සිට පත් වීම් ලැබී ඇති අතර, මෙම පත්වීම් ලැබූ හා නොලැබූ සැම දෙනෙකුගේම ලකුණු සටහන් විනාශ කොට දමා ඇති නිසා පත්වීම් ලබා ඇත්තේ නියම සුදුස් සන්ද යන සාධාරණ සැකය දැන් බොහෝ දෙනා තුළ ඇති වී තිබේ.

මෙම ශිෂ්‍ය ගුරු පත්වීම් දීම සම්බන්ධයෙන් පසු ගිය කාලය තුළම බලවත් කඹ ඇදිල්ලක් තිබුණි. මේ සම්බන්ධයෙන් නොයෙකුත් දෙනා ගෙන් නොයෙකුත් විට ඇති වූ බලපෑම් සම්බන්ධ යෙන් ද විවිධාකාර විවේචනයන් හා උද්ඝෝෂණ යන් පැවතින.

ඉහත සඳහන් පරිදි කිසිම අපේක්ෂකයකුගේ ලකුණු මොනම ආකාරයකින්වත් සොයා ගත නො හැකි වන පරිදි, සියල්ල විනාශයට පත් කළේ කුමන හේතුවක් නිසා ද? කුමන බලපෑමක් උඩද? යන ප්‍රශ්නය ගැන නොයෙකුත් අන්දමින් කට කතා පැතිර පවතී."

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඒ ගැන කොමිසමක් ඕනෑ.

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)
මේ ප්‍රවෘත්තිය අනුව පෙනී යනව ශිෂ්‍ය ගුරු පත්වීම් පිළිබඳ ලිපිලේඛන කිසිවක් නැති බව. ප්‍රධාන කාර්යාලයෙන් නැහැ; ප්‍රාදේශීය කාර්යාලවලත් නැහැ. ඇමති වරයා කෙළින්ම නියම කර තිබෙනව ඒ ලිපිලේඛන සියල්ලම පුළුස්සා දමන්නය කියා. එයින් පෙනී යනව, මෙදා ශිෂ්‍ය ගුරු පත්වීම් තමන්ගේ හිතවත්කම්වලටත් පක්ෂයේ හිතවත්කම් වලටත් අනුව සහ වෙනත් පෞද්ගලික හේතුන් උඩ දී තිබෙන බව. ඊට හොඳම සාධකයක් තමයි මේ ලිපිලේඛන පුළුස්සා විනාශ කර දැමීම. එම නිසා ආණ්ඩුව තමන්ගේ පිරිසිදු බව ආරක්ෂා කර ගැනීමට නම් මේ ගැන සම් පූර්ණයෙන්ම සොයා බැලීම පිණිස කොමි සමක් පත් කරන්න. තමුන්නාන්සේලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නම් කෙළවරක් නැතුව කොමිසම් සභා පත් කරනව. සතොස කොමිසම, අර කොමිසම, මේ කොමිසම ආදී වශයෙන් කෙළවරක් නැතුව පත් කර තිබෙනව. විශේෂයෙන් මේ විධියේ විනාශකාරී වැඩ ගැන කොමිසමක් පත් කර මෙහි වරදක් සිදු වී තිබෙනවාද යන්න ගැන පැහැදිලි තත්ත්වයක් අවබෝධ කර ගැනීමට රටේ ජනතාවට අවසථාව සලසා දෙන්න ඕනෑ. කෙසේ වුවද මේ කරුණු අනුව අපට පැහැ දිලිවම පෙනෙනව—එම ලිපි ලේඛන විනාශ කර දැමීමෙන් පැහැදිලිවම පෙනෙනව— තමන් කළ වැරදි වසා ගැනීමට එය කර තිබෙන බව. ඒ නිසා තමුන්නාන්සේලා මෙයින් පිරිසිදු වෙන්න ඕනෑ නම්—

**එස්. බී. හේරත් මයා.** (හිරියාල)
*(திரு. எஸ். பி. ஹேரத்—ஹிரியால)*
(Mr. S. B. Herat—Hiriyala)
කවුද ඔක කියා තිබෙන්නෙ ?

**බී. එච්. බණ්ඩාර මයා.**
*(திரு. பி. எச். பண்டார)*
(Mr. B. H. Bandara)

තමුන්නාන්සේලාගේම පත්‍රයක් තම යි ; "රිවිරැස" පත්‍රය. මෙය "රිවිරැස" පත්‍ර යෙ මුල් පිටුවෙ විදහා පෙන්වා තිබෙනව. මේ ප්‍රවෘත්තිය බොරු නම් ආණ්ඩුවට පුළු වනි මේ පත්‍රය තහනම් කරන්න. තමුන් නාන්සේලාට "ජනදින" පත්‍රය තහනම් කරන්න පුළුවන් නම් ආණ්ඩුව නොකළ වැඩක් කළාය කියා මෙතරම් ලොකු බොරු වක් පළ කර ඇති මේ "රිවිරැස" පත්‍රය තහනම් කරන්න බැරි ඇයි ? එහෙම නැත්නම් පත්‍රයේ පළ කර තිබෙන ඒ වාර්තාව සම්පූර්ණයෙන්ම බොරුවක්ය කියා ප්‍රකාශයක් කරන්න තමුන්නාන්සේ ලාට බැරි ඇයි ? [බාධා කිරීමක්] ඒ සම් බන්ධව ඊට වඩා යමක් කියන්නට මා අද හස් කරන්නේ නැහැ. බේරුවල ගරු මන්ත්‍රීතුමා (අබ්දුල් බකීර් මාකර් මයා.) ශිෂ්‍ය ගුරු පත්වීම් ගැන ප්‍රකාශ කළ නිසා එයට පිළිතුරුදීමක් වශයෙනුයි ඔය වචන ටික කථා කිරීමට මා අදහස් කළේ.

ඊළඟට ජංගම මැහුම් පාසැල් ගැනත් වචන කීපයක් කථා කරන්නට ඕනෑ. ජංගම මැහුම් පාසැල් ඇති කිරීම ගැන අපි විරුද්ධ නැහැ. මීට කලිනුත් මේ රටේ ජංගම මැහුම් පාසැල් තිබුණා. එහෙත් ඒ ක්‍රමය දූන් එක්සත් ජාතික පක්ෂයේ ප්‍රචාරක වැඩ පිළිවෙලක් කර ගෙන තිබෙනව. ඒ නිසා ඒ සඳහා වැය කළ යුත්තේ එක්සත් ජාතික පක්ෂයේ මුදල් මිස රජයේ මුදල් නොවෙයි. මැහුම් ගුරුවරියන් සඳහාය කියා මේ මුදල වෙන් කරන්නේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රචාරක වැඩවලටයි. මා එසේ කියන්නෙ මේ මැහුම් ගුරුවරියන් පත්කිරීම එක්සත් ජාතික පක්ෂයේ ප්‍රචාරක කටයුත්තක් කරගෙන තිබෙන නිසයි. මගේ කොට්ඨා ශයටත් මේ කියන මැහුම් ගුරුවරියක් යවා තිබුණා. ඒ ගුරුවරිය යවා තිබුණේ මා සමග තරග කර පරාජය වූ එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයාගේ බාරයේයි. ඒ තැනැත්තා ගම්වලට ගොස් "මෙන්න අපේ ගම්වල අයට මැහුම් උගන්වන්න අපි ගුරුවරියක් පත් කළා" කියා හරියට එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයාගේ වියදමින් කරන දෙයක් වගේ පෙන්නුම් කර එක්සත් ජාතික පක්ෂ සංවිධාන තහවුරු කිරීමට ඔවුන් යොදා ගන්නව. මගේ කොට්ඨාශයේ පරාජය වූ අපේක්ෂකයා ගෙන යන ව්‍යාපාරය මා හොඳහැටි දන්නව. හොඳ වැඩ පිළිවෙලක් අනුව කරනවා නම් අපේ ප්‍රදේශවල ළමයින්ට මැහුම් ටිකක් ඉගැන් වීමට අපි කැමතියි. එහෙත්, එක්සත් ජාතික පක්ෂයේ ප්‍රචාරක වැඩ සඳහා මේ අන්දමට මහජන මුදල් වැය කිරීම ගැන මා සම්පූර්ණයෙන්ම විරුද්ධයි.

එමෙන්ම ආසන 151 ට ජංගම මැහුම් පාසැල් 151 ක් ලැබෙන්නෙ නැහැ. පාසැල් අසූ ගණනයි තිබෙන්නෙ. එය තැනින් තැනට යනව. ඒ නිසා අවුරුද්දක් ඇතුළත දී අවශ්‍ය හැම දෙයක්ම උගන්වා නියම පුහුණුවක් ලබා දෙන්නට පුළුවන් වන්නේ නැහැ. මගේ කොට්ඨාශයේ ඔය විධියේ වැඩ පිළිවෙලක් තිබුණා. අවුරුද්දකට 12 වරකට වඩා පන්තියක් පවත්වන්නට අවසථාව ලැබෙන්නෙ නැහැ. ඒ නිසා මෙයින් නියම ප්‍රයෝජනයක් ලැබේවිද කියන එක ගැන මට නම් සැකයි.

අලුතින් ඇති කළ පේසකර්ම මධ්‍යසථාන වලට ළමයින් ඇතුල් කර ගැනීම පිළිබඳව මන්ත්‍රීවරුන් හුඟ දෙනෙක් කථා කළා. මගේ කොට්ඨාශයේ නම් තවම එකක්වත් විවෘත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බී. එච්. බණ්ඩාර මයා.]

කර නැහැ. හැබැයි මධ්‍යස්ථාන 8 ක් හදලා නම් තිබෙනව. ඒවාට පවා ළමයින් ඇතුල් කර ගැනීමේදී ඇඟිලි ගැසීම් තිබෙනව. මගේ කොට්ඨාශයේ මා සමග එක්සත් ජාතික පක්ෂයෙන් තරඟ කළ අපේක්ෂකයා හැම දේකටම ඇඟිලි ගහනව. රක්ෂා ලබාගන්න ලියුම් දෙනවා; රක්ෂාවල් අරගෙන දෙන්නටය කියා කොළඹ එක් කරගෙන එනව. එයා දන් ඒ වැඩේ ව්‍යාපාරයක් කර ගෙන. බස් කොන්දොස්තරවරුන් පත් කළෙත් එහෙමයි. අපේ කාලයේ නම් පක්ෂ භේදයක් නැතිව හැම ඡන්ද කොට්ඨා ශයකින්ම දොළොස් දෙනා බැගින් ලොතරැයි ක්‍රමයට තෝරා ගත්ත. මන්ත්‍රීවරුන්ට අපි දන්නුව එක් එක් ඡන්ද කොට්ඨාශයෙන් මෙතරම් සංඛ්‍යාවක් අපි ලංගමයට බඳවා ගන්නවාය කියා. අපට තමුන්නාන්සේලා දන්නුවෙ නැහැ. එස්. එස්. සී. තබා හතරවත් පාස් නැති අය පස්ස දොරෙන් ලංගමයට බස් කොන්දොස්තරවරුන් වශයෙන් ළඟදී පත් කරගෙන තිබෙනව. වුවමනා නම් මට නම් වශයෙන් වුණත් කියන්ට පුළුවනි. තමුන් නාන්සේලා කරන මේ වැරදි වැඩ ගැන සොයා බලන්ට අපට කොමිසන් සභා පත් කරන්ට නොවෙයි ඊටත් වඩා දේවල් කරන්ට සිද්ධ වෙයි. හිතවත්කම්වලට පත්වීම් දීල තමුන්නාන්සේලා ලංගමය කාබාසිනියා කර තිබෙනවා. ලංගමයට සේවකයන් ඕනෑවට වැඩියෙන් බඳවා ගැනීම නිසා අද ලංගමයෙන් පාඩු සිදු වෙනවා යයි ගරු අගමැතිතුමාම ළඟදී දැදිගම රැස්වීමකදි ප්‍රකාශ කර තිබෙන බව ඊයේ පත්‍රයේ පළවූ වාර්තාවකින් මා දක්කා. එතුමාම ඒ තත්ත්වය පිළිගෙන තිබෙනව.

නල්ලූරුවේ ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය නාගනාතන්) නිතරම කියනව, පසුගිය ආණ්ඩුව පොලිස් කටයුතුවලට ඇඟිලි ගැසුවාය කියා. අද තත්ත්වය කොහොමද? මගේ කොට්ඨාශයේ පොලිසියට බැඳෙන්නට ඉල්ලුම් කළ සුදුසුකම් ඇති ඉතාම දක්ෂ දෙදෙනකු පිටුපස කළ සෙවීම් ගැන මම හොඳට දන්නව. පොලිස් හමුදාවට බැඳෙන්ට ඉල්ලුම් කළ, අධ්‍යාපන හා අනකුත් සෑම සුදුසුකමක්ම ඇති ඒ තනතුරුවලට සුදුස්සන් වූ තරුණයන් දෙදෙනෙක් මේ ළඟදී ඇවිත් මට කියා

කළා, පසුගිය මැතිවරණයේදී ඔවුන් දෙදෙනා වැඩ කළේ මොන පක්ෂයටදැයි දනවා එවන ලෙස එක්සත් ජාතික පක්ෂයේ මා සමග තරඟ කර පරාජය වුණු අපේක්ෂකයාටත්, තවත ඒ පක්ෂයේ නාගරික මන්ත්‍රීවරයකුටත් දන්වා එවා තිබෙනවාය කියා. පසුගය මැතිවරණයේදි මට පක්ෂව වැඩ කළාය කියන කාරණය උඩ, සුදුසුකම් ඇති ඒ තරුණයන් දෙදෙනාට පත්වීම් දී නැහැ. රජයේ රක්ෂාවක් ලැබීමෙන් පසු දේශපාලනය කිරීම වැරදි වෙන්ට පුළුවනි. එහෙත් රක්ෂාවක් නැතිව තමන් නිදහස්ව සිටින කාලයේ තමන්ගේ අදහස් අනුව දේශ පාලන කටයුතුවල යෙදෙන්ට හැමෝටම නිදහසක් තිබෙන්ට ඕනෑ. මා සඳහන් කළ තරුණයන් දෙදෙනා කෙළින්ම මධ්‍යස්ථානයට කැඳවා ඔවුන්ට කියා තිබෙනව, පසුගිය කාලයෙ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට වැඩ කළ නිසා ඔවුන්ට පත්වීම් දෙන්නෙ නැති බව. මේ අන්දමට ඉතාම කැත විධියටයි දන් පත්වීම් කර ගෙන යන්නෙ. මේව අපට සාක්ෂි සහිතව ඔප්පු කරන්ට පුළුවන්.

අද ගොවි හමුදාවට බඳවා ගන්නෙ කොහොමද? මන්ත්‍රීවරුන් ගණනාවක් මේ සම්බන්ධව කථා කළා. ඒක ගොවි හමුදා වක් නොවෙයි; එක්සත් ජාතික පක්ෂයේ හමුදාවක්. අපේ පළාතේ ගොවි හමු දාවට මිනිසුන් බඳවා ගැනීමේ නිලධාරියා මා සමග තරඟ කර පරාජය වුණු එච්. එම්. ජිනදාස මහත්මයායි. ඉල්ලුම් පත්‍ර සකස් කරල රුපියල් 3 ගණනෙ අපේක්ෂකයන් ගෙන් ඔහු අය කර ගන්නව. මිනිහගෙ මල්ල පිරෙනව. එක්සත් ජාතික පක්ෂ යට බැලමෙහෙකම් කළ උදවිය පමණයි මේ හමුදාවට බඳවා ගන්නෙ. අපි අහනව මේක ආණ්ඩුවක්ද, නැත්නම් විහිළුවක්ද කියා. මේ රටේ පමණක් නොව, ලෝකයේ කවුරුවත් පිළිනොගන්න මේ විධියේ කැත වැඩ නොකරන ලෙස අපි ආණ්ඩුවට අවවාද කරනව.

මෙම පේස කර්ම මධ්‍යස්ථානවලට ළමයින් තෝරා ගැනීමේදීත් දේශපාලන පක්ෂය කුමක් වුණත් සුදුස්සන් තෝරා ගන්නා ලෙස මා ඉල්ලනව. ශිෂ්‍ය ගුරුවරුන් බඳවා ගත්ත වගේ, ගොවි හමුදාවට බඳව ගත්ත වගේ, පොලිසියට පත් කර ගන්නා වගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමන්ගේ පක්ෂයට බැලමෙහෙකම් කරන උදවිය මේවාට පත් කර නොගන්න ලෙස මා ඉල්ලා සිටිනවා. තමන්ගෙ පක්ෂයට බැල මෙහෙවරකම් කරන අයවලුන් පමණක් පත් කරගෙන කටයුතු කරන්ට යන්නෙ නැතුව සාධාරණ අන්දමට පත් වීම් කරන හැටියට මා ඉල්ලා සිටිනවා. අපේ කාලෙ අපි ඉතාම ලස්සනට, පිරිසිදුවට, සාධාරණ අන්දමට, කාටත් පිළිගත හැකි ආකාරයට පත්වීම් කළ අන්දම තමුන්නාන්සෙල දන්නව ඇති. [බාධා කිරීමක්] ඒ කාලෙ තමුන්නාන්සෙ හිටියෙ නැහැ. අපි ශිෂ්‍ය ගුරුවරුන් සහ බස් කොන්දොස්තර මහත්වරුන් පත් කළ අන්දම බොහෝ දෙනා දන්නව ඇති. කෙසේ වෙතත්, මේ රටේ ජනතාවගෙ අයිතිවාසිකම් ආරක්ෂා වන අන්දමට ක්‍රියා කරන හැටියට ඉල්ලමින් මගෙ වචන ස්වල්පය අවසාන කරනව.

අ. භා. 6.21

**ගරු විමලා කන්නන්ගර (වැඩබලන සෞඛ්‍ය ඇමතිනි)**

*(கௌரவ விமலா கன்னங்கர—பதில் சுகாதார அமைச்சர்)*

(The Hon. Wimala Kannangara—Acting Minister of Health)

මැහුම් කර්මාන්තය සහ ගෘහ කර්මාන්තය වනිතා පක්ෂයට ඉගැන්වීම පිළිබඳවයි මෙම විවාදය පැවැත්වෙන්නෙ. මෙවැනි අවස්ථාවක මෙම පාර්ලිමේන්තුව තුළ සිටින කාන්තාවන් වන අප අතලොස්ස නිශ්ශබ්දව සිටින එක යුතුකමක් නොවන නිසායි ඊට සහභාගි වන්නට මා ඉදිරිපත් වුණේ.

මට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමා කීවා මෙය පක්ෂයෙ හමුදුවක් ඇති කිරීමට යන වැඩක්ය, තම හිතවතුන්ට රක්ෂා දීමට යොදන වැඩක්ය යන ආදී දේවල්. පුරුෂ පක්ෂයෙ කෙනෙක් හැටියට එවැනි නොයෙකුත් කරුණු ප්‍රකාශ කිරීම අපේ පුදුමයට කරුණක් නොවෙයි. ගම්බද නොදියුණු පළාත්වල මැහුම් පන්ති ව්‍යාපාරය විසි අවුරුද්දකටත් වඩා පවත්වා ගෙන ගොස් පළපුරුද්දක් තිබෙන කෙනෙක් වශයෙන් මට මෙහිලා එක් කරුණක් සඳහන් කරන්ට පුළුවනි. කුමන කුමන රජයයන් පැවතුනත්, රජය මගින් කාන්තාවන්ට තම ඇඳුම් පැළඳුම් හොඳාකාර මසා ගැනීමට උගන්වන්නෙ නැති නිසා, නොයෙක් විට අපට දකින්ට ලැබී තිබෙනවා, කාන්තා සමිති මහිලා සමිති යනාදිය මගින් මැහුම් පන්ති පවත්වාගෙන යන බව. උසස් අන්දමට නොවෙයි සුළු සුළු විශයෙන්—බොත්තමක් අල්ලාගන්ට ඉරිච්ච තැනක් මසා ගන්ට උඩින් පල්ලෙන් ඇඳුමක් සකස් කර ගන්ට—එවැනි ස්ථානවලින් උපදෙස් ලැබෙනවා. නමුත් අද රටේ තිබෙන උසස් මැහුම් සාප්පුවකට හෝ වෙනත් ඕනෑම රෙදි සාප්පුවකට ගියොත් අපට දකින්ට ලැබෙන්නෙ කුමන අන්දමේ මැහුම්ද කියන කාරණය ගැන සිතා බලන විට අපි සිංහලයන් වශයෙන් ලජ්ජාවට පත් විය යුතුයි. ඒවයෙ වැඩි හරියක් තිබෙන්නෙ ඉන්දියන් ටේලර්වරුන් ආදීන් විසින් මසනු ලබන ඇඳුම් බව පේනවා. අධිරාජ්‍යවාදීන්ගෙ යුගයෙ සිට ඒ අන්දමටයි පවතින්නෙ. උසස් සමාජයෙ ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම අඳින්නෙ ඒවයි. ඒ ගැන තර්කයක් වුවමනා නැහැ. අවුරුදු ගණනාවක පටන් අපි නිදහස භුක්ති විඳිනවා. ඒ නිදහසට ගරුත්වයක් ලැබෙන පරිදි අපේ රටේ කාන්තා පක්ෂයට අර ඉන්දියාවෙ එහෙම ඉඳල එන ටේලර්ල තරම්ම දක්ෂ අන්දමින් මැහුම් වැඩ කරන්ට උගන්වා, අද අපේ රටේ සාප්පුවල සිටින එවැනි ටේලර්ල පිටත් කර යවා, ඒ වෙනුවට අපේ සිංහල කාන්තාවන් එහෙම පත් කර ගෙන ක්‍රියා කරන්ට ගන්නා පියවරක් වශයෙන් මෙවැනි පන්ති පවත්වන්ට අපේ ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා සූදානම් වීම ගැන එතුමටත් එක්සත් ජාතික පක්ෂයෙ රජයටත් මා ස්තුතිවන්ත වෙනවා.

අද රටේ මැහුම් පන්ති පවත්වන්නෙ කුමන ආකාරයකටද? අද ඒවායෙ උගන්වන්නෙ හොඳට වැඩ නොදන්න උදවියයි. බොහොම සුළු පඩියකට, සමහරවිට රුපියල් 60ක පමණ පඩියකට තමයි වැඩ කරන්නෙ. මග වියදමට විතරයි එය සෑහෙන්නෙ. ඒ අය එතරම් උගන්වන්ට දන්නෙ නැහැ. ඒ උදවිය දැනගෙන ඕනෑ අනික් අයට උගන්වන්ට. අපේ පළාත්වලත් සිටිනව ගෘහ කර්මාන්ත උපදේශිකාවන්. ඒ අය තැනින් තැනට ගොස් පන්ති පවත්වනව. එක පන්තියක විසි දෙනෙක්වත් නැහැ. මැසිමක් ඇහෙන් දකින්නෙවත් නැහැ, එවැනි තැන්වල ඉගෙන ගන්න අය. එවැනි තැන්වල හැම දාම උගන්වන්නෙ කොච්චට උරයක් මැහීම,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු විමලා කන්නන්ගර]

ලේන්සුවක් මැහීම, නැතිනම් තරමක හැට්ටයක් කපා ගැනීම වැනි දේවලුයි. ග්‍රාම සංවර්ධන සමිතියක් මගින් හෝ වෙනත් කෙනෙකු විසින් හෝ අඩි විස්සක තිහක තරම ශාලාවක් කාගෙන් හෝ කුලියට ලබා ගෙන පවත්වාගෙන යන අත් දමින් මැහුම් පන්ති පවත්වන්න ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා කල්පනා කර නව නම් එවැනි වැඩක් වෙනුවෙන් මෙසේ වියදමක් දැරීම ගැන කිසිවකු විරුද්ධ වේවිය කියා මා සිතන්නේ නැහැ. මසකට රුපියල් පණහ හැට අරගෙන උගන්වන Kathleen School of Dressmaking වැනි උසස් අන්දමේ ස්ථාන ගැන අපි දන්නවා. ඩිප්ලෝමා පන්තිවලට ගොස් සමත් වෙච්ච උදවිය ඒවයෙ සිටිනවා. එවැනි අය සිටින මධ්‍යස්ථාන පවත්වා අපේ ගම්බද කාන්තාවන්ට නොමිලයේ මේ පිළිබඳ උසස් අධ්‍යාපනයක් ලබා දෙනව නම් කාන්තා පක්ෂය ඕනෑ තරම් ඇදී එනවා ඇති. උසස් වෘත්තියක් වශයෙන් එම කර්මාන්තයෙහි යෙදීමෙන් විශාල මුදලක් උපයාගන්ට එතකොට ඔවුන්ට ඉඩ සැලසෙනවා ඇති.

මා වැඩි වේලාවක් කථා කරන්ට බලාපොරොත්තු වෙන්නෙ නැහැ. චීන මිනිසුන් පොට්ටනි අරගෙන ගමක් ගමක් ගානෙ සංචාරය කරනවා අප දැක තිබෙනවා. දැන් කොටුවෙත් චීන මිනිසුන්ගෙ සාප්පු ගණනාවක් තිබෙනව. මොනවාද ඒ මිනිසුන් විකුණන්නෙ? ඒ මිනිසුන් විකුණන එක ඇඳ ඇතිරිල්ලක් රුපියල් 300ක් 400ක් වෙනව. දක්ෂ ලෙස, ඉදිකටුවෙන් මැසූ, එම්බ්‍රොයිඩරි වැඩ දැමූ 'බෙඩ් ස්ප්‍රෙඩ්ස්', 'බෙඩ් ෂීට්ස්', 'ටේබල් මැට්ස්' යනාදිය තිබෙනව. එවැනි දේවල් චීන රටෙන් ලංකාවට ගෙන්වූයේ නැතිවාට අපේ සංස්කෘතියට අනුව අපේ මෝස්තර දමා අපටම නිෂ්පාදනය කරන්ට පුළුවන්. අපේ නිෂ්පාදන ලක්සල වැනි ආයතන මාර්ගයෙන් විකිණීමටත් පුළුවන්. එවැනි වැඩ පිළිවෙළක් සකස් කරන මෙන් මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

නියෝජ්‍ය සභාපතිතුමනි, ස්විට්සර්ලන්තයේ 'ස්විස් එම්බ්‍රොයිඩරි', 'බී. පී. ඕ. ලේස්' යනාදිය කලින් මෙරටට ගෙන්වූ බව මා මතක් කරනවා. ලේස් කර්මාන්තය ගැනත් මේ වාර්තාවේ සඳහන් කර තිබෙනවා. හොඳ ලේස් වර්ගවලට, බිරළුවලට ගාල්ල ප්‍රසිද්ධයි. දකුණු පළාතේ ගරු මන්ත්‍රීවරුන් කීප දෙනෙකුම දැන් කථා කළා. දකුණු පළාතේ තිබෙන ඒ විසිතුරු මැහුම්, බිරළු මැහුම්, සැටින් ලේස් වර්ග දිවයිනේ අනෙක් ප්‍රදේශවලටත් පුරුදු කරවීමට කටයුතු කළ යුතුයි. මේ ලේස් වර්ග දේශ සංචාරකයින්ට විකුණා විශාල අදායමක් ලබා ගැනීමටත් පුළුවනි. ගාල්ල වාගේම කෝට්ටෙත් සැටින් ලේස්වලට ප්‍රසිද්ධයි. මේ ගෘහ කර්මාන්ත දියුණු කර ලංකාවේ අපේ වනිතාවන් විසින් නිෂ්පාදනය කරනු ලබන මැහුම් හා ලේස් වර්ග අපේ රටේ ප්‍රයෝජනයට ගැනීමට වාගේම පිටරටවලට යැවීමටත් ක්‍රියා කිරීම ගැන මෙන්ම ගරු ඇමතිතුමා මේ ගත් පියවර ගැනත් මගේ ස්තුතිය පුද කරනවා.

අ. භා. 6.27

**ආර්. එම්. අප්පුහාමි මයා.** (බණ්ඩාරවෙල)
(திரு. ஆர். எம். அப்புஹாமி—பண்டாரவளை)
(Mr. R. M. Appuhamy--Bandarawela)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන මැහුම් කර්මාන්ත මධ්‍යස්ථාන ගැන වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්ට මමත් බලාපොරොත්තු වෙනවා. ඇත්ත වශයෙන්ම මේ යෝජනාව ගැන ටිකක් කල්පනා කර බලන විට නොදියුණු ප්‍රදේශවලින් පත්වූ මන්ත්‍රීවරුන් හැටියට අපට එක් අතකින් සතුටු වෙන්නට පුළුවන්. නමුත් ක්‍රමවත් සැලැස්මක් නැතිව මේ මධ්‍යස්ථාන ආරම්භ කිරීමෙන් එතරම් සේවයක් කරන්ට පුළුවන් වේවිය කියා අපි කල්පනා කරන්නෙ නැහැ.

කාන්තාවන්ගේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීම සඳහා මේ මැහුම් මධ්‍යස්ථාන ප්‍රයෝජනවත් වෙනවාය කියා මට ප්‍රථමයෙන් කථා කළ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් කියා සිටියා. කාන්තාවන්ගේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳීම සඳහා මේ මධ්‍යස්ථාන ප්‍රයෝජනවත් වෙන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නම් ඇත්ත වශයෙන්ම මේ සම්බන්ධයෙන් මීට වඩා වෙනස් ක්‍රමයක් අනුගමනය කරන්ට ඕනෑ. දන් මේ ක්‍රමය අනුව මැහුම් මධ්‍යසථානයක පුහුණුව ලබන කෙනෙකු එහි අවුරුද්දක් තුළ පුහුණු වෙන්නට ඕනෑ. ඉතා අමරුවෙන් ජීවත් වන කෙනෙකුට මේ විධියට අවුරුද්දක් තුළ පුහුණුවෙමින් කාලය ගත කිරීමට පුළුවන්කමක් නැහැ. අධ්‍යාපනය අවසාන කරලයි, නැත්නම් පසැල් ජීවිතය අවසාන කරලයි, කෙනෙකුට මේ මැහුම් මධ්‍යස්ථානයකට යන්නට සිද්ධ වෙන්නෙ. එවැනි කෙනෙකුට පුහුණු වන කාලය තුළදී අඩු වශයෙන් ජීවන වෘත්තියට සෑහෙන තරමින් යම් මුදලක් ලබා දීමට ක්‍රමයක් සැලැස්වුවහොත් වඩා සුදුසුය කියා මා කල්පනා කරනවා. එවැනි ක්‍රමයක් ඇති කළහොත් ඇත්ත වශයෙන්ම මේ මැහුම් මධ්‍යස්ථාන පිළිබඳව කා තුළත් උනන්දුවක් ඇති වෙනව.

ඒ සමගම, මේ මැහුම් මධ්‍යස්ථානවල පුහුණුව ලබන්නන්ට පුහුණුව අවසානයේ දී ඔවුන් ලබාගත් දැනුම අනුව උගන්වන්නට නම් අඩු වශයෙන් මැෂින් එකක්වත් ලබා ගන්නට පුළුවන් වන විධියට ආධාරයක් කරන්නට ඕනෑ. එවැනි පහසුකම් ලබා නොදුන්නොත් සමහර විට මෙයින් බලාපොරොත්තු වන සේවය හරියාකාරව ඉෂ්ට නොවෙන්නට ඉඩ තිබෙන බව මා මතක් කරන්නට සතුටුයි. ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා ලංකාවේ පේෂ කර්මාන්ත දාහක් ආරම්භ කරන්ට කටයුතු යොදා තිබෙනව. එක් කොට්ඨාශයකට මධ්‍යසථාන හත බැගින් සෑම කොට්ඨාශයකම ඒ මධ්‍යස්ථාන පිහිටුවීමට කටයුතු යොදා තිබෙනව. මගේ ඡන්ද කොට්ඨාශයටත් 7 ක් ලැබුණ. එක් අතකින් මා කණගාටු වෙනව, මා එම කොට්ඨාශයේ මන්ත්‍රීවරයා වන්නට පළමුවෙන් එම යෝජනාව ක්‍රියාත්මක වීම ගැන. බණ්ඩාරවෙල අතුරු මැතිවරණ කාලෙ පුදුම විධියටයි, මේ මධ්‍යස්ථාන ආරම්භ කළේ. මා සමග තරග කළ අපේක්ෂකයා එක්සත් ජාතික පක්ෂයේ සමලේකම් වරයෙක්. ඔහු ඒ එක මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා ඒ ප්‍රදේශයේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායක හැටියට කටයුතු කරන පුද්ගලයකුගේ නායකත්වයෙන් තිබෙන ග්‍රාම සංවර්ධන සමිතියක් මගින් මුල් ගල තැබුව. ඒ මධ්‍යස්ථානය ආරම්භ කිරීමට තැබූ මුල් ගල අදත් තිබෙනව. නමුත් මුල් ගල පමණයි, ගොඩනැගිල්ලක් ඉදි වුණේ නැහැ. ඒ මුල් ගල තබන අවස්ථාවෙ ලොකු උත්සවයක් පැවැත්වූවා. ඒ සඳහා අධාර වශයෙන් ලොකු මුදලකුත් ලබා ගෙන තිබෙනව. මා ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවට දන්වා තිබෙනව, ඒ ලබා ගත් ආධාර මුදල්වලින් කර තිබෙන්නෙ මොනවාද කියා පරීක්ෂා කර බලා ඒ ගැන මට දැනුම් දෙන හැටියට.

කඹුරුපිටියෙ ගරු මන්ත්‍රීතුමා (පර්සි වික්‍රමසිංහ මයා.) කීව, එක්සත් ජාතික පක්ෂයෙ යම් යම් උදවියගෙ වුවමනාවන් ඉෂ්ට කර ගැනීම සඳහා මේ විධියෙ මධ්‍යස්ථාන ප්‍රයෝජනයට ගන්නා බව. එතුමා පමණක් නොවෙයි, තවත් මන්ත්‍රීවරු කීප දෙනෙක්ම ඒ බව මේ ගරු සභාවේ කියා සිටිය. මාත් ඒ පිළිබඳව සඳහන් කරන්ට බලාපොරොත්තු වෙනව. පසුගිය අතුරු මැතිවරණ කාලෙ යම් යම් අවස්ථාවල ක්‍රියා කර තිබෙන්නෙ පුදුම විධියටයි. එවැනි මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා තෝරා ගෙන තිබෙන්නෙ, වැඩි දෙනකුට පහසුවක් හා ප්‍රයෝජනයක් සැලසෙන සථාන නොවෙයි. ඇත්ත වශයෙන්, පොදු සේවයක් බලාපොරොත්තු වන ආයතනයක් ආරම්භ කරනව නම් දේශපාලන වාදයෙන් තොරව කටයුතු කරන්ට ඕනෑ බව මේ අවස්ථාවෙදී මතක් කරන්ට කැමතියි. කඹුරුපිටියෙ ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, විශේෂයෙන් පරාජිත අපේක්ෂකයන්ගෙ දේශපාලන අදහස් අනුව ක්‍රියා කරන බව. බණ්ඩාරවෙල කොට්ඨාශය තුළ අදත් එවැනි බලපෑම් තිබෙන බව මේ අවස්ථාවේදී සඳහන් කරන්ට කැමතියි. අද කෙරෙන්නෙ මොකක්ද? මා සමග තරග කළ අපේක්ෂකයා එක්සත් ජාතික පක්ෂයෙ සම ලේකම්වරයෙක්. එපමණක් නොවෙයි. ඔහුගෙ පුතා මේ ගරු සභාවෙ ගරු මන්ත්‍රීවරයෙක්. කොලොන්න කොට්ඨාශයෙ ගරු මන්ත්‍රීවරයා වශයෙන් පෙනී සිටින්නෙ ඔහුගෙ පුත්‍රයායි. ඒ ප්‍රදේශයේ තිබෙන රජයේ කාර්යාලවලින් ඒ පරාජිත අපේක්ෂකයා නොයෙක් විධියෙ අයුතු ප්‍රයෝජන ගන්නව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එම්. අප්පුහාමි]

පිං පඩි, තුවක්කු බලපත්‍ර ආදී නොයෙක් දේවල් ලබා ගැනීම සම්බන්ධයෙන් ඔහු මැදිහත් වෙනව. මේක ලොකු කරදරයක්. අදත් බණ්ඩාරවෙල කොට්ඨාශය තුළ එවැනි දේශපාලන බලපෑම් සිදු වීම ගැන මා කණගාටු වෙනව. එක්සත් ජාතික පක්ෂයෙ යම් යම් වැඩ පිළිවෙළවල් ඉටු කර ගැනීම සඳහා එවැනි බලපෑම් කිරීම පහත් ක්‍රියාවක් හැටියට පෙන්වා දෙන්ට කැමතියි. මීට කලින් නොයෙකුත් දේශපාලන බලපෑම් අනුව නොයෙක් විධියෙ මධ්‍යස්ථාන ඇති කළා වාගෙ නොවෙයි, මැහුම් මධ්‍යස්ථාන ආරම්භ කිරීමේදී දේශපාලන වාදයෙන් තොරව කටයුතු කළොත් එයින් ඒ ප්‍රදේශයේ දියුණුවක්, උන්නතියක්, අභිවෘද්ධියක් ඇති වන බව පෙන්වා දෙන්ට කැමතියි.

මේ යෝජනාවෙන් කියැවෙන හැටියට අවුරුද්දක පුහුණුවක් දෙන ජංගම මධ්‍යස්ථාන ඒ ඒ ඡන්දදායක කොට්ඨාශවල ආරම්භ කරන්ට යනව. මගේ කොට්ඨාශය ගැන කල්පනා කර බලන විට අඩු වශයෙන් මධ්‍යස්ථාන 50 ක් ආරම්භ කරන්ට සිද්ධ වෙනව. ඒ අවස්ථාවලදී ඒ සඳහා අවශ්‍ය ගොඩනැගිලි හා අනෙකුත් පහසුකම් සලසන්නටත් සිදු වෙනව. එක කොට්ඨාශයක් සඳහා මධ්‍යස්ථාන 50ක් පමණ ආරම්භ කරන්ට සිදු වෙනව නම් ඒ කොට්ඨාශයේ අන්තිම මධ්‍යස්ථානය පිහිටුවන ප්‍රදේශයේ ජනතාවට ඒ ප්‍රයෝජනය ලැබෙන්නෙ, මුල් මධ්‍යස්ථානය පිහිටුවා අවුරුදු 50 කට පස්සෙයි. ඒ අනුව බලන විට පෙනී යනව මෙම ජංගම මධ්‍යස්ථාන වලින් ඒ තරම් විශාල සේවයක් අපට බලාපොරොත්තු වන්න බැරි බව. ඒ කෙසේ වුවත් දේශපාලන භේදයෙන් තොරව ප්‍රදේශයෙ උන්නතිය සඳහා, ප්‍රදේශයෙ ජනතාවගෙ යහපත සඳහා, ප්‍රදේශවාසීන්ගෙ අභිවෘද්ධිය සඳහා කාටත් ප්‍රයෝජනවත් වන හැටියට මෙය ක්‍රියාත්මක කරනවා නම්, එක්තරා දේශපාලන පක්ෂයකට පමණක් ගැතිකමක් නොදක්වා පක්ෂ භේදයෙන් තොරව කටයුතු කරනවානම් ඇත්ත වශයෙන්ම මෙයින් ලොකු සේවයක් සිදු වන බව මේ අවස්ථාවේදී මතක් කරනව.

පරිපූරක මුදල

ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යන එවැනි මධ්‍යස්ථානයක් දැනට අපේ ප්‍රදේශයෙ තිබෙනව. ජංගම වශයෙන් නොවෙයි, එක්තරා ස්ථානයකයි පිහිටුවා තිබෙන්නෙ; නමුත් මෙයින් ප්‍රයෝජනය සැලසෙන්නෙ අතලොස්සකට පමණයි. ඇත්ත වශයෙන්ම මෙම මධ්‍යස්ථානයෙ නියම විධියෙන් වැඩක් කෙරෙනවාය කියා අපට පෙනෙන්නෙ නැහැ. සමහර විට මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමේදී දැනට පිහිටුවා ඇති මධ්‍යස්ථානය ගැන කල්පනා කර බණ්ඩාරවෙල ප්‍රදේශයට මධ්‍යස්ථානයක් නොලැබී යන්නටත් පුළුවනි. එම නිසා, අලුතෙන් මධ්‍යස්ථාන විවෘත කිරීමේදී අප බලාපොරොත්තු වන හැටියට සෑම මන්ත්‍රී කොට්ඨාශයකම අඩු වශයෙන් එක මධ්‍යස්ථානය බැගින්වත් පිහිටුවන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනව.

අ. භා. 6.37

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අලුතෙන් මැහුම් මධ්‍යස්ථාන 83ක් ආරම්භ කිරීම පිළිබඳව ගෙනෙන ලද යෝජනාව ගැන කථා කරන්න මගේ බලාපොරොත්තුවක් කලින් තිබුණේ නැහැ. මක්නිසාද ? කාන්තාවක් හැටියට මෙබඳු යෝජනාවකට විරුද්ධත්වය දක්වන්න මට පුළුවන්කමක් නැහැ. එහෙත් යෝජනාව ක්‍රියාත්මක කිරීමේදී ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාගෙ අවධානය යොමු කළ යුතු කාරණා කීපයක් ගැන පමණක් සඳහන් කිරීමටයි මම අදහස් කරන්නෙ.

මැහුම් මධ්‍යස්ථාන 83ක් ආරම්භ කරන්න එතුමා බලාපොරොත්තු වුණත්, මෙය අමුතු දෙයක් නොවෙයි. දැනටමත් මධ්‍යස්ථාන 68ක් මේ රටේ ආරම්භ කර තිබෙන බව කවුරුත් දන්නව—ඒ බව මෙම යෝජනාවෙ සඳහන් වෙනව. මේ වැඩ පිළිවෙළ සඳහා රුපියල් ලක්ෂ තුනක් පමණ මුදලින් වැය කිරීමට කල්පනා කළත්, මෙයින් නියම ප්‍රතිඵල ලැබේද යන්න ගැන අප තුළ ලොකු සැකයක් තිබෙනවා. මක්නිසාද ? එක් ජංගම මැහුම් මධ්‍යස්ථානයක් අවුරුද්දක කාලයක් එක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගමක තබා අනික් අවුරුද්දෙ වෙනත් ගමකට ගෙන යනව. මෙම යෝජනාවෙ හැටියට, පුහුණුවීමට අවස්ථාව ලබා දෙන් නෙත් එක් ආසනයක තිස් දෙනකුට පමණයි. එක් ගමකින් තිස් දෙනකු තෝරා ගෙන ඒ අයට පුහුණුවක් දෙන්න රජය බලාපොරොත්තු වෙනවා නම්, ඇත්ත වශයෙන්ම එයින් ගම්වල සිටින දුප්පත් කාන්තාවන්ට නියම සේවයක් සිදු වන වාද කියා කල්පනා කර බලන්න ඕනෑ.

සමහර ගම්වල ජීවත් වන දුප්පත් කාන්තාවන් ගැන බැලූ වාම මෙයින් නියම ප්‍රතිඵලයක් ඒ අයට ලබාගන්න පුළුවන් වේවිද කියන සැකයක් ඇති වෙනව. මෙවැනි මැහුම් මධ්‍යස්ථානයකට ආණ්ඩුවෙන් සපයන්න යන්නෙ එක් මහන යන්ත්‍රය කුත්, කතුරකුත්, මනින වේප් පටියකුත්, ආදී වශයෙනුයි. එක් මැෂිමකින්, එක් කතුරකින්, එක් වේප් පටියකින් තිස් දෙනකු පුහුණුව ලබන්නෙ කොහොමද? තිස් දෙනකු පුහුණුව ලබනවා නම් කතුරු තිහක් නැතුව වැඩ කරගෙන යන්න බැහැ. එහෙම නම් තමන්ට අවශ්‍ය බඩු බාහිරාදිය, කතුරු, අවශ්‍ය රෙදිපිළි, එසේ පුහුණු වන අයට ගෙනෙන්න සිඩ වෙනව තමන්ට වුවමනා කරන මෝස්තරයක් කපන්න, හැට්ටයක් කපන්න, ගවුමක් මහන්න, තමන්ගෙ ළමයකුට කලිසමක්, කමිසයක් කපන්න මහන්න තමන්ටම රෙදි ගෙනෙන්න සිද්ධ වෙනව. නමුත් රෙදි කැබැල්ලක් මිල දී ගන්න තරම්වත් වත්කමක් නැති කාන්තාවන් ගම්වල සිටිනව. එම නිසා නියම ප්‍රතිඵල ගම්වල කාන්තාවන්ට ලැබේද කියා අප තුළ ලොකු සැකයක් තිබෙනව. සමහර විට ආණ්ඩු පක්ෂයෙ අය අපෙන් ප්‍රශ්න කරන්න පුළුවනි, අපේ ආණ්ඩු කාලයෙත් තිබුණෙ මෙහෙම නොවෙද කියා. තිබුණු බව ඇත්ත. යම් යම් දුර්වලකම් අපට පෙනී ගිය නිසා තමයි, අප ඒවා පෙන්නුම් කර අඩුපාඩුකම් නැති අන්දමට සකස් කර ඒවායින් නියම ප්‍රයෝජනයක් ගම්බද කාන්තාවන්ට ලබාගන්න හැකි අන්දමට සකස් කරන ලෙස මතක් කරන්නෙ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙවැනි මැහුම් පංක්තිවලින් ගම්බද කාන්තාවන්ට නියම ප්‍රයෝජනයක් ලැබෙන්න නම්,

භාණ්ඩාරවෙල මන්ත්‍රීතුමා කීවා වාගේ, පුහුණුව ලබා ගත්තාට පසු තමන්ගෙ ගෙදර ඉඳගෙන මුදලක් සම්භ කර ගැනීමට හැකි වන අන්දමට පුහුණුවෙන් නියම ප්‍රයෝජන යක් ලබාගන්නට පුළුවන් අන්දමට මහන යන්ත්‍රයක් ලබාගැනීමට ක්‍රමයක් සල සන්න ඕනෑ. ඒ උදවියට මහන යන්ත්‍ර යක් මිල දී ගන්න පුළුවන්කමක් නැහැ. එම නිසා සුළු මුදලක් ගෙවා හෝ මොන යම් ක්‍රමයක් අනුගමනය කර හෝ ඒ උදවියට මහන යන්ත්‍ර සපයා දෙන්න වැඩ පිළිවෙලක් සකස් කළොත් මෙම යෝජනා වෙන් නියම ප්‍රතිඵල ලබාගන්න පුළුවනි; එයින් ඒ කාන්තාවන්ට නියම ප්‍රයෝජනයක් සැලසෙනව. ඒ වාගේම ගම්බද උදවියගෙ රැකීරක්ෂා ප්‍රශ්නය බොහෝ දුරට එමගින් විසඳා ගන්නට පුළුවන් වෙනවාට කිසි අනුමානයක් නැහැ. අන්න ඒ යෝජනාව කිරීම පිණිසයි මේ අවස්ථාවේදී මා නැඟී සිටියෙ. මේ යෝජනාව ගැන මෙයට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්න මම බලාපොරොත්තු වෙන්නෙ නැහැ. අන්න ඒ ගැනත් ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා කල්පනා කළොත් එයින් ප්‍රයෝජනයක් වෙනවා ඇති. වැඩිපුර මුදලක් වියදම් වන්නෙ නැහැ. තව ලක්ෂ 3 ක් පමණ වියදම් කරන්න ලෑස්ති නම් මේ අදහස ඉටු කර ගන්න පුළුවන්.

රත්ගම ගරු මන්ත්‍රීතුමා (ඩී. ඊ. තිලක රත්න මයා.) කිව්වා, මැහුම් පන්තිවල මහන දේවල් අලෙවි කිරීම ලක්සල වැනි තැනකට පවරන්නය කියා. අවුරුද්දක පුහුණුව ලබන අතර මහන දේවල් ලක්සල වැනි තැනක තබා විකුණන්න පුළුවන් වේය කියා මම හිතන්නෙ නැහැ. එහෙම බලාපොරොත්තු වෙනවා නම් ඒක වැරදියි. ඒ අය පුහුණුව ලබා ගත් පසු මැෂින් එකක් සැපයීමෙන් ඒ අය ලබා ගත් දැනීමෙන් ප්‍රයෝජන ගැනීමට මාර්ගයක් සල සනවා නම් එයින් විශාල සේවයක් සැලසෙනවා ඇති. රුපියල් ලක්ෂ 3 ක් වියදම් කර පුහුණුව ලැබූ ගම්බද කාන්තාවන්ට සමුපකාර සමිති මගින් හෝ මැෂින් එක බැගින් ලබා දෙන්න පුළුවන් නම් තමයි මේ වැඩ පිළිවෙලෙන් ප්‍රයෝජනයක් ලැබෙන්නෙ. එසේ නැත්නම් මේ පුහුණුව ලබා ගෙවල්වලට වී සිටින්නයි, සිදු වන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සිරිමාවෝ බණ්ඩාරනායක මිය.]

වැඩ බලන ගරු සෞඛ්‍ය ඇමතිතුමී කිව්වා, බී. පී. ඕ. ලේස් ආදිය දැන් පිට රටවලින් ගෙන්වනවාය, ඒ වා ගෙතීම පුහුණු කරනවා නම් ඒ වා ගෙන්වීම නවත් වන්න පුළුවන්ය කියා. ඒ ලේස් ගෙතීම අතින් කරන්න බෑ. මැෂින්වලින් කරන්න ඕනෑ. බීරලු කොට්ටය බැගින් ඒ අයට දී රේන්ද පටි ගෙතීම පුරුදු කරනව නම් එයින් ලොකු ප්‍රයෝජනයක් ලැබෙනව. ඒ රේන්ද පටි පිටරටින් ගෙන්වන්නෙ නැති නිසා ඒ කර්මාන්තය දියුණු කරනව නම් එයින් ලොකු ප්‍රයෝජනයක් ලැබෙනව. බීරලු කොට්ටයක් ගන්නවත් ආදායමක් නැති ගම්බද කාන්තාවන් ඉන්නව. ඒ අයට බීරලු කොට්ට ගැනීමට ආධාර කර නවා නම් එයින් ඔවුන්ට විශාල ප්‍රයෝජනයක් ලැබෙනව.

මේ මැහුම් පන්ති ඇති කිරීමේ යෝජනාවට අපි විරුද්ධ වන්නෙ නැහැ. මේ යෝජනාව ගැන අපි බොහොම සන්තෝෂයි. මේ යෝජනාවෙන් නියම ප්‍රයෝජන ලබා ගැනීමට ගරු ඇමතිතුමා මේ කරුණුත් කල්පනාවට භාජන කරනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනව.

අ. භා. 6.43

**සී. රාජදුරෙයි මයා.** (මඩකලපුව පළමුවන මන්ත්‍රී)

*(திரு. சீ. இராஜதுரை—மட்டக்களப்பு முதலாம் அங்கத்தவர்)*

(Mr. C. Rajadurai—First Batticaloa)

அக்கிராசனரவர்களே, உள்நாட்டு விவகார அமைச்சின் கீழ் உள்ள கிராம அபிவிருத்தித் திணைக்களம் பற்றி இன்று சில வார்த்தைகள் பேச எனக்கு வாய்ப்புக் கிடைத்தமை பற்றி மகிழ்ச்சியடைகிறேன். பல விடயங்களை இங்கு குறிப்பிட இருந்துங்கூட, கால நேரத்தை உத்தேசித்து இரண்டொரு விடயங்களை மட்டும் உங்களுடைய கவனத்துக்குக் கொண்டு வர விரும்புகிறேன்.

உள்நாட்டு விவகார அமைச்சர் சமீபத்தில் நாடு பூராவிலும் நெசவு நிலையங்களை அமைத்த பொழுது, அந்நெசவு நிலையங்கள் ஆளும் கட்சியினரின் பகுதிகளுக்கு மட்டுமல்லாமல், எதிர்கட்சியினரின் தொகுதிகளுக்கும், தொகுதிக்கு ஏழு நெசவு நிலையங்கள் என அமைச்சர் அவர்கள் அமைத்ததிலிருந்து ஒன்று தெரிகின்றது. நாடு பூராவும் எதிர் காலத்தில் அபிவிருத்தியும் முன்னேற்றமும் அடைய வேண்டும் என்ற நல்நோக்கத்துடன் தான் அமைச்சர் அவர்கள் நெசவு நிலையங்களைத் தொகுதிக்கு 7 வீதம் அமைத்தார்கள்.

தையல் பயிற்சி நிலையங்கள் நிறுவும் திட்டத்தை நாங்கள் பார்க்கும்பொழுது, நாட்டில் கடந்த காலத்தில் இயங்கிக்கொண்டிருந்த 68 நிலையங்களுடன் மேலும் 83 நிலையங்களை அதிகரித்து தொகுதிக்கு ஒரு நிலையம் வீதம் அமைப்பதற்கு அமைச்சர் அவர்கள் முன்வந்திருப்பது தெரிகிறது. இது அவருடைய பரந்த மனப்பான்மையைத்தான் காட்டுகிறது. இதில் எந்தவிதமான அரசியல் பாகுபாடோ அரசியல் கட்சிப் பாகுபாடோ இருப்பதாக என்னைப்பொறுத்த அளவில், தெரியவில்லை.

கிராமப்புறங்களின் பொருளாதாரம் மிகவும் மோசமான நிலையில் இருந்துவருவதை நாங்கள் மிகவும் அனுதாபத்துடன் கவனிக்க வேண்டியவர்களாக இருக்கிறோம். கிராமப் புற மக்களுக்கு என்று உருவாக்கப்பட்ட திட்டங்கள் நல்ல முறையில் செயல்படுத்தப்படாத காரணத்தால் கிராமப்புறங்கள் இன்னும் பின்தங்கிய நிலையிலே இருக்கின்றன என்பதை மிக வருத்தத்துடன் நான் கூற விரும்புகிறேன். அரசாங்கம் அமைக்கின்ற திட்டங்கள் கிராமப் புற மக்களுடைய பொருளாதாரத்தை உயர்த்துவதற்கும் அவர்களுடைய வாழ்க்கை வசதிகளை அதிகரிப்பதற்குமாகத்தான் என்று இங்கே வர்ணிக்கப்படுகிறது. இருப்பினும் கிராமப்புறங்களின் நிலைமையில் இன்னும் மாற்றம் ஏற்பட்டிருப்பதாகத் தெரியவில்லை.

கௌரவ எதிர்க்கட்சித்தலைவி பேசியபொழுது கிராமப் புறங்களில் வாழுகின்ற ஏழைப் பெண்மணிகளின் நிலைமையை எடுத்துக்கூறினர். அவர்களுடைய வாழ்க்கையில் இத்தகைய பயன் நேரடியான ஒரு மாறுதலை ஏற்படுத்தக்கூடுமானல், அது உண்மையில் கிராமப் புற மக்களுக்குச் செய்கின்ற ஒரு பெரிய சேவையாகக் கருதக்கூடியதாக இருக்கும். இன்று, என்னுடைய தொகுதியை எடுத்துக்கொண்டால் அங்கு 20 க்கு மேற்பட்ட கிராமப் புறப் பாடசாலைகள் இருக்கின்றன. இவற்றில் ஒன்றிலாவது பெண் குழந்தைகளுக்குத் தையல் படிப்பிப்பதற்குப் பெண் ஆசிரியர்கள் இல்லை. இந்நிலையில் கடந்த பத்து ஆண்டுகளாகக் கிராமப் புறப் பாட

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

சாலைகள் இருக்கின்றன. இப்படியான குறையுள்ள கிராமப் புறப் பகுதியிலுள்ள பெண் குழந்தைகள் தையல் கலையைப் படிப்பதற்கும் அந்தக் கலையைக்கொண்டு கிராமத்தில் தொழில் செய்து தமது வாழ்க்கையிலுள்ள கஷ்டங்களைப் போக்குவதற்கும் ஒரு வசதியை அளிக்கக்கூடிய முறையில் இத்திட்டம் அமையக்கூடுமானால், உண்மையில் இது வரவேற்கக்கூடிய திட்டமாகும். அதிலும் பயிற்சி பெற்று வெளியேறிய பின்பு, கௌரவ எதிர்க் கட்சித்தலைவி சொன்னது போல, தையல் இயந்திரங்களைக் கட்டணப்பண மூலம் மிகச் சுலபமான முறையில் இக்கிராமப் புறங்களிலுள்ள பெண்மணிகள் பெறக்கூடிய வகையிலே அரசாங்கம் திட்டங்களை அமைத்தால், இத்திட்டம் சிறந்த முறையில் வெற்றி அளிக்கக்கூடியதாக இருக்கும். மற்றும் கிராமப்புறங்களில் செய்யப்படுகின்ற உடைகள், கொழும்பிலிருக்கின்ற "லக்சல" போன்ற நிலையங்களில் கிடைக்கின்ற நகர மங்கைகள் பாவிக்கும் உடைகள்போல் இல்லாவிட்டாலும்கூட அவற்றைக் கிராமப்புறச் சந்தைகளை உருவாக்கி அங்கு விற்கக்கூடிய முறையில் திட்டம் உருவாக்கலாம்.

அடுத்ததாக, கைத்தொழில் திணைக்களத்தின் கீழ் நான் குறிப்பிட விரும்புவது இத் திணைக்களத்திற்கு அப்பாற்பட்ட ஒரு விஷயமாக இருப்பினும் கூட, இலங்கை முழுவதற்குமே சம்பந்தப்பட்ட விடயமாக இருப்பதால் நான் இவ்விடயத்தைக் கௌரவ சபையின் கவனத்துக்குக் கொண்டுவரவிரும்புகிறேன். சமீபத்தில் உள்நாட்டு விவகார அமைச்சர் நாடுபூராவும் 1,000 கைத்தறி நிலையங்களை அமைத்தார். ஆனால், அவற்றில் படிப்பிக்கக் கூடிய போதனாசிரியர்களை உருவாக்குவதற்கு நாடு பூராவும் ஆறு பயிற்சிக் கல்லூரிகள்தான் இருக்கின்றன. இப் பயிற்சிக் கல்லூரிகளிலிருந்து வெளி வருகின்றவர்கள்தான் போதனாசிரியர்களாக மேற்படி நிலையங்களில் கடமையாற்றக்கூடியவர்களாக இருக்கிறார்கள். வடக்கு, கிழக்கு மாகாணங்களைப் பொறுத்தவரையில், ஒரேயொரு பயிற்சி நிலையம் மட்டுமே இருக்கின்றது. இந்தப் பயிற்சி நிலையத்தில் ஆண்டு ஒன்றுக்கு 30 பேர் பயிற்சி பெற்று வெளியேறுகிறார்கள். வெளிநாடுகளிலிருந்து இறக்குமதி செய்யும் துணிகளுக்கு கட்டுப்பாடு இருக்கின்ற இந்நேரத்தில், இந்நாட்டில் கைத்தொழில் பயிற்சி நிலையங்களை மேலும் அதிகரிக்க வேண்டுமென்று நான் கேட்டுக்கொள்ள விரும்புகிறேன். அப்படி அதிகரிக்கப்படும்போது நெசவுப் பயிற்சி நிலையங்களும் அதிகரிக்கப்பட வேண்டும். இதனைச் செய்வதற்குத் திணைக்களத்திற்குத் தேவையான உபமான்யப் பிரேரணையைக் கொண்டு வரவேண்டுமென்று கௌரவ அமைச்சர் அவர்களை நான் கேட்டுக்கொள்கிறேன். மட்டக்களப்பைப் பொறுத்த அளவில் ஒரு நெசவுப் பயிற்சி நிலையம் அங்கு நிறுவப்படவேண்டு மென்பதும் கௌரவ அமைச்சர் அவர்களுக்கு நான் விடுக்கும் வேண்டுகோளாகும். கிராமப்புற மக்களுக்கு விமோசனமளிக்கின்ற இங்கே விவாதிக்கப்படுகின்ற பிரேரணையை இக்கௌரவ சபையின் இரு பக்கங்களிலுமுள்ள அங்கத்தவர்கள் அனைவரும் ஏற்றுக்கொள்ள வேண்டுமென்று கேட்டு எனது பேச்சை முடித்துக் கொள்கிறேன்.

අ. භා. 6.49

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
**(Dr. N. M. Perera)**

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් අතික් අයට වෙනස් අදහසුයි මා ළඟ තිබෙන්නේ. මගේ හැඟීමේ හැටියට නම් මේ වැඩ පිළිවෙළ ඒ තරම් පැහැදිලි නැහැ. කරන්නට බලාපොරොත්තු වන්නේ මොනවාද ?

මගේ අත්දැකීමක් ගැන කියන්නට කැමතියි. මා නියෝජනය කරන කොට්ඨාශයේ මැහුම් පන්ති දියුණු කිරීමට මා යම් මහන්සියක් දරා තිබෙනවා. ආණ්ඩුවේ ආධාර ලබන මැහුම් පන්ති පමණක් නොව ඊට පිටස්තර වශයෙන් ළමයින් එකතු වී පවත්වාගෙන යන මැහුම් පන්තිත් තිබෙනවා. මටත් පුළුවන් විධියට ඒවාට ආධාර කර තිබෙනවා. මැෂින් සොයා ගන්නට උදව් කර තිබෙනවා. බොහෝ විට මැෂින් යන්නෙ ණයටයි. පෙරදී නම් සිංගර් කොම්පැනියෙන් ඒවා ණයට ගැනීම අමාරු නැහැ. නමුත් දැන් නම් බොහොම අමාරුයි. මේ පෞද්ගලික මැහුම් පන්තිවලින් කෙරෙන නිෂ්පාදන අලෙවි කර ගන්නට මාර්ගයක් නොමැති වීම මෙහි ඇති ලොකුම අඩුපාඩුවයි. මා එක් අවස්ථාවකදී මේ ගැන කෑගල්ලේ උප ඒජන්තතුමා සමග සාකච්ඡා කොට ඒ නිෂ්පාදනය කරන බඩු අලෙවි කර ගැනීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

සඳහා ඔහුගේ කාර්යාලය මගින් වැඩ පිළිවෙළක් යොදන ලෙස මතක් කළා. නමුත් එය හරියාකාර ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ බඩු අලෙවි කර ගැනීම සඳහා වෙළෙඳ දෙපාර්තමේන්තුව අපට ආධාර කළෙත් නැහැ.

මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මගේ අදහස් ටිකක් වෙනස් බව කියන්නේ මේ කයි; අපේ ගම්බද ළමයින් දැන් පරණ තත්වයෙන්ම නැහැ. වැඩ බලන සෞඛ්‍ය ඇමතිනිය ඒ බව දන්නවා ඇති. දැන් ඒ අය සෑහෙන දුරට දියුණු වී සිටිනවා. ඔවුන් දැන් සාරි හදන්නට, හදන සාරිවල අලුත් මෝස්තර යොදන්නට පුරුදු වීගෙන යනවා.

ඉතින් මේ කරුණු ගැන කල්පනා කරන විට අප ප්‍රශ්න කීපයක් මිශ්‍ර කර ගන්නා බව මට පෙනෙන්නට තිබෙනවා. තමන්ගේ හැට්ට මසා ගැනීම, ගවුම් ආදිය මැසීම වැනි සුළු සුළු වැඩ කර ගන්නට, මූලික දැනුමක් ලබා ගැනීම සඳහා සතුටු අය ගම්වල සිටින බව පිළිගන්නට ඕනෑ. ඒ සම්බන්ධයෙන් අවුරුදු කීපයක සිට මා වැයම් කළ කාරණයක් ගැන වැඩ බලන සෞඛ්‍ය ඇමතිනියට මතක් කර දිය යුතුව තිබෙනවා. අපේ ආරෝග්‍යශාලාවල නැත්නම් මාතෘ නිවාසවල ගර්භණී මාතාවන් සෑහෙන පිරිසක් සිටිනවා. ඇතැම් විට මේ ගර්භණී මාතාවන් සති ගණනක් නැත්නම් මාස ගණනක් ආරෝග්‍යශාලාවේ සිටිනවා. ඔවුන් ආරෝග්‍යශාලාවලට වී වැඩක් නැතිව සිටින අවස්ථාවේදී ඔවුන්ට මැහුම් උගන්වන්නට පුළුවනි. ඔවුන් ඉගෙන ගන්නටත් සතුටු වේවි. බබාලාගේ ඇඳුම් ආදිය සාදන්නටත් කැමති වේවී. ඒ වගේම ඒවා උගන්වන්නට දක්ෂ අය ගම්වලින් සොයා ගන්නට පුළුවනි. විශාල වැටුපක් නොදුන්නාට සෑහෙන දැනුමක් ඇති තරුණියන් ආරෝග්‍යශාලා අසලින් සොයා ගන්නට පුළුවනි. ඔවුන්ට සුළු වේතනයක් දීම ප්‍රමාණවත් විය හැකි වුණත්, රෙදිපිළි ගැනීම සඳහා ආධාර දෙන්නට සිද විය හැකියි. අප ආධාර කරනවා නම් මේ මූලික වැඩ කටයුතු කරන්නට පුළුවනි. ඉතින් මේ වැඩ පිළිවෙළින් බලාපොරොත්තු වන්නේ ඒ මූලික වැඩ බව මා දන්නෙ නැහැ. මූලික වැඩ කරන්නට බලාපොරොත්තු වෙනවා නම් එය ප්‍රයෝජනවත් බව කියන්නට ඕනෑ.

දැනට මේ මැහුම් පන්තිවලට යන්නට බලාපොරොත්තු වන්නේ ඒ ඉහත්තේ සිටි තත්ත්වයට වඩා උසස් තත්ත්වයට පැමිණෙන්නට අදහස් කරන උදවියයි. කොළඹ ප්‍රදේශයේ මේ වැඩ සඳහා උසස් ස්ථාන තිබෙනවා. "කැතලීන් ස්කූල්" එක වගේ උසස් ස්ථාන තිබෙනවා. කොළඹ ප්‍රදේශයේ තවත් සෑහෙන ප්‍රමාණයක් ස්කෝල තියෙනව. අපේ ළමයින් දැන් ඉගෙන ගන්න යන්නෙ ඒවාටයි. අද දවසේ මේ යෝජනාවෙන් අදහස් කරන විධියේ ස්කෝලවලට යන්න ළමයි සූදානම් නැහැ. අපේ පාසල්වලින් දැන් පිට වන තරුණියන්ට මේ වැඩ පිළිවෙළ මදි. මීට වඩා උසස් තැනකට යන්නයි, ඒ අය බලාපොරොත්තු වන්නෙ. ඒ නිසා මීට වඩා ගැඹුරු වශයෙන් කල්පනා කර මේ වැඩ පිළිවෙල ක්‍රියාවේ යොදවනවා නම් හොඳයි. මුදල් අපතේ යන්න එපාය කියා මම කරුණාවෙන් ඉල්ලා සිටිනව.

රත්ගම ගරු මන්ත්‍රීතුමා (ඩී. ඊ. තිලකරත්න මයා.) කී දේ මම තරමක් දුරට පිළිගන්නවා. ඉගෙන ගන්න කාලයේදී හදන දේ අලෙවි කිරීම කෙසේ වෙතත්, ඉගෙන ගත්තාට පසු හදන දේ අලෙවි කරන්න මාර්ගයක් සැලැස්සුවේ නැත්නම් මේ වැඩ පිළිවෙළින් ප්‍රයෝජනයක් ලබා ගන්න බොහොම අමාරුයි. පාසල්වල පවත්වන නොයෙක් අත්කම් ප්‍රදර්ශන බලන්න වැඩ බලන ගරු සෞඛ්‍ය ඇමතිතුමී ගිහින් ඇති. මීට අවුරුදු 10 කට 15 කට පෙර ඒ විධියේ ප්‍රදර්ශනවල දකින්න ලැබුණු දේවලට වඩා බොහොම දියුණුයි, දැන් ඒ ප්‍රදර්ශනවලදී දකින්න ලැබෙන දේවල්. මැහුම් ගෙතුම් සම්බන්ධව ඒ ළමයින්ගේ දැනීම ඉස්සරට වඩා සෑහෙන ප්‍රමාණයකින් දියුණු වී තිබෙන බව පෙනෙනව. දැන් ඒ ළමයින්ට කිව්වොත් හැට්ටයක් කපා මහන්න ඉගෙන ගන්නය කියා, ඒක විහිළුවක් හැටියට සලකාවි. ඒ අය කවදාවත් ඒකට එන්නෙ නැහැ. මේ ගැන මීට වඩා වැඩගත් අන්දමට සලකා බලා සැලසුම් වැඩ පිළිවෙළක් ක්‍රියාවේ යොදනවා නම් මීට වඩා ප්‍රයෝජනවත් වෙයි. මේ අදහස් කර තිබෙන දේ මගේ සිතේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අන්දමට නම් බොහොම මදි. දනට දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කරන ප්‍රදර්ශිකාවන් ඒ තරම් දක්ෂය කියා මට කියන්න පුළුවන්කමක් නැහැ. අපේ පළාත්වල තිබෙන මැහුම් පන්තිවලට ගොස් ඒවායෙහි කෙරෙන කටයුතු ගැන සොයා බැලීමෙන් ලැබූ පළ පුරුද්දක් මට තියෙනව. ඒ අනුව මට කියන්නට පුළුවනි, මේ වැඩ පිළිවෙලින් නම් අපට තෘප්තියට පත්වන්නට පුළුවන්කමක් නැති බව. එක අතකින් ස්වදේශ කටයුතු බාර ගරු ඇමතිතුමා මෙහි නොසිටීම කණගාටුවට කරුණක්. මේ තත්ත්වය එතුමාට පැහැදිලි කර දුන්නොත්, මේ විය දම් කරන මුදලින් මට වඩා ප්‍රයෝජනයක් ලැබෙන අන්දමට වැඩ පිළිවෙළ සකස් කිරීම සඳහා එතුමා මේ යෝජනාව නැවත සලකා බලනව ඇති. දැන් තිබෙන තත්ත්වය අනුව නම් මෙය මුදල් අපතේ දැම්මක් බවයි මට පෙනෙන්නෙ.

"එලාම් ක්ලෝත්" යනුවෙන් අලුත් රෙදි වර්ගයක් ගැන මෙහි 5 වැනි පිටුවෙහි දක්වා තිබෙනව. මා හිතන හැටියට, "එලාම් ක්ලෝක්" යන්න වැරදීමකින් එසේ සඳහන් වී තිබෙනව. මෙය අමුඩ ලේන්සු ගැන සඳහන් කිරීමක් වෙන්න බැහැ. මේ ගැන දක්වා තිබෙන සැලකිල්ලේ තරම එයින් පෙනෙනව. සාකච්ඡා කිරීම සඳහා මේ ගරු සභාවට එවන ලියකියවිලිවල සඳහන් වන දේ ගැන දක්වන්නෙ ඔය විධියෙ සැලකිල්ලක් නම් මේ ප්‍රශ්නය ගැන දක්වා තිබෙන්නෙ කොයි විධියෙ සැලකිල්ලක්ද යන්න අපට වටහා ගන්න පුළුවනි. මේ යෝජනාව සම්මත වුණත්, දැන් මේ තියෙන තත්ත්වයෙන්ම එය ක්‍රියාවෙ යොදවන්නට එපාය කියන එකයි මගෙ කාරුණික ඉල්ලීම. නල්ලූර්හි ගරු මන්ත්‍රීතුමා කීවාක් මෙන් ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමාට මේ සම්බන්ධව දැනීමක් නැතත් සෞඛ්‍ය උප ඇමතිණියට මේ ගැන හොඳ දැනීමක් තිබෙනව. කලක් මේ කටයුතුවල ව්‍යාවෘත්ත වීමෙන් ලත් පළපුරුද්දක් ඇයට තියෙනව. ඒ නිසා, මේ ගැන සෑහෙන උපදෙසක් ගරු ස්වදේශ ඇමතිතුමාට දී ප්‍රයෝජනවත් අන්දමට මෙය ක්‍රියාත්මක කරන්න එතුමියට පුළුවනි.

අ. භා. 6.58

**තුඩාවෙ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ගරු සභාපතිතුමනි,

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
මැහුම් ගැන කථා කළා දන් ඇති නේද?

**තුඩාවෙ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
මටත් කථා කරන්න ඉඩ දෙන බවට සභාපතිතුමා පොරොන්දු වී තිබෙනව.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
7 ට ඉස්සෙල්ලා ඉවර කරන්න පුළුවන්ද?

**තුඩාවෙ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
තව විනාඩි දෙකයි තිබෙන්නෙ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඉතින් මදිවයැ?

**තුඩාවෙ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජංගම මැහුම් කර්මාන්ත 83 ක් විවෘත කිරීමට ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා විසින් ඉදිරිපත් කර තිබෙන මේ යෝජනාව සාකච්ඡා කෙරෙන මේ අවස්ථාවෙදි එතුමා මෙහි සිටිය නම් මෙය ක්‍රියාත්මක කරන අන්දම ගැන වඩා පැහැදිලි විස්තරයක් එතුමා ඉදිරිපත් කරනවට කිසිම සැකයක් නැ. ගරු රාජ්‍ය ඇමතිතුමා ඒ විස්තරය කෙළේ ඉතාමත් කෙටියෙනුයි. ඒ නිසා මේ ගැන පැහැදිලි අවබෝධයක් අපට ලබා ගන්නට බැරි වුණු බව කනගාටුවෙන් කිව යුතුව තියෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

ජංගම මැහුම් කර්මාන්ත මධ්‍යස්ථාන ගැන කථා කිරීමේදී, කලින් මේ අමාත්‍යාංශය මගින්ම පිහිටුවන ලද පේසකම් මධ්‍යස්ථාන සම්බන්ධයෙන් ගත් පියවර ගැනත් වචන ස්වල්පයක් කියන්නට අපට සිදු වෙනව. මේ සම්බන්ධයෙන් විරුද්ධ පාර්ශවයෙ ගරු මන්ත්‍රීවරුන් විසින් කරන්නට යෙදුණු චෝදනා සියල්ලක්ම සියයට සියයක්ම සත්‍ය ඒවා බව මට කියන්න පුළුවනි. මගෙ ඡන්ද කොට්ඨාශයෙහි පේසකර්ම මධ්‍යස්ථාන පිහිටුවූයේ මගෙ යෝජනා අනුව නොවෙයි. මගෙ ඡන්ද කොට්ඨාශයෙ පරාජිත අපේක්ෂකය, අවාසනාවකට මෙන්, ජීවතුන් අතර නොසිටි නිසා ඔහුගෙ වුවමනා අනුව එකී මධ්‍යස්ථාන පිහිටුවන්න බැරි වුණා. එහෙත්, මගෙ කොට්ඨාශයට අල්ලපු කොට්ඨාශයෙ—කඹුරුපිටියෙ—පරාජිත අපෙක්ෂකයයි මාතර කටයුතුවලට ඇඟිලි ගහන්නෙ. එක කකුලක් කඹුරුපිටියෙ, අනික් කකුල මාතර. මේ විධියට තමයි, එක්සත් ජාතික පක්ෂයේ පරාජිත අපේක්ෂකයා ක්‍රියා කරන්නෙ. ඒ නිසා මගේ යෝජනා නොවෙයි භාර ගත්තෙ. මා සමග මාතර ආසනයට තරඟ කර පරාජය වූ අපේක්ෂකයගෙ යෝජනාත් නොවෙයි භාර ගත්තෙ. එතුමා අවාසනාවකට දැන් අප අතර නැහැ. මාතර ආසනයට අල්ලපු ආසනයට තරඟ කර පරාජිත අපේක්ෂකයගෙ යෝජනා තමයි භාර අරන් ක්‍රියාත්මක කර තිබෙන්නෙ. මෙහෙමද මේ විධියෙ වැදගත් කරුණුවලදී ක්‍රියා කරන්නෙ කියා කල්පනා කර බලන්න.

**එකල්හි වේලාව අ. භා. 7 වූයෙන් කටයුතු අත්සිටුවා විවාදය කල් තබන ලදී.**

**එතැන් සිට විවාදය 1967 අප්‍රේල් 7 වන සිකුරාද පවත්වනු ලැබේ.**

அப்போது பி. ப. 7 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடைநிறுத்தப்பட்டு, விவாதம் ஒத்திவைக்கப்பெற்றது.

1967 ஏப்றில் 7 ஆம் தேதி வெள்ளிக்கிழமை விவாதம் மீள ஆரம்பமாகும்.

*It being 7 P.M., Business was interrupted, and the Debate stood adjourned.*

*Debate to be resumed on Friday, 7th April 1967.*

# කල් තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

**යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී:**

"මන්ත්‍රී මණ්ඩලය කල් තැබිය යුතුය".—[ගරු ජේ. ආර්. ජයවර්ධන].

"சபை இப்பொழுது ஒத்திவைக்கப் பெறுமாக"—[கௌரவ ஜே. ஆர். ஜயவர்தன] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப் பெற்றது.

*Motion made, and Question proposed.*

"That the House do now adjourn".—[*The Hon. J. R. Jayewardene*].

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**

(*திரு. எஸ். டீ. பண்டாரநாயக்க*)

(Mr. S. D. Bandaranayake)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවුරුද්දෙ පෙබරවාරි 16 වැනිදා "සිලෝන් ඩේලි නිවුස්" ලංකා ඩේලි නිවුස් පත්‍රයේ මුල් පිටුවේ පළ වූ පුවතක සඳහන් කර තිබෙන්නේ මෙන්න මේ ආකාරයටයි:

**A. C. S. HAMEED, M.P., DELIVERS PROTEST CHINESE EMBASSY REJECTS A MUSLIM NOTE GENOCIDE CHARGE AGAINST THE PEKING RED GUARDS**

It is on a matter of vital interest to the Muslim people of the world, namely the plight of the Muslims of China, we address this letter of protest to you.

We charge the Government of the P.R.C. with persecution of and genocide against the Muslims of China.

Like the rest of the Muslims of the world, we the Muslim people of Ceylon are highly perturbed and agitated over the assault on religious freedom, particularly the profession and practice of the Islamic Faith in China, following the outbreak of Cultural Revolution and the unleashing of the Red Guards.

It is ironical that this persecution and genocide are going apace in the name of a cultural revolution which is claimed to be the harbinger of a new society erected in the image of the Thoughts of Mao Tse-tung."—

**ගරු ජේ. ආර්. ජයවර්ධන**

(*கௌரவ ஜே. ஆர். ஜயவர்தன*)

(The Hon. J. R. Jayewardene)

Has the hon. Member given notice of the question to the Minister?

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**

(*திரு. எஸ். டீ. பண்டாரநாயக்க*)

(Mr. S. D. Bandaranayake)

Yes.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
Today ?

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
To continue:

"Contacted by the "Daily News" yesterday, Mr. Hameed said that he would urge the Government to press for an international . . ."—

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy-Chairman of Committees)
Has the hon. Member given notice ?

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
Yes.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
I do not think he has given notice of this today.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
I have given notice of the question—

—"investigation of Chinese genocide against the Muslims.

A country with strong religious traditions such as ours cannot stand by idling while adherents of a particular faith are being harassed, humiliated and more simply because of the faith they hold," he added.

Mr. M. H. Mohamed, Minister of Labour and president of the Anti-Marxist Muslim Front when contacted by the "Daily News" last night . . ."

He has endorsed what Mr. A. C. S. Hameed had said.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
To whom has the hon. Member given notice ?

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
නීත්‍යනුකූලව මම කල් දුන්නා. නමුත් නාන්සෙගෙ සම්ප්‍රදායට අනුව දැනුම් දුන්නා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
ප්‍රශ්නය නතර කරන්න හිතාගෙන නොවෙයි මම කියන්නෙ. අගමැතිතුමාගේ ලේකම්තුමාට දැනුම් දුන්නෙ පෙරේදා. අද අහනවය කිව්වද ?

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
ඒක වෙනම දෙයක්. නමුත් අද නීත්‍යනුකූලව, සම්ප්‍රදායානුකූලව, ගෝමස් මහත්මයට—සංවිධායක කාර්යාලයේ මහත්මයට—දුන්නා. රාජ්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාට විශාල කැක්කුමක් තිබෙන බව මම දන්නවා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
කැක්කුමක් නොවෙයි, පිළිතුරු දෙන්න ඕනෑ නිසයි අහන්නෙ.

එස්. ඩී. බණ්ඩාරනායක මයා.
(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
Mr. Hameed had said that he would urge for an international investigation of Chinese genocide.

ඇමෙරිකාවෙ ඉඳලා ආවට පස්සෙ චීන තානාපති කාර්යාලයට ගිහිල්ල තියෙන්නෙ "සිලෝන් ඩේලි නිවුස්" පත්‍රයේ පොටෝ ගන්න මහත්මයෙකුත් එක්කයි. එයින් පෙනී යන්නෙ ආණ්ඩුවෙ ඇත්තන්ගෙ සතුට අනුව ගිහිල්ලා තිබෙන බවයි.

මේ ආණ්ඩුව වෙනුවෙන් ගිහින්—

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
මම කියන්නෙ උත්තර දෙන්න වෙලාවක් නැති බවයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එස්. ඩී. බණ්ඩාරනායක මයා.**
*(திரு. எஸ். டீ. பண்டாரநாயக்க)*
(Mr. S. D. Bandaranayake)

මම කියන්නෙ සභාපතිතුමනි, ආණ්ඩුව වෙනුවෙන් ගිහින් උන්නැහේ පැහැදිලි වශයෙන් කරන ලද කථාවක්.

ඊළඟට 1967 මාර්තු 24 වෙනිද, "කම්කරුවා" පත්‍රයෙන් තවත් ප්‍රවෘත්තියක් කියවන්න කැමතියි. "චීන මුස්ලිමුන්ට කිසි කරදරයක් නැතැයි අප තානාපති කියා සිටී" යන සිරස්තලය යටතේ එම ප්‍රවෘත්තිය මෙසේ සඳහන් වෙනව:

"චීනයේ මුස්ලිම් භක්තිකයන් පන්කෝටියක් පමණ............"

ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් මෙයට හොඳට ඇහුම් කන් දෙන්න.

"......සිටිනා අතර එරට ආණ්ඩුවෙන් එහි දැනට කෙරෙන සංස්කෘතික විප්ලවයෙන් ඔවුනට කිසිම අතවරයක් හෝ අසහනයක් සිදු වී නැතැයි චීනයේ ලංකා තානාපති රොබට් ගුණවර්ධන මහතා ඊයේ බොරළුගොඩ සිය නිවසේ පැවැති සාකච්ඡාවකදී අප සමග පැවසීය.

කෙටි නිවාඩුවක් ගත කරනු සඳහා ගුණවර්ධන මහතා මේ දිනවල දිවයිනට පැමිණ සිටී.

පටු දේශපාලන වාසිය තකා යම් යම් පුවත්පත් හා පුද්ගලයන් මහජන චීනයට විරුද්ධව අපහාසාත්මක ප්‍රචාරයන් ගෙන ගියත් ඔය කියන ආකාරයේ කිසි දෙයක් චීනයේ සිදු වී නැති බව මම හොඳාකාරව දන්නෙමියි ඒ මහතා අවධාරණයෙන් කියා සිටියේය.

චීනයේ මුළු ජනගහණය දෙස බලන විට එරට මුස්ලිම් භක්තිකයන් සුළු ජන කොටසක් වුවද අන් කිසි රටක වෙසෙන මුස්ලිම් භක්තිකයනට වඩා චීනයේ මුස්ලිම් භක්තිකයන් වාසනාවන්ත හා ආගමානුකූල ජීවිතයක් ගත කරන බව රොබට් ගුණවර්ධන මහතාගේ මතය වේ.

චීනයේ වැඩි පිරිසි බෞද්ධයන් වන අතර පන් සිල් පද පහෙන් හතරක්ම සමාජය තුළ ක්‍රියාත්මක වන එකම රට චීනය බව පෙනේ යයිද ඒ මහතා සඳහන් කෙළේය.

ලංකාවේ මෙන් චීනයේද ආහාරය සඳහා සතුන් මැරීම කෙරෙන බව පිළිගත් ඒ මහතා ඒ හැරුණු විට අනික් සෑම අතින්ම එරට ඉතා සුචරිතවත් රටක් බවට දියුණු වී තිබෙන බව හෙළි කළහ.

චීනයේ දැනට කෙරීගෙන යන සංස්කෘතික විප්ලවය ඉතා දූරදර්ශී වූද සමාජයට හා සමාජවාදයට අතිශයින් වැඩ දායක වූද පියවරක් ලෙසින් හැඳින් වූ රොබට් ගුණවර්ධන මහතා සංස්කෘතික පිප්ලවය නිසා සිය ගණන් ජීවිත විනාශ වී ඇති බවට කෙරෙන ප්‍රචාරය පච්චපල් බොරුවකියි තරයේ කියා සිටියේය.

චීනයෙන් කෙරෙන කියන දේවල් ගැන මෙලොව හසරක් නොදැන මෙහි සිටගෙන අංජනම් බලා ඉවක් බවක් නැතිව ඒ ශ්‍රේෂ්ඨ ජනතාවට හා ඔවුන්ගේ උදාර නායකයා වන සභාපති මා ඕ සේතුංට නින්දා අපහාස කිරීම විහිළුවක් බව ගුණවර්ධන මහතාගේ මතය වේ.

නිතරම විපතේදී අපේ රටට පිහිට වී ඇති කල්‍යාණ මිත්‍රයෙක් වන මහජන චීනයට නිරපරාදේ නින්දා කිරීම ගුණමකු කමක් නොවේදැයි ගුණවර්ධන මහතා ප්‍රශ්න කරයි."

ඒ ආකාරයටයි සභාපතිතුමනි, චීනයේ ප්‍රශ්නය ගැන මේ ආණ්ඩුවේ චීන තානාපතිවරයා ප්‍රකාශ කරන්නෙ.

ඊ ළඟට 1967 මාර්තු 25 වෙනිදා "රෙඩ් ෆ්ලැග්" පත්‍රයෙ කොටසක්ද මම කියවන්න කැමතියි.

"RIGHTS OF MUSLIMS SAFEGUARDED IN CHINA

Mr. Robert Gunawardene, who is in Ceylon on a brief holiday, was interviewed by a representative of 'Kamkaruwa'. Asked about the alleged ill-treatment of Muslims in China, Mr. Gunawardene said, 'There are about 50 million Muslims in China and I can assure the Muslims in Ceylon that no wrong whatever has been caused to them by the Chinese government or the Cultural Revolution. Although some persons and some newspapers conduct a campaign of vilification against China for narrow political gain none of the alleged atrocities have in fact taken place in China', emphasized Mr. Gunawardene.

He added, 'Although Muslims in China are comparatively a minority, they have all facilities to lead a happy and religious life. The majority religion in China is Buddhism and.... in Chinese society four of the five precepts of Buddhism are practised. Of course, as in Ceylon, animals are reared and killed for food in China.'

Commenting on the Cultural Revolution, Mr. Gunawardene said that 'It was a far-sighted step taken by Chairman Mao Tse-tung.' In the opinion of Mr. Gunawardene, the 'Cultural Revolution was a *sine qua non* for the well being of a Socialist society and for the safeguarding of the purity of Socialism.' He said it was the 'only way to prevent degeneration that can occur in any Socialist society.'

In conclusion, Mr. Gunawardene deplored the attitude of some personalities in Ceylon who he said knew nothing about what really was going on in China but depended on light reading for these

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම

'facts'. Mr. Gunawardene characterised China as a true friend who always wanted to help Ceylon. He paid a tribute to the People's Republic of China for continuing to supply rice to Ceylon, thereby avoiding the danger of starvation at this critical juncture."

මේ ආණ්ඩුව කටයුතු කරන හැටි අපට පෙනෙනවා. ගරු අගමැතිතුමා පවා මේ අවස්ථාවේ මෙතන නැහැ. මේ ප්‍රශ්නය පිළිබඳව මා අද උදේ ගරු අගමැතිතුමාගේ කාර්යාලයට දැනුම් දුන්නා. මීට පැය බාගයකට පමණ කලින් ඒ කාර්යාලයේ සිටින ගෝමස් මහත්මයා පැමිණ මට දැනුම් දුන්න ප්‍රශ්නය ගැන ගරු අගමැතිතුමාට දැනුම් දී තිබෙනවාය ඒ නිසා ප්‍රශ්නය අහන්නය කියලා. එහෙත් ගරු රාජ්‍ය ඇමතිතුමාගේ කථාවෙන්ම පෙනෙනවා මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න මේ ආණ්ඩුව සූදානම් නැති බව. [බාධා කිරීමක්] මහජනයා ළඟදීම තමුන්නාන්සේලා බුදි කරාවි. මේ ප්‍රශ්නවල මුහුණ දෙන්න මේ රජය ලැහැස්ති නැහැ. මෙහෙම කියන්නෙ මේ අයගේම තානාපතිවරුන්. අඩු වශයෙන් ගරු අගමැතිතුමා විසින් ඒ රටට කණගාටුව ප්‍රකාශ කරනවා ඇත කියා මා හිතනවා. මේ රටත් චීනයත් අතර ඇති මිත්‍රත්වය 1956 ජනතා ජයග්‍රහණයත් සමග ඇති වූ මිත්‍රත්වයක්. ඒ මිත්‍රත්වයට හානි පැමිණීමට ඉඩ නොදී එය තවදුරටත් තහවුරු කර ගැනීම පිණිස අඩු වශයෙන් කණගාටුවවත් ප්‍රකාශ කරන ලෙස මේ ආණ්ඩුවෙන් මා ඉල්ලා සිටිනවා.

අ. භා. 7.14

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කරුණු දෙකක් ගැන ප්‍රශ්න කළ යුතුව තිබෙනවා. පළමුව ගරු කම්කරු ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් ඇසීමට තිබෙනවා. මීට පෙර නම් යම් ප්‍රසිද්ධ නිවාඩුවක් ඉරිදාවකට වැටුණොත් ඒ වෙනුවට ඊට පසුවදා නිවාඩුවක් දෙන ප්‍රතිපත්තියක් තිබුණු බව ගරු කම්කරු ඇමතිතුමාට මතක ඇති. එමෙන්ම දැන් යම් ප්‍රසිද්ධ නිවාඩු දිනයක් යම් පෝය දිනයකට යෙදුණොත් ඒ නිවාඩුවත් අර ආකාරයටම ලැබෙන්න ඕනෑය කියා පිළිගෙන තිබෙනවා. මෙවර දීපවාලී දිනය හා මැයි දිනය යෙදී තිබෙන්නේ පෝය දිනවලටයි. ඒ නිසා මීට කලින් අනුගමනය කළ පිළිවෙළටම ඊට පසු දිනයන් නිවාඩු දිනයන් හැටියට ප්‍රකාශයට පත් කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

අනික් ප්‍රශ්නය ඇසිය යුතුව ඇත්තේ ගරු මුදල් ඇමතිතුමාගෙනුයි. එතුමා මේ අවස්ථාවේ මෙහි නැතත් පාර්ලිමේන්තු ලේකම්තුමා සිටින නිසා ඒ ප්‍රශ්නයත් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. සිංහල යතුරු ලේඛකයින් බඳවා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවා තිබෙනවා. ඒ සඳහා පළ කර ඇති ගැසට් නිවේදනයේ සඳහන් කර තිබෙනවා ඉල්ලුම් පත්‍ර එවිය යුත්තේ අඩු වශයෙන් සම්මාන 4ක් වත් සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් වූ අය පමණක්ය කියා. සම්මාන තිබිය යුතු එක විෂයයක් සිංහල භාෂාව විය යුතුයි. එය පිළිගන්න අපි ලැහැස්තියි. ඊට අමතරව ගණිතය ඇතුළුව තවත් විෂයයන් දෙකකින් සම්මාන ඉල්ලා තිබෙනවා. යතුරු ලේඛකයින් සඳහා ඒ සම්මාන ඉල්ලා ඇත්තේ ඇයි කියා මට නම් තේරෙන්නෙ නැහැ. ඊට වඩා පුදුමය මේකයි. යතුරු ලේඛක උපදේශක තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරන්නය කියලත් ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධ කර තිබෙනවා. ඒ සඳහා කිසිම සම්මානයක් අවශ්‍ය වන්නෙ නැහැ. අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයේදී විෂයයන් 6ක සාමාන්‍ය සාමාර්ථයක් තිබීම ඒ සඳහා ඇති. යතුරු ලේඛකයින් බඳවා ගැනීමේ විභාගයට පෙනී සිටීමට සම්මාන 4ක් ඉල්ලනවා. යතුරු ලේඛක උපදේශකයින් වශයෙන් පත්වීම් ඉල්ලන අයට එක සම්මානයක්වත් අවශ්‍ය නැහැ. ඉතින් මෙහි තේරුම මොකක්ද කියන එක මට නම් තේරෙන්නෙ නැහැ. ඉගෙන ගන්න උදවියට වඩා උසස් සාමාර්ථයකුත්, උගන්වන උදවියට සාමාන්‍ය සාමර්ථකුත් ඉල්ලා තිබීමේ අදහස කුමක්දැයි මට නම් වැටහෙන්නෙ නැහැ. මේක වැරදීමක් වන්ට පුළුවන්. මේ තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර භාර ගැනීම 20 වැනිදායින් අවසාන වෙනවා. කරුණාකර වරදක් නම් ඒක හරි ගස්සන්න. උගන්වන උදවියට ප්‍රථම කොන්දේසි දැම්ම නම් මම පිළිගන්ට ලැහැස්තියි. ඒ වගේම හැම කෙනෙකුටම සිංහල භාෂාව විෂයයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

සම්මාන සාමාර්ථයක් තිබෙන්න ඕනෑ කියන කොන්දේසිය අපි පිළිගන්නට ලැහැස්තියි. ඒක අවශ්‍යයි. එම නිසා ජ්‍යෙෂ්ඨයෙන් හෝ ජී. සී. ඊ. විභාගයෙන් සමත් සිංහල භාෂාවට සම්මාන සාමාර්ථ යක් තිබෙන හැම දෙනාටම යතුරු ලේ ඛක තනතුරු සඳහා ඉල්ලුම් කරන්ට ඉඩ තැබීම හොඳ බවයි මගේ වැටහීම. කරුණා කර ඒ ගැන ක්‍රියා කරන මෙන් ඇමති තුමාගෙන් ඉල්ලා සිටිනාව.

අ. භා. 7.17

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

Mr. Chairman, I have already given notice of this question to the Hon. Minister of State. It is a problem that has come down from quite some time ago and various Ministers for External Affairs have had from time to time given their minds to this problem ; but I do not think that a satisfactory solution has yet been arrived at. The problem is the terms and conditions of service of Ceylonese who are employed in foreign embassies and High Commissions in Ceylon.

There could be no objections to any of these embassies paying an employee more than his counterpart would get in the mercantile service in Ceylon or in the Public Service or in the Local Government Service. But there are a number of instances in which they are paid less. There are some instances in which parallel terms and conditions of service do not obtain in the service of High Commissions and embassies.

For instance, the question of gratuities, the question of provident fund, the question of pensions, all these are matters which could be standardized on the basis of negotiations between the Government of Ceylon and these other Governments when it is remembered that an employee who suffers in the course of his employment either dismissal or any form of treatment which he may deem victimization—which may or may not be the case—does not have the remedy that any other employee in Ceylon has. He cannot go to the industrial courts, to a tribunal, or appeal to a court of law because these Governments are not bound by the laws of the land in respect of these matters. They have only to go to the Ministry of External Affairs for redress and hope that the Government of Ceylon would be able to negotiate with the Government concerned or the embassy or High Commission concerned and obtain redress.

I have also come across instances of some of these Aid organizations in Ceylon claiming the same diplomatic immunities, so to speak, in respect of their employees, and one such organization at least—I do not want to mention it lest I be accused of spoiling the relations between the Government and its friends—is manned by the most boorish and filthy people that that country could export to this country. They have treated their employees in the filthiest possible way and they have been told, when they have gone to complain to the necessary authorities, that there is diplomatic immunity and it is not possible for their Government to interfere.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

Who is that ? Which country ?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

I would rather not mention it here.

I know that quite a large number of embassies pay very good salaries to a large number of their employees but there are instances in which these terms and conditions do not compare with conditions of other employees in Ceylon. We have no objection to their paying more, but at least there must be some minimum agreed upon, some conditions in respect of gratuities or provident

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

fund payment or something of that kind, even if they do not want to undertake the payment of pensions. There are persons who have had to leave the service of some of these High Commissions who have gone home without anything at all by way of remuneration in respect of their services.

I should be grateful if the Minister of External Affairs will take this matter up seriously and see whether some kind of arrangement cannot be arrived at in respect of this matter.

අ. භා. 7.20

**එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.** (දොම්පෙ)

*(திரு. எப். ஆர். டயஸ் பண்டாரநாயக்க—தொம்பே)*

(Mr. F. R. Dias Bandaranaike—Dompe)

I wish to raise a matter with the hon. Parliamentary Secretary to the Minister of Local Government, a matter of which I gave him notice on the last occasion when Parliament met, in writing, but I have not had the opportunity to raise it thereafter. The hon. Parliamentary Secretary at least is aware of the problem that I am raising. It refers to the Jaffna Municipal Council.

The hon. Parliamentary Secretary and I—and indeed all hon. Members of this House—are aware that recently there was a Privy Council judgment in respect of an application made by Mr. Alfred Durayappah, who was the Mayor at the time, against the dissolution of the Jaffna Municipal Council on the order of the Minister. The Privy Council judgment has declared that the action of the Hon. Minister was illegal and should not have been taken, notwithstanding the fact that Mr. Alfred Durayappah as an individual was not legally entitled to maintain the application. But the Privy Council went out of its way to indicate that there was a procedure available for such an application to be properly made by all the members of the now defunct Municipal Council getting together and resolving to initiate action, in which case the Privy Council has virtually declared its hand in advance and declared that the Minister's action is illegal. In these circumstances, knowing the hon. Parliamentary Secretary as I do, and knowing his respect for law and order and the respect he has for the judgment of the Privy Council, I wish to ask him, what is the intention of the Hon. Minister as far as this Council is concerned ? A wrong has been done to the Council—may be inadvertently, maybe without knowing what the law was, one does not know. I am not seeking at this stage to find fault with anybody for the order that has been made. I merely wish to inquire what action the Minister proposes to take by way of restitution. After all a premier municipal body in this country has been deprived of its rights by what has been declared by the highest court of our country to be an illegal act.

It seems to me that quite apart from questions of costs or anything else pertaining to litigation, it would be a wrong thing to wait for an application to be made once again by all the members of the defunct council meeting together and seeking to institute proceedings and harassing the public in that manner. The appropriate procedure to my mind would be to take immediate action to reconstitute the Council and to set right the wrong that has been done.

Therefore, I would appeal to the hon. Parliamentary Secretary to be so good as to bring this matter to the notice of his Minister, and if a mistake has been made or a wrong has been done or an error has been committed, to set right that mistake. The least that the Government could do is to set right the error without putting people to the expense and nuisance of litigation in order to vindicate a right that has already been declared

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.]

by the Privy Council. I would therefore earnestly ask the hon. Parliamentary Secretary to take action in this matter as early as possible as a premier institution in this country should not be deprived of its rights. What is perhaps more important, the ratepayers of this area, deprived of their right of representation and the exercise of the functions that they choose to vest in their chosen elected representatives, should have full sway rather than the actions of a minion appointed by the Minister to administer the Council on his behalf.

අ. භා. 7.21

**ගරු එම්. එච්. මොහමඩ් (කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමති)**

*(கௌரவ எம். எச். முகம்மது—தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சர்)*

(The Hon. M. H. Mohamed—Minister of Labour, Employment and Housing)

Regarding the question raised by the hon. Member for Yatiyantota (Dr. N. M. Perera), I have to state that May Day is a holiday declared under the Shop and Office Employees' Act, and I shall see that the same procedure adopted in the past is followed. Regarding Deepavali, it is only a public and bank holiday ; it is not a holiday declared under the Shop and Office Employees' Act. Therefore, these employees are not entitled to that concession.

විමලසේන මයා.

*(திரு. விமலசேன)*

(Mr. Wimalasena)

යටියන්තොට ගරු මන්ත්‍රීතුමාගේ අනික් ප්‍රශ්නය සම්බන්ධයෙන් කියන්ට තිබෙන්නෙ මෙයයි. සාමාන්‍ය ලිපිකරු විභාගයට ඉදිරිපත් වන උදවියට එක්තරා සුදුසුකම් වගයක් තිබිය යුතු යයි ආණ්ඩුව තීරණය කර තිබෙනව. ගරු යටියන්තොට මන්ත්‍රීතුමා සඳහන් කළ අධ්‍යාපන සුදුසුකම් ඒ විභාගයට ඉල්ලුම් කරන අයට තිබෙන්නෙ ඕනැ. සිංහල භාෂාවටත්, ගණිතයටත් සම්මාන ඇතිව ඒ මන්ත්‍රීතුමා සඳහන් කළ අනිකුත් සුදුසුකම් ඒ ලිපිකරු විභාගයට පෙනී සිටින අයටත් තිබෙන්න ඕනැ. යතුරු ලියන සේවයත් ලිපිකරු සේවයට සමාන සේවයක්. එම නිසා සාමාන්‍ය ලිපිකරු සේවයට ඉල්ලුම් කරන උදවියට තිබිය යුතු සුදුසුකම්ම යතුරු ලියන සේවයට ඉල්ලුම් කරන උදවියටත් තිබිය යුතු යයි තීරණය කරගෙන යි, ඔය සුදුසුකම් ඉල්ලා තිබෙන්නෙ. යතුරු ලියන ගුරුවරුන්ට යොදා තිබෙන්නෙ ඊට වඩා අඩු අධ්‍යාපන සුදුසුකම් බව දැන් පෙන්වා දෙන්ට යෙදුණා. මේ ගැන මා විභාග කර බලන්නම්.

**ප්‍රේමදාස මයා.**

*(திரு. பிரேமதாச)*

(Mr. Premadasa)

We are all aware of this particular judgment, and I assure the hon. Member and this honourable House that early action will be taken to see that democratic administration is restored in Jaffna.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 7.25 ට 1967 අප්‍රේල් 7 වන සිකුරාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.

அதன்படி சபை பி.ப. 7.25 மணிக்கு, 1967 ஏப்ரில் 7 ஆம் தேதி வெள்ளிக் கிழமை மு. ப. 10 மணிவரை ஒத்தி வைக்கப்பெற்றது.

*Adjourned accordingly at 7.25* P.M. *until 10* A.M. *on Friday, 7th April 1967.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6 කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

சந்தா: பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி சதம் 30. தபால்மூலம் 45 சதம். முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months. Each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org